# බස්නාහිර පළාතේ පළාත් සභාව
## மேல் மாகாண மாகாண சபை
## WESTERN PROVINCE PROVINCIAL COUNCIL

**2017 ජනවාරි 17** වන අඟහරුවාදා
2017 தை 17 செவ்வாய்க் கிழமை
Tuesday 17th January 2017

**බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 204 හි පිහිටි බස්නාහිර පළාතේ සභා ගොඩනැඟිලි සංකීර්ණයේ නව සභා ශාලාවේදී පැවැති සභා රැස්වීම**

பத்தரமுல்ல .இல ,டென்சில் கொப்பேகடுவ மாவத்தை ,ஸ்ரீ ஜயவர்த்தனபுர , 204இல் மேல் மாகாண சபையின் புதிய கட்டடத் தொகுதியில் அமைந்துள்ள புதிய சபை மண்டபத்தில் நடைபெற்ற கூட்டம்

The meeting held at the Western Provincial Council new building complex at No.204, Denzil Kobbekaduwa Mawatha, Sri Jayawardhanapura, Battaramulla.

**පූ.භා. 09.35 ට පළාත් සභාව රැස් විය.**
மு.ப. 09.35 க்கு சபை கூடியது
*The Provincial Council met at 09.35 a.m.*

**ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනාරූඪ විය.**
*திரு .தவிசாளர் [ சுனில் விஜேரத்ன அவர்கள்] தலைமை வகித்தார்.*
*Mr. Chairman [ Sunil Wijerathne ] in the Chair*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබ සැමට සුභ උදෑසනක් වේවා. ඒ වාගේම ලැබුවා වූ 2017 නව වසර ඔබ සැමට සාමය සතුට පිරි සුභ නව වසරක් වේවා කියලා ප්‍රාර්ථනා කරනවා. ඒ වාගේම මම ඔබතුමන්ලාගෙන් බලාපොරොත්තු වෙනවා, හැමදාම මට ඒ සහාය ලැබුණා. මේ වසරේත් ඊටත් වඩා වැඩි සහායක් අපේක්ෂා කරනවා. විශේෂයෙන් මේ සභාවේ කටයුතු කරගෙන යැමේදී මට ආණ්ඩු පක්ෂයේත්, ගරු ප්‍රධාන ඇමැතිතුමා ඇතුළු අමාත්‍ය මණ්ඩලයේත්, විපක්ෂ නායකතුමා ඇතුළු සියලුම ගරු මන්ත්‍රීවරුන්ගේත් සහාය බලාපොරොත්තු වෙනවා.

විශේෂයෙන්ම සභා රීතිවලට අවනත වෙමින් මේ සභා ගර්භය තුළ අපි කවුරුත් කටයුතු කිරීමට බලාපොරොත්තු වෙනවා. එහෙම වුණොත් අපට හොඳ සභාවක් බවට මේ සභාව පත් කරන්න හැකියාව ලැබෙනවා. ඒ නිසා මම ඔබතුමන්ලා හැමෝගෙම සහාය බලාපොරොත්තු වෙනවා.

# සභාපතිවරයාගේ නිවේදන
## ANNOUNCEMENTS OF CHAIRMAN

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

*"ගරු අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා විසින්, 2017 ජනවාරි මස 09 වන දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද ශ්‍රී ලංකා තිරසාර සංවර්ධන පනත් කෙටුම්පත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 උ (5) (අ) වන ව්‍යවස්ථාව යටතේ මෙම බස්නාහිර පළාතේ පළාත් සභාවේ අදහස් ලබා ගැනීම සඳහා පාර්ලිමේන්තුවේ මහ ලේකම් විසින් අංක Bills/144 දරණ හා 2017 ජනවාරි මස 10 දිනැති ලිපිය මගින් බස්නාහිර පළාත් සභාවේ ලේකම් අමතා එවා තිබෙනවා.*

*2017 ජනවාරි මස 10 දින සිට එක් මාසයක් ඇතුළත පළාත් සභාවේ අදහස් ලබා දෙන ලෙසත්, එසේ එක් මාසයක කාලයක් තුළ මෙම පළාත් සභාවේ වාර්තාව පාර්ලිමේන්තුවට නොලැබුණහොත්, පනත් කෙටුම්පත පිළිබඳව පාර්ලිමේන්තු ස්ථාවර නියෝග 46 අ (2) ආ ප්‍රකාරව ක්‍රියා කිරීමට පියවර ගන්නා බවත් දන්වා තිබෙනවා.*

එයින් අදහස් කරන්නේ අපේ මතය ඉදිරිපත් නොකළහොත් එහෙම අපේ අදහස් ගැන නොතකා පාර්ලිමේන්තුව අදහස් කරනවා. ඒ මතය ක්‍රියාත්මක කරනවා.

*ඒ අනුව පනත් කෙටුම්පතේ පිටපත් ගරු මන්ත්‍රීවරුන්ගේ සභා මේසය මත තබා තිබෙනවා. ඒ සම්බන්ධයෙන් ගත යුතු පියවර පිළිබඳව අද දින පැවැති සභා කටයුතු පිළිබඳ කාරක සභාවේදී යම් යම් එකඟතාවයන්ට පැමිණියා.*

ඒ සාකච්ඡාවේදී සියලු දෙනාම එකඟ වුණා, අපි කලින් ගත්තු තීරණය ප්‍රකාරව ඒ මතය, අදහස පාර්ලිමේන්තුවේ මහ ලේකම් වෙත සභා ලේකම් මගින් කරුණු ඉදිරිපත් කරන්න.

ඔබතුමන්ලාගේ දැන ගැනීම පිණිස මම කෙටියෙන් සඳහන් කරන්නම්. මෙම පනත් කෙටුම්පත මීට පෙර ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 උ (3) අනු ව්‍යවස්ථාව යටතේ පළාත් සභාවේ අදහස් ප්‍රකාශ කිරීම සඳහා

අතිගරු ජනාධිපතිතුමා විසින් එවා තිබූ අතර, 2016.10.18 දින පැවැති පළාත් සභා රැස්වීමේදී යම් යම් සංශෝධනවලට යටත්ව එම පනත් කෙටුම්පත සඳහා එකඟතාවය ලබා දිය යුතු බවට තීරණය කර ඇත. එම සංශෝධනයන් නම්,

i. පනත් කෙටුම්පතෙහි 2 වගන්තියෙහි සඳහන් අරමුණුවලට සීමාවන පරිදි හා තිරසාර සංවර්ධන ඉලක්ක 17 අතරින් ශ්‍රී ලංකාවට ගැළපෙන ඉලක්ක හඳුනා ගෙන එම ඉලක්ක පමණක් ඇතුළත් වන පරිදි පනත් කෙටුම්පතේ පූර්විකාව සකස් කිරීම.

ii. පනත් කෙටුම්පතේ 2 (ඇ) හි [2 වන පිටුවේ 5 වන පේළියේ] "ඒකාබද්ධ වන පරිදි" යන පද වලට අනතුරුව "හා සමබරතාවය රැකෙන පරිදි" යන පද ඇතුළත් කිරීම.

iii. පනත් කෙටුම්පතේ 4 (i) (අ) හි (i) අනු වගන්තිය ඉවත් කිරීම.

iv. පනත් කෙටුම්පතේ 4 (i) (ආ) හි (iii) හි [3 වන පිටුවේ 6 වන පේළිය] "සාමාජිකයන් දෙදෙනෙක්" යන පද වෙනුවට "සාමාජිකයන් එක් අයෙකු" යන පද ඇතුළත් කිරීම.
[ඉහත (iii) හි සඳහන් සංශෝධන පිළිගන්නේ නම්]

v. සෑම පළාත් සභාවකින්ම නියෝජනයක් ඇති වන පරිදි එක් එක් පළාත් සභා විසින් නම් කරනු ලබන සාමාජිකයන් 9 දෙනෙකු ඇතුළත් වන ආකාරයට පනත් කෙටුම්පතේ 4 (1) (ආ) හි (iv) අනුවගන්තිය සංශෝධනය කිරීම.

vi. පනත් කෙටුම්පතෙහි 10 (එ) හි "විගණන" යන පද වෙනුවට "තිරසාර සංවර්ධනයට අදාළ යාන්ත්‍රණ විගණන" යන පද යෙදීමෙන් එම වගන්තිය සංශෝධනය කිරීම.

vii. පනත් කෙටුම්පතේ 10 (ඕ) වගන්තියට අදාළව, එම වගන්තියට පහළින් දක්වා ඇති ඡේදයේ අවසාන වාක්‍යයට පසුව එවැනි "ප්‍රදානයක්, ත්‍යාගයක් හෝ පරිත්‍යාගයක් ලබා ගැනීමේදී කිසිදු බලපෑමකට, කිසිදු කොන්දේසියකට යටත් නොවිය යුතුය" වශයෙන් වන වාක්‍යයක් එකතු කිරීමෙන් එම ඡේදය සංශෝධනය කිරීම.

viii. පනත් කෙටුම්පතේ 11 (7) වගන්තිය පහත පරිදි සංශෝධනය කිරීම.

"තිරසාර සංවර්ධනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියට හා උපාය මාර්ගයට අනුකූලව ක්‍රියා කිරීම රජයේ හා පළාත් සභාවේ සෑම අමාත්‍යාංශයකම, දෙපාර්තමේන්තුවකම වෙනත් ව්‍යවස්ථාපිත ආයතනයකම හා සෑම පළාත් පාලන ආයතනයකම කාර්ය භාරය විය යුත්තේය."

ඒ අනුව, මෙම පනත් කෙටුම්පත සම්බන්ධව දැනටමත් පළාත් සභාවේ සාකච්ඡා කර පළාත් සභාවේ තීරණය අතිගරු ජනාධිපතිතුමා වෙත යවා ඇති බැවින්, සභාවේ එම තීරණය නැවත පාර්ලිමේන්තුව වෙතද දන්වා යැවීම කළ හැකි වනවා. එසේ යැවීමට අපට හැකියාව තිබෙනවා. එසේ කිරීමට නම් කාර්ය පටිපාටි රීති 63 රීතියෙන් බාධාවක් නොවී සභාවේ එකඟතාවය මත ක්‍රියා කළ යුතු වෙනවා. ඒ අනුව 2016.10.18 දින සභාවේදී මෙම පනත් කෙටුම්පත සම්බන්ධව මෙම සභාවේ ගන්නා ලද තීරණය එලෙසින්ම පාර්ලිමේන්තුව වෙත දන්වා යැවීමට සභාවේ එකඟතාවය විමසා සිටිනවා.

ඒ අනුව මම මේ අවස්ථාවේදී සභාවේ එකඟතාවය විමසා සිටිනවා. සභාව එකඟයි.

එම එකඟතාවය අනුව මෙම පනත් කෙටුම්පත සම්බන්ධව 2016.10.18 දින මෙම සභාව ගන්නා ලද තීරණය එලෙසින්ම පාර්ලිමේන්තුව වෙත දන්වා යවන ලෙසට ලේකම්තුමා වෙත මේ අවස්ථාවේදී දැනුම් දෙනවා.

## කාරක සභා වාර්තා
COMMITTEE REPORTS

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පහත සඳහන් කාරක සභා වාර්තා මම මෙම සභාවට පිළිගන්වනවා.

i. 2016.11.01 වන දින හා 2016.12.06 වන දින පැවැති මහජන පෙත්සම් කාරක සභා රැස්වීම් වාර්තා.

ii. 2017.01.04 වන දින පැවැති සභා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම් වාර්තාව.

**ගරු රෝස් ප්‍රනාන්දු [ශ්‍රීනාත් ම. පෙරේරා කාරක සභා ගරු සභාපති වෙනුවෙන්]**
Hon. Rose Fernando [On Behalf of Hon.Chairman of the Committee, Srinath M. Perera]

ගරු සභාපතිතුමනි, 2016.11.08 සහ 22 දිනවල පැවැති ප්‍රඥප්ති හා නීති පිළිබඳ කාරක සභා වාර්තා මම පිළිගන්වනවා.

*අදාළ වාර්තාවල පිටපත් ගරු මන්ත්‍රීවරුන්ගේ මේසය මත තබා ඇති බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.*
*The Hon. Chairman declared that a copy of the relevant reports is placed on the tables of the Hon. Members.*

# පෙත්සම්
PETITIONS

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි, කොස්ගම, බොරළුගොඩ, තේහේන, 259/7 හි පදිංචි නාලනී එදිරිසිංහ යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

**ගරු රංජිත් සෝමවංශ (අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමා)**
Hon. Ranjith Somawansa (Minister of Education, Cultural and Arts Affairs, Sports and Youth Affairs and Information Technology.)

ගරු සභාපතිතුමනි, මහරගම, දහම් මාවත, අංක 1/බී-12 හි පදිංචි ඩී.ජී.ටී.එන්. වීරවර්ධන යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ගරු සභාපතිතුමනි, පහත සඳහන් පෙත්සම් මම ඉදිරිපත් කරනවා.

i. කැලණිය, සිංහාරමුල්ල, අංක 523 හි පදිංචි චන්දන හේවාවිතාරණ යන අයගේ පෙත්සම සහ
ii. කොළඹ 12, බේල්මන් වීදිය, අංක 97/1 ඩී හි පදිංචි එම්.ජී.එම්. හුසේන් යන අයගේ පෙත්සම

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

ගරු සභාපතිතුමනි, බොරලැස්ගමුව, දිවුලපිටිය, අංක 148 හි පදිංචි එම්. වික්‍රමසිරි පෙරේරා යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, අංගොඩ, හිඹුටාන, අංක 311/2 හි පදිංචි කේ.ජේ.ඩී. ගුණවර්ධන යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon . O. W. Prasanna Sanjeeva

ගරු සභාපතිතුමනි, අලුත්ගම, කළුවාමෝදර හි පදිංචි මංගල සිරි ද සිල්වා යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

**ගරු පී. ආර්. පී. අබේගුණවර්ධන**
Hon. P. R. P. Abegunawardana

ගරු සභාපතිතුමනි, පහත සඳහන් පෙත්සම් මම ඉදිරිපත් කරනවා.

i. පානදුර, වලාන උතුර, ජුබිලි පටුමග, අංක 330/ඊ/4 හි පදිංචි එන්.ඩී.ඊ.එම්. පෙරේරා යන අයගේ පෙත්සම
ii. පානදුර, වෑකඩ, කල්දේරම් මඩුවත්ත, අංක 321 හි පදිංචි සුනිල් රත්නායක යන අයගේ පෙත්සම
iii. පානදුර, බෙක්කේගම, දොඩන්ගහවත්ත, අංක 26/1 හි පදිංචි වයි.එම්. ශ්‍රියානි සිල්වා යන අයගේ පෙත්සම සහ
iv. පානදුර, හිරණ, පන්සල පාර, සමගි මාවත, ස්පීන් ෆීල්ඩ්, අංක 226/39 හි පදිංචි ඩබ්ලිව්.ඩී. සරත් පෙරේරා යන අයගේ පෙත්සම.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ගරු සභාපතිතුමනි, පන්නිපිටිය, කලල්ගොඩ, අංක 140/ඩී හි පදිංචි එම්. බර්ට් පෙරේරා යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් කාරක සභාවට යොමු කළ යුතු යැයි නියෝග කරන ලදී.***

*Petitions Presented, ordered to refer to the Petitions committee*

# ප්‍රශ්නවලට වාචික පිළිතුරු
# ORAL ANSWERS TO QUESTIONS

## 01.

**ලලිත් වර්ණකුමාර ගරු මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු, ජල සම්පාදන හා ජලාපවහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය : (ප්‍ර/vi(1)16/112)**

අ. i. මදුරාවල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ 2015 හා 2016 වර්ෂවලදී ක්‍රියාත්මක වූ ඉඩම් සංවර්ධනය කර කැබලි කර විකුණන කුඩා හා මහා පරිමාණ ව්‍යාපෘති පවතින්නේද?

ii. එම ඉඩම් කවරේද?

iii. එම ඉඩම් සංවර්ධනය කර විකිණීම සිදු කරනු ලබන ආයතන වෙන් වෙන්ව මොනවාද?

ආ. i. එම ඉඩම් කැබලි කර විකිණීමේදී එම ඉඩම් අවට ජීවත් වන පාරම්පරික ජනතාවට හා අළුතින් ඉඩම් මිලදී ගන්නා ජනතාවට අසාධාරණයක් නොවන ආකාරයට සංවර්ධනය කිරීම් හා පොදු පහසුකම් සැපයීම කරන්නේද?

ii. එම සංවර්ධන කටයුතු සම්බන්ධව වගකීම ප්‍රාදේශීය සභාව මගින් භාර ගන්නෙහිද?

iii. එසේ නම් ඒ කුමන ආකාරයටද?

ඇ. i. 2016.11.20 දින වන විට එම ඉඩම් සංවර්ධනය කිරීම පිළිබඳව පවත්නා තත්ත්වය කුමක්ද?

**ගරු ඉසුර දේවප්‍රිය** (ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බල ශක්ති, පරිසර කටයුතු, ජල සම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමා)
Hon. Isura Devapriya (Chief Minister and Minister of Finance and Planning, Engineering Services, Law and Order, Local Government and Provincial Administration, Economic Promotion, Electricity and Energy, Environmental Affairs, Water Supplies and Drainage and Tourism Affairs)

අ. i. ඔව්.

ii. ඇමුණුම 01 ලෙස පහතින් පළවේ.

**ඇමුණුම 01**

| අනු අංකය | ඉඩමේ නම හා පිහිටීම | අනු බෙදුමේ සැලැස්ම අනුව කොටස් ගණන | විකිණීම සිදුකරන ආයතනය |
|---|---|---|---|
| | 2015 වර්ෂය | | |
| 01 | දික්හේන හෙවත් පෙලෙන්ගහ හේන 632 B, කඳන දකුණ ග්‍රාම නි.කො. | 09 | ජී.ජේ. ප්‍රොපටි ඩිවලොපර්ස් ඇන්ඩ් කන්ට්‍රක්ෂන් (ප්‍රයිවට් ලිමිටඩ්)324/1හොරණ පාර,කුරුසහන්දිය,අළුබෝමුල්ල. |
| 02 | ඉළිඹ මුකලානවත්ත,632 A, ඉළිඹ, | 13 | සී/ස ලක්දිනු හවුසින් ඇන්ඩ් ඉන්වෙස්ට්මන් පුද්.සමාගම,අංක:231,රත්නපුර පාර,හොරණ. |
| 03 | බටදොඹගහහේන, 650/B,බැල්ලපිටිය බටහිර,බැල්ලපිටිය. | 18 | සිරිමා දිපානි මෛත්‍රීපාල, නො:23, රත්නපුර පාර,හොරණ |
| 04 | මාපතානවත්ත,බැල්ලපිටිය. | 54 | සී/ස ප්‍රයිමලැන්ඩ් පුද්.සමාගම,254/2, දෙවන මහල,පානදුර පාර,හොරණ. |
| | 2016 වර්ෂය | | |
| 01 | ගාලබැදිහේන,811 B,කරන්නාගොඩ ග්‍රාම නිලධාරි වසම | 15 | රිච්වේලැන්ඩ් ප්‍රයිවට් ලිමිටඩ්,101,රත්නපුර පාර,හොරණ. |
| 02 | දෙල්ගහවත්ත,632,කඳන උතුර | 15 | සුසිලා රංජනි වීරකෝන්, කඳන උතුර ,හොරණ |
| .03 | දාපිටිහේන,කෙසෙල්හේනාව. | 135 | හෝම්ලැන්ඩ් හෝල්සියස් පුද්ගලික සමාගම,1060, පන්නිපිටිය පාර, බත්තරමුල්ල |
| 04 | දිවුල්ගහවතුරාන හෙවත්,දිවුල්ගහවත්ත,කඳන | 21 | සී.ඩබ්.සුරියආරච්චි,සුරියවිලා,මාහේන, හොරණ. |
| 05 | ගල්කඩුව හෙවත් පලිගහහේන | 15 | ඉරුෂි උපේකා ජයතිලක,18/27,බුත්ගමුව පාර,වැලිකඩ,රාජගිරිය. |
| 06 | ගන්කන්දඹිවිට,මුරුද්දෙනිය | 33 | රියල්ලැන්ඩ් පුද්.සමාගම,73/සී,අඟුරුවාතොට පාර,හොරණ. |
| 07 | බෝඹුවලයාහේන පාර,වරකාගොඩ බටහිර, | 06 | ඕ.වී.තරංග දේශප්‍රිය,වරකාගොඩ,නෑබඩ. |
| 08 | මාපවානවත්ත,650 /සී/පෙරමුණගම | 14 | දැඩිගම ප්‍රොපටි ඩිවලොපර්ස් ප්‍රයිවට් ලිමිටඩ්,නො:12,දෙහිවල පාර,මහරගම. |

iii. ඉහත ඇමුණුම 01 හි දක්වා ඇත.

ආ. i. නාගරික සංවර්ධන අධිකාරී පනත හා නිවාස හා නගර සංවර්ධන ආඥා පනත අනුව සංවර්ධන කටයුතු සිදු කිරීම හා පොදු පහසුකම් සලසන පරිදි අදාළ සැලසුම් අනුමත කර ඇත.

ii. අනුමත කරන ලද සැලසුම්වලට අනුකූල වන පරිදි සංවර්ධන කටයුතු සිදු වන්නේද යන්න නියාමනය කිරීමේ වගකීම අදාළ ප්‍රාදේශීය සභාව හා නාගරික සංවර්ධන අධිකාරිය විසින් භාරගත යුතුය.

iii. නියමිත විධිවිධාන අනුව අනුමත කරන ලද සැලැස්මකට අනුකූල නොවන සංවර්ධන කටයුතු වෙනුවෙන් අනුකූලතා සහතික නිකුත් නොකිරීම මගින්.

ඇ. i. ඇමුණුම් 02 ලෙස පහතින් පළවේ.

***ඇමුණුම් 02***

**<u>2015 වර්ෂයට අදාල මෙම සංවර්ධනය කරන ඉඩම් වල අදාල වර්තමාන තත්වය පහත පරිදිවේ.</u>**

2015 වර්ෂයට අදාල පහත ඉඩම් 03 සඳහා නේවාසික භාවිතයට සුදුසු බවට අනුකූලතා සහතිකය නිකුත් කර ඇත.

| | | | |
|---|---|---|---|
| අ. | දික්හේන හෙවත් පෙලෙන්ගහහේන | - | ජී.ජේ. ප්‍රොපටි ඩිවලොපර්ස් ඇන්ඩ් කන්ට්‍රක්ෂන් (ප්‍රයිවට් ලිමිටඩ්) |
| ආ. | ඉළිඹ මුකලානවත්ත | - | සී/ස ලක්දිනු හවුසින් ඇන්ඩ් ඉන්වෙස්ට්මන්ට් පුද්ගලික සමාගම |
| ඇ. | බටදොඹගහහේන | - | සිරිමා දීපානි මෛත්‍රීපාල |

ඈ. 2015 වර්ෂයට අදාලව සි/ස ප්‍රයිම්ලෑන්ඩ් පුද්.සමාගම මගින් සංවර්ධන කටයුතු සිදුකරන බැල්ලපිටිය මාපනානවත්ත ඉඩම සඳහා මෙතෙක් අනුකූලතා සහතිකය නිකුත්කර නොමැත. 2016.-07.28 දින ජලය බැසයාම පිළිබඳ ගැටළුව නිරාකරණය කරන ලෙස ලිඛිතව දන්වා ඇත. මෙම ගැටළුව නිරාකරණය කළ බවට ලිපිගොනුවේ කිසිවක් සඳහන් කර නොමැත. 2016.12.09 දිනැතිව ලබාගත් වැඩ අධිකාරීගේ වාර්තාවට අනුව කාණු කොන්ක්‍රීට් කර පාර තාර දමා ඇති බවත්, වෙල අයිනේ පැතිබැම්ම සකස්කර ඇති බවත් සඳහන් කර ඇති අතර, නිවාස ඉදිකිරීම් කර නොමැති බව නිරීක්ෂණය වී ඇත.

**<u>2016 වර්ෂයට අදාල සංවර්ධන ව්‍යාපෘතිවල වර්තමාන තත්ත්වය පහත පරිදිවේ.</u>**

අ. ගාලබැදිහේන - රිච්වෙලෑන්ඩ් ප්‍රයිවට් ලිමිටඩ්

අංක: මදු/ප්‍රාස/ඉ.අ./සං.බල/2016-1 හා 2016.01.27 දිනැති ලිපිය මගින් සංවර්ධන කටයුතු සඳහා අවසර ලබාදී ඇත තවදුරටත් සංවර්ධන කටයුතු සිදුකරමින් පවතින බව වැඩ අධිකාරි වාර්තාව අනුව සනාථ කර ඇති අතර, මෙතෙක් අනුකූලතා සහතිකය නිකුත් කර නොමැත.

ආ. දෙල්ගහවත්ත නැමැති ඉඩමේ සංවර්ධන කටයුතු හිමිකාරිත්වය පිළිබඳ ගැටළුවක් හේතුවෙන් නවතා දමා ඇති අතර, ලිපිගොනුවේ ඉදිරි කටයුතු සිදුනොකරන බවට සභාව විසින් අයදුම්කරුට ලිඛිතව දන්වා යවා ඇත.

ඇ. දාපිටිහේන - හෝම්ලෑන්ඩ් ගෝල්සියන් පුද්.සමාගම

2016.11.30 දින අදාල ගොනුව පරීක්ෂා කිරීමේදී , අංක මදු/ප්‍රාස/ඉ.අ./සං.බල/2016 – 6 හා 2016.07.20 දිනැති ලිපිය මඟින් සංවර්ධන කටයුතු සඳහා අවසර ලබා දී ඇති අතර අංක මදු/ප්‍රාස/ඉ.අ./සං.බල/2016.- හා 2016.08.22 දරණ ලිපිය මඟින් නැවත සපුරා ලියයුතු අඩුපාඩු පිළිබඳව අයදුම්කරුට ලිඛිතව දන්වා යවා ඇත. 85% ප්‍රමාණයක් කොන්දේසි ඉටුකර ඇති බව වැඩ අධිකාරී සඳහන් කර තිබූ අතර සැලසුම අනුමත කර නොමැත.

2016.12.09 දින වැඩ අධිකාරී මහතාගේ වාර්තාව අනුව සංවර්ධන කටයුතු නිමවා ඇති බවත් ඉඩම අනුමත කර ඇති බවත් හිස් ඉඩමක් ලෙස පවතින බවත් සඳහන් කර තිබුණි. මෙම ඉඩම සඳහා 2016.12.15 දින අනුකූලතා සහතිකය නිකුත් කර ඇත. 2016.12.16 දින නිරීක්ෂණය කිරීමේදී මෙම ඉඩමේ එක් බිම් කොටසක තවදුරටත් ඉදිකරමින් පවතින අඩක් නිමවූ නිවසක් සහ තවත් බිම් කොටස් දෙකක තාවකාලික ඉදිකිරීම් පැවති අතර සභාවේ විෂය භාර නිලධාරියාගෙන් විමසීමේදී මෙම ඉඩමට අදාලව මෙතෙක් ගොඩනැගිලි අයදුම්පත්‍ර ලැබී නොමැති බව සඳහන්කර ඇත.

ඇ. දිවුල්ගහවතුරාන හෙවත් - සී.ඩබ්.සූරියආරච්චි දිවුල්ගහවත්ත

විදුලිබලය ලබා දී අනුකූලතා සහතිකය ලබා ගැනීමේ කොන්දේසියට යටත්ව අනුබෙදුම් සැලැස්ම අනුමත කර ඇත.

ඉ. ගල්කඩුව හෙවත් පල්ගහවත්ත - ඉරුෂි උපේඛා ජයතිලක

මෙම ඉඩම සංවර්ධනය කිරීමේ කටයුතු නවතා ඇති බැවින් ලිපි ගොනුවේ කටයුතු තාවකාලිකව අත්හිටුවන ලෙස අයදුම්කරුවන් විසින් සභාව දැනුවත් කර ඇත.

ඊ. බෝබුවලයාහේන-බී.වී.තරංගදේශප්‍රිය

මෙම ඉඩම සංවර්ධනය කිරීමේ කටයුතු නවතා ඇති බැවින් ලිපි ගොනුවේ කටයුතු තාවකාලිකව අත්හිටුවන ලෙස අයදුම්කරුවන් විසින් සභාව දැනුවත් කර ඇත.

උ. ගන්කන්දඹිවිට - රියල් ලැන්ඩ් පුද් . සමාගම

අංක මදු/ප්‍රාස/ඉ.අ./සං.බලපත්‍ර/2016 - ii හා 2016.10.28 දිනැති ලිපිය මඟින් සංවර්ධන කටයුතු සඳහා අවසර ලබා දී ඇත. මෙම සංවර්ධන කටයුතු හේතුවෙන් ජලය බැස යාමට තිබූ කාණුව ගොඩවීමක් සිදුවන බවට කුඩා යාල ගොවි සංවිධානය ප්‍රාදේශීය ලේකම් දැනුවත් කර ඒ බව 2016.11.07 දින සභාව දැනුවත් කර ඇත. කාණු කොන්ක්‍රීට් කර සංවර්ධන කටයුතු සිදු කරමින් පවතින බව සඳහන් කළද ඉහත ගැටළුව නිරාකරණය කිරීමට ගනුලැබූ ක්‍රියාමාර්ග කිසිවක් වර්තමානය වන විට ගොනුවේ සඳහන් කර නොමැත. මෙතෙක් අනුකූලතා සහතික නිකුත් කර නොමැත.

ඌ. මාපටානවත්ත - දැඩිගම ප්‍රොපර්ටි ඩිවලොපර්ස් ප්‍රයිවට් ලිමිටඩ්

අංක මදු/ප්‍රාස/කර්07/සං.බල/ 2016 - ii හා 2016.11.09 දිනැති ලිපිය මඟින් සංවර්ධන කටයුතු සඳහා අවසර ලබා දී ඇති අතර මෙතෙක් සැලසුම අනුමත කර හෝ අනුකූලතා සහතිකය ලබාදීමක් සිදුවී නොමැත.

සංවර්ධන කටයුතු සම්බන්ධව වගකිවයුතු ආයතනය වශයෙන් සභාව විසින් අනුකූලතා සහතික නිකුත් කිරීමේදී තාක්ෂණ නිලධාරි/ වැඩ අධිකාරි වාර්තාව මත පදනම්ව අනුකූලතා සහතික නිකුත් කර ඇති බවත් , එහිදී අදාල නියමයන් හා කොන්දේසි සපුරා ඇති බවට වාර්තා නොවූ අනුබෙදුම් සඳහා අනුකූලතා සහතික නිකුත් කර නොමැති බවත් අදාල ලිපි ගොනු පරීක්ෂාව හා වැඩ අධිකාරී වාර්තාව අනුව නිරීක්ෂණය විය.

## පසුබිම් වාර්තාව

මදුරාවල ප්‍රාදේශීය සභා බලප්‍රදේශයෙහි භෞතික සැළසුම් කටයුතු සම්බන්ධයෙන් නාගරික සංවර්ධන අධිකාරි පනත, නිවාස හා නගර සංවර්ධන ආඥාපනත අදාළ වී පවතී. ඒ අනුව, එම විධිවිධාන සැළකිල්ලට ගෙන බල ප්‍රදේශය තුළ සංවර්ධන කටයුතු සඳහා ඉඩම් අනුබෙදුම් සැළසුම් ප්‍රාදේශය සභාව යටතේ සිදු කරනු ලබයි.

2015 හා 2016 වර්ෂයට අදාළ වන සේ එලෙස සංවර්ධන කාර්යයන් සිදු කිරීම සම්බන්ධයෙන් වන සියළු තොරතුරු ඇමුණුම් 01 වශයෙන් වන ලේඛනයට ඇතුළත් කර මේ සමඟ ඉදිරිපත් කරමි.

තවද, අදාළ සංවර්ධන සැළසුම් අනුමත කිරීමේදී ඉඩම් අවට ජීවත් වන්නන්ට හා ඉඩම් කොටස් මිලදී ගනු ලබන අයට පීඩා නොවන පරිදි ඉඩම් කොටස් සඳහා වන සංවර්ධන සැළසුම් අනුමත කිරීම ඉහත කී විධිවිධාන අනුව, මදුරාවල ප්‍රාදේශීය සභාවෙහි පරිපාලන අධිකාරිය වෙත පැවරී පවතී. එසේම, එලෙස අනුමත කරන ලද සැළස්මකට අනුව සංවර්ධන කාර්යයන් ඉටු නොවන්නේ නම්, අදාළ දේපළ උදෙසා අනුකූලතා සහතික නිකුත් නොකිරීමට ක්‍රියා කිරීමෙන් එම තත්ත්වය පාලනය කර ගතයුතුව ඇත.

එබැවින්, එලෙස කටයුතු සිදුවනවාද යන්න පිළිබඳව නියාමන වගකීම මදුරාවල ප්‍රාදේශීය සභාව වෙත හා නාගරික සංවර්ධන අධිකාරිය වෙත පැවරී ඇත.

කෙසේ වෙතත්, මදුරාවල ප්‍රාදේශීය සභා බලප්‍රදේශයට අදාළව 2015, 2016 වර්ෂ තුළ සංවර්ධිත දේපළ සම්බන්ධ වර්තමාන තත්ත්වය ඇතුළත් වාර්තාවක් ඇමුණුම් 02 වශයෙන් සඳහන් කර මේ සමඟ කාරුණිකව ඉදිරිපත් කරමි.

**02.**

**ලලිත් වර්ණකුමාර ගරු මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු, ජල සම්පාදන හා ජලාපවහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය : (ප්‍ර/vi(1)16/113)**

අ. i. මදුරාවල ප්‍රාදේශීය සභාවේ ජනතා නියෝජිතයන්ගේ ධූර කාලය අවසන් වූයේ කවදාද?

ආ. i. එදින සිට මේ දක්වා ප්‍රාදේශීය සභාව විසින් ප්‍රාදේශීය සභා බල ප්‍රෙද්ශයේ ක්‍රියාත්මක කර ඇති ව්‍යාපෘති මොනවාද?

ii. එම ව්‍යාපෘති හා ස්ථානයන් තෝරා ගෙන ඇත්තේ කාගේ හෝ නිර්දේශ මතද? එසේ නම් ඒ කාගේද?

iii. නොඑසේ නම් ව්‍යාපෘති හා ස්ථානයන් තෝරා ගත් නිර්ණායක කවරේද?

iv. එම එක් එක් ව්‍යාපෘතියෙහි වටිනාකම් වෙන් වෙන්ව සඳහන් කළ හැකිද?

v. එසේ නම් ඒ මොනවාද?

ඇ. i. එම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට ගිවිසුම් ගත වූ සමිති සහ කොන්ත්‍රාත්කරුවන්ගේ තොරතුරු එක් එක් ව්‍යාපෘති සම්බන්ධයෙන් වෙන් වෙන්ව ඉදිරිපත් කළ හැකිද?

ii. එසේ නම් ඒ මොනවාද?

ඈ. i. 2016 ජනවාරි සිට මේ දක්වා අනුමතව ඇති සියලු ව්‍යාපෘතීන් පිළිබඳ ප්‍රගතිය සඳහන් කළ හැකිද?

ii. එසේ නම් ඒ මොනවාද?

**0071**

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

අ. i. 2015.05.17 වන දින.

ආ. i. 2015.05.17 දින සිට 2015.12.31 දින දක්වා ක්‍රියාත්මක වූ ව්‍යාපෘති ඇතුළත් වාර්තාව

**0072**

ඇමුණුම් 01 ද, 2016.01.01 දින සිට 2016.12.23 දින දක්වා ක්‍රියාත්මක වූ ව්‍යාපෘති ඇතුළත් වාර්තාව ඇමුණුම් 02 වශයෙන් ද, සඳහන් කර ඉදිරිපත් කරමි.

**2015 වර්ෂයේ ව්‍යාපෘති**

| අනු අංකය | ව්‍යාපෘතියේ නම | ව්‍යාපෘති ක්‍රියාත්මක කෝරා ගත්තේ කාගේ නිර්දේශය මත ද | තෝරාගත් නිර්ණායක | ව්‍යාපෘතියේ වටිනාකම | සිවිලුම්ගෙවූ සමිති හා කොන්ත්‍රාත්කරුවන් පිළිබඳ විස්තර |
|---|---|---|---|---|---|
| 01 | අම්බිටිගල මාර්ගය අළුත්වැඩියා කිරීම. | ප්‍රාදේශීය සභා යෝජිත් කිරීමේ වැඩසටහන | මහජන ඉල්ලීම් සලකා බැලීමෙන් හා වැඩිම ප්‍රතිලාභයක් ලැබෙන පරිදි | 200,000.00 | සෘජු ක්‍රමය |
| 02 | මිල්ලගේන මාර්ගය අළුත්වැඩියා කිරීම | ප්‍රාදේශීය සභා යෝජිත් කිරීමේ වැඩසටහන | මහජන ඉල්ලීම් සලකා බැලීමෙන් හා වැඩිම ප්‍රතිලාභයක් ලැබෙන පරිදි | 200,000.00 | සෘජු ක්‍රමය |
| 03 | පුලිද්ධගම පෙර පාසැල් අවට වටා වැට ඉදිකිරීම | ප්‍රාදේශීය සභා යෝජිත් කිරීමේ වැඩසටහන | මහජන ඉල්ලීම් සලකා බැලීමෙන් හා වැඩිම ප්‍රතිලාභයක් ලැබෙන පරිදි | 500,000.00 | සෘජු ක්‍රමය |
| 04 | රෙජිනා ආයුර්වේද ගොඩනැගිල්ල වටා ලේඛනත්ට එක යොදා ආශාධිත සිවිලුම් සැකසීම | ප්‍රාදේශීය සභා යෝජිත් කිරීමේ වැඩසටහන | මහජන ඉල්ලීම් සලකා බැලීමෙන් හා වැඩිම ප්‍රතිලාභයක් ලැබෙන පරිදි | 100,000.00 | සෘජු ක්‍රමය |
| 05 | මංගලසිරිපුර මාර්ගය අළුත්වැඩියා කිරීම | ප්‍රාදේශීය සභා යෝජිත් කිරීමේ වැඩසටහන | මහජන ඉල්ලීම් සලකා බැලීමෙන් හා වැඩිම ප්‍රතිලාභයක් ලැබෙන පරිදි | 360,000.00 | සෘජු ක්‍රමය |
| 06 | බැල්ලහිටිය පුස්තකාලය වටා වැට ඉදිකිරීම | ප්‍රාදේශීය සභා යෝජිත් කිරීමේ වැඩසටහන | මහජන ඉල්ලීම් සලකා බැලීමෙන් හා වැඩිම ප්‍රතිලාභයක් ලැබෙන පරිදි | 500,000.00 | සෘජු ක්‍රමය |
| 07 | අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය සඳහා සිමි තරාදියක් මිලදී ගැනීම. | ප්‍රාදේශීය සභා යෝජිත් කිරීමේ වැඩසටහන | මහජන ඉල්ලීම් සලකා බැලීමෙන් හා වැඩිම ප්‍රතිලාභයක් ලැබෙන පරිදි | 4,000.00 | සෘජු ක්‍රමය |
| 08 | ආදාහනාගාරය සඳහා ආශාධිත සිවිලුම් සැකසීම | ප්‍රාදේශීය සභා යෝජිත් කිරීමේ වැඩසටහන | මහජන ඉල්ලීම් සලකා බැලීමෙන් හා වැඩිම ප්‍රතිලාභයක් ලැබෙන පරිදි | 30,000.00 | සෘජු ක්‍රමය |
| 09 | වරකාගොඩ උප කාර්යාලය සඳහා ආශාධිත සිවිලුම් සැකසීම | ප්‍රාදේශීය සභා යෝජිත් කිරීමේ වැඩසටහන | මහජන ඉල්ලීම් සලකා බැලීමෙන් හා වැඩිම ප්‍රතිලාභයක් ලැබෙන පරිදි | 30,000.00 | සෘජු ක්‍රමය |
| 10 | සුමිතිනිගොඩ මාර්ගය අළුත්වැඩියා කිරීම | ප්‍රාදේශීය සභා යෝජිත් කිරීමේ වැඩසටහන | මහජන ඉල්ලීම් සලකා බැලීමෙන් හා වැඩිම ප්‍රතිලාභයක් ලැබෙන පරිදි | 400,000.00 | සෘජු ක්‍රමය |
| 11 | ආදාහනාගාරය ඉදිකිරීම | ප්‍රාදේශීය සභා යෝජිත් කිරීමේ වැඩසටහන | මහජන ඉල්ලීම් සලකා බැලීමෙන් හා වැඩිම ප්‍රතිලාභයක් ලැබෙන පරිදි | 500,000.00 | සෘජු ක්‍රමය |
| 12 | ගල ප්‍රජාශාලාව වැට අළුත්වැඩියා කිරීම | ප්‍රාදේශීය සභා යෝජිත් කිරීමේ වැඩසටහන | මහජන ඉල්ලීම් සලකා බැලීමෙන් හා වැඩිම ප්‍රතිලාභයක් ලැබෙන පරිදි | 60,000.00 | සෘජු ක්‍රමය |

0106

| | | | | | |
|---|---|---|---|---|---|
| 13 | තුම්මිනියොඩ මාර්ගය ඉතිරි කොටස අළුත්වැඩියා කිරීම | ප්‍රාදේශීය සභා යෝජිත කිරීමේ වැඩසටහන | මහජන ඉල්ලීම් සළකා බැලීමෙන් හා වැඩිම ප්‍රතිලාභයක් ලැබෙන පරිදි | 200,000.00 | සෘජු ක්‍රමය |
| 14 | කටුගේන මාර්ගයේ අළුත්වැඩියා කිරීම | ප්‍රාදේශීය සභා යෝජිත කිරීමේ වැඩසටහන | මහජන ඉල්ලීම් සළකා බැලීමෙන් හා වැඩිම ප්‍රතිලාභයක් ලැබෙන පරිදි | 200,000.00 | සෘජු ක්‍රමය |
| 15 | ත්‍රීවිල් ගාල් කිරීම සඳහා ගරාජයක් (ප්‍රා.සභාව)ඉදිකිරීම. | ප්‍රාදේශීය සභා යෝජිත කිරීමේ වැඩසටහන | මහජන ඉල්ලීම් සළකා බැලීමෙන් හා වැඩිම ප්‍රතිලාභයක් ලැබෙන පරිදි | 500,000.00 | සෘජු ක්‍රමය |
| 16 | වරකාගොඩ ආයුර්වේදය සහ රෙමුණ ආයුර්වේදය සඳහා ලෙඩුන් බලන ඇඳන් දෙකක් සැපයීම | ප්‍රාදේශීය සභා යෝජිත කිරීමේ වැඩසටහන | මහජන ඉල්ලීම් සළකා බැලීමෙන් හා වැඩිම ප්‍රතිලාභයක් ලැබෙන පරිදි | 60,000.00 | සෘජු ක්‍රමය |
| 17 | කටුගේන පන්නිලගේන මාර්ගය | ප්‍රාදේශීය සභා යෝජිත කිරීමේ වැඩසටහන | මහජන ඉල්ලීම් සළකා බැලීමෙන් හා වැඩිම ප්‍රතිලාභයක් ලැබෙන පරිදි | 400,000.00 | සෘජු ක්‍රමය |
| 18 | ආදාහනාගාරය ඇතුලත මාර්ගයේ ගල් ඇතිරීම | ප්‍රාදේශීය සභා යෝජිත කිරීමේ වැඩසටහන | මහජන ඉල්ලීම් සළකා බැලීමෙන් හා වැඩිම ප්‍රතිලාභයක් ලැබෙන පරිදි | 450,000.00 | සෘජු ක්‍රමය |
| 19 | චවිනිත ගරාජයේ පොළොව කොන්ක්‍රීට් කිරීම | ප්‍රාදේශීය සභා යෝජිත කිරීමේ වැඩසටහන | මහජන ඉල්ලීම් සළකා බැලීමෙන් හා වැඩිම ප්‍රතිලාභයක් ලැබෙන පරිදි | 150,000.00 | සෘජු ක්‍රමය |
| 20 | බැකෝ යන්ත්‍රයේ අළුත්වැඩියා කටයුතු සිදුකිරීම | ප්‍රාදේශීය සභා යෝජිත කිරීමේ වැඩසටහන | මහජන ඉල්ලීම් සළකා බැලීමෙන් හා වැඩිම ප්‍රතිලාභයක් ලැබෙන පරිදි | 753,932.82 | සෘජු ක්‍රමය |
| 21 | බැකෝ යන්ත්‍රයේ ප්‍රධාන ටයර් දෙකක් යෙදීම | ප්‍රාදේශීය සභා යෝජිත කිරීමේ වැඩසටහන | මහජන ඉල්ලීම් සළකා බැලීමෙන් හා වැඩිම ප්‍රතිලාභයක් ලැබෙන පරිදි | 200,000.00 | සෘජු ක්‍රමය |

0105

| | | | | | |
|---|---|---|---|---|---|
| 01 | දික්ලන්ද මාර්ගය අළුත්වැඩියා කිරීම | පළාත් නියමිත සංවර්ධන ප්‍රදාන | අදාල ව්‍යාපෘතියේ සඳහන් වන ස්ථානය අනුව තෝරාගන්නා ලදී (පළාත් නියමිත) | 600,000.00 | සෘජු ක්‍රමය |
| 02 | කුඩාගොල මාර්ගය අළුත්වැඩියා කිරීම | පළාත් නියමිත සංවර්ධන ප්‍රදාන | අදාල ව්‍යාපෘතියේ සඳහන් වන ස්ථානය අනුව තෝරාගන්නා ලදී (පළාත් නියමිත | 900,000.00 | සෘජු ක්‍රමය |
| 03 | කඳන ඉදිඹ අළුත්වැඩියා කිරීම | පළාත් නියමිත සංවර්ධන ප්‍රදාන | අදාල ව්‍යාපෘතියේ සඳහන් වන ස්ථානය අනුව තෝරාගන්නා ලදී (පළාත් නියමිත) | 500,000.00 | සෘජු ක්‍රමය |
| 04 | අලවත්තගේන මාර්ගය අළුත්වැඩියා කිරීම | පළාත් නියමිත සංවර්ධන ප්‍රදාන | අදාල ව්‍යාපෘතියේ සඳහන් වන ස්ථානය අනුව තෝරාගන්නා ලදී (පළාත් නියමිත | 500,000.00 | සෘජු ක්‍රමය |

| අනු අංකය | ව්‍යාපෘතියේ නම | ව්‍යාපෘති ස්ථානය තෝරා ගත්තේ කාගේ නිර්දේශය මතද | තෝරාගත් නිර්නායක | ව්‍යාපෘතියේ වටිනාකම | ගිවිසුම්ගතවූ සමි කොන්ත්‍රාත්කරු පිළිබඳ විස්තර |
|---|---|---|---|---|---|
| 01 | පරිසර සංරක්ෂණය වෙත ප්‍රජාව යොමුකිරීම සඳහා රුක්රෝපණ වැඩසටහන | පළාත් සංවර්ධන ප්‍රදාන - පරිසර | අදාල ව්‍යාපාතියේ සඳහන් වන ස්ථානය අනුව තෝරාගැනීම සිදු කෙරේ. | 14,985.00 | සෘජු ශ්‍රමය |
| 02 | ප්‍රසන්න පරිසරයක් නිර්මාණය කිරිම සඳහා තෝරාගත් නිවාස වෙත කොම්පෝස්ට් බඳුන් ලබාදිම. | පළාත් සංවර්ධන ප්‍රදාන - පරිසර | අදාල ව්‍යාපාතියේ සඳහන් වන ස්ථානය අනුව තෝරාගැනීම සිදු කෙරේ. (ප්‍රජා සංවර්ධන නිලධාරිගේ හා ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ ඒකකය මඟින් කළමනාකරණය වේ. ) | 248,880.00 | සෘජු ශ්‍රමය |
| 03 | පුස්තකාල ගොඩනැගිල්ලට පිවිසුම් මාර්ගයේ කුට්ටිගල් අතුරා සංවර්ධනය කිරිම. | පළාත් සංවර්ධන ප්‍රදාන | අදාල ව්‍යාපාතියේ සඳහන් වන ස්ථානය අනුව තෝරාගැනීම සිදු කෙරේ | 450,000.00 | සෘජු ශ්‍රමය |
| 04 | මංගලසිරිපුර ඕතරදෙනිය පාර කොන්ක්‍රීට් කිරිම | පළාත් සංවර්ධන ප්‍රදාන | අදාල ව්‍යාපාතියේ සඳහන් වන ස්ථානය අනුව තෝරාගන්නා ලදී | 230,221.00 | සෘජු ශ්‍රමය |
| 05 | බටවල මාර්ගය කොන්ක්‍රිට් යොදා සංවර්ධනය කිරිම. (යොවුන් ගම්මානයට යන පාර) | පසුගාමී හුදකලා ගම්මාන පදනම් කරගත් සංවර්ධන ව්‍යාපෘති (ප්‍රධාන ලේකම්ගේ අංක:CSO/PLN/MA03/01/03 හා 201510.15 ලිපිය අනුව) | අදාල ව්‍යාපාතියේ සඳහන් වන ස්ථානය අනුව තෝරාගන්නා ලදී | 1000,000.00 | සෘජු ශ්‍රමය |

## 2016 වර්ෂයේ ව්‍යාපෘති

## ඇමුණුම 02

| අනු අංකය | ව්‍යාපෘතියේ නම | ව්‍යාපෘති ස්ථානය තෝරා ගත්තේ කාගේ නිර්දේශය මතද | තෝරාගත් නිර්නායක | ව්‍යාපෘතියේ වටිනාකම | ගිවිසුම්ගතවූ සමිති හා කොන්ත්‍රාත්කරුවන් පිළිබඳ විස්තර හා ප්‍රගතිය |
|---|---|---|---|---|---|
| 01 | අරඹකන්ද සඳගිරිඋයන පොදු මාර්ගයේ අබලන්ව ඇති කොටස සංවර්ධනය කිරිම | පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන පළාත් පාලන හා ආර්ථික ප්‍රවර්ධන ලේකම් CM/WP/P2/2/1/K/2016-2016.04.06 | මහජන ඉල්ලීම් මත හා වැඩි ප්‍රතිලාභ ලැබීම මත අදාල ව්‍යාපාතියේ සඳහන් වන ස්ථානය අනුව | 500,000.00 | දිරිය ගොවි සංවිධානය 650 බැල්ලපිටිය වැඩ අවසන් |
| 02 | පිල්ලහේන පොදු පාර තාර දමා සංවර්ධනය කිරිම. | පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන පළාත් පාලන හා ආර්ථික ප්‍රවර්ධන ලේකම් CM/WP/P2/2/1/K/2016-2016.04.06 | මහජන ඉල්ලීම් මත හා වැඩි ප්‍රතිලාභ ලැබීම මත අදාල ව්‍යාපාතියේ සඳහන් වන ස්ථානය අනුව | 550,000.00 | සෘජු ශ්‍රමය වැඩ අවසන් |
| 03 | බැල්ලපිටිය පුස්තකාල අසල ළමා උද්‍යානය ඉදිකිරිම | පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන පළාත් පාලන හා ආර්ථික ප්‍රවර්ධන ලේකම් CM/WP/P2/2/1/K/2016-2016.04.06 | මහජන ඉල්ලීම් මත හා වැඩි ප්‍රතිලාභ ලැබීම මත අදාල ව්‍යාපාතියේ සඳහන් වන ස්ථානය අනුව | 200,000.00 | 650 බැල්ලපිටිය ග්‍රාම සංවර්ධන සමිතිය වැඩ අවසන් |
| 04 | වරකාගොඩ ගමගොඩ මාර්ගයේ කොස්ගොඩහේන පාලම අසල පැති බැම්ම ඉදිකිරිම | පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන පළාත් පාලන හා ආර්ථික ප්‍රවර්ධන ලේකම් CM/WP/P2/2/1/K/2016-2016.04.06 | මහජන ඉල්ලීම් මත හා වැඩි ප්‍රතිලාභ ලැබීම මත අදාල ව්‍යාපාතියේ සඳහන් වන ස්ථානය අනුව | 950,000.00 | සෘජු ශ්‍රමය වැඩ අවසන් |

| | | | | | |
|---|---|---|---|---|---|
| 01 | මාර්ග නඩත්තු ඒකකය සඳහා ද්‍රව්‍ය ලබාගැනිම | ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරිම පළාත් පාලන අමාත්‍යාංශය 2016.05.26 | මහජන ඉල්ලීම් මත හා වැඩි ප්‍රතිලාභ ලැබීම මත | 500,000.00 | සෘජු ශ්‍රමය වැඩ අවසන් |

| | | | | | |
|---|---|---|---|---|---|
| 02 | වල්පිට මාර්ගයේ ගිලා බැස ඇති බෝක්කුව සැකසීම | ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරිම පළාත් පාලන අමාත්‍යාංශය 2016.05.26 | මහජන ඉල්ලීම් මත හා වැඩි ප්‍රතිලාභ ලැබීම මත | 100,000.00 | සෘජු ශ්‍රමය වැඩ අවසන් |
| 03 | ප්‍රාදේශීය සභාවට අයත් මාර්ගයන්හි විදී ලාම්පු නම් කිරිම | ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරිම පළාත් පාලන අමාත්‍යාංශය 2016.05.26 | මහජන ඉල්ලීම් මත හා වැඩි ප්‍රතිලාභ ලැබීම මත | 160,000.00 | සෘජු ශ්‍රමය වැඩ අවසන් |
| 04 | මධ්‍යකන්ද මාර්ගයේ තාර දමා සංවර්ධනය කිරිම | ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරිම පළාත් පාලන අමාත්‍යාංශය 2016.05.26 | මහජන ඉල්ලීම් මත හා වැඩි ප්‍රතිලාභ ලැබීම මත | 254,002.00 | සෘජු ශ්‍රමය වැඩ අවසන් |
| 05 | සත්සර මාර්ගයේ තාර දමා අළුත්වැඩියා කිරිම | ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරිම පළාත් පාලන අමාත්‍යාංශය 2016.05.26 | මහජන ඉල්ලීම් මත හා වැඩි ප්‍රතිලාභ ලැබීම මත | 962,372.00 | සෘජු ශ්‍රමය වැඩ අවසන් |
| 06 | දෙල්ගහකන්ද මාර්ගය තාර දමාඅළුත්වැඩියා කිරිම | ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරිම පළාත් පාලන අමාත්‍යාංශය 2016.05.26 | මහජන ඉල්ලීම් මත හා වැඩි ප්‍රතිලාභ ලැබීම මත | 1376773.61 | සෘජු ශ්‍රමය වැඩ අවසන් |
| 07 | සත්සර උයන පුස්තකාල මාර්ගය තාරදමා අළුත්වැඩියා කිරිම | ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරිම පළාත් පාලන අමාත්‍යාංශය 2016.05.26 | මහජන ඉල්ලීම් මත හා වැඩි ප්‍රතිලාභ ලැබීම මත | 147,774.00 | සෘජු ශ්‍රමය වැඩ අවසන් |
| 08 | කොන්ඩවැල්ගොඩැල්ල මාර්ගය තාර දමා අළුත්වැඩියා කිරිම | ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරිම පළාත් පාලන අමාත්‍යාංශය 2016.05.26 | මහජන ඉල්ලීම් මත හා වැඩි ප්‍රතිලාභ ලැබීම මත | 909,734.00 | සෘජු ශ්‍රමය වැඩ අවසන් |
| 09 | මහායාල සෙනසුන්ගොඩ මාර්ගය තාර දමා අළුත්වැඩියා කිරිම | ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරිම වැඩසටහන | මහජන ඉල්ලීම් මත හා වැඩි ප්‍රතිලාභ ලැබීම මත | 499,341.00 | සෘජු ශ්‍රමය වැඩ අවසන් |

ii. ඉහත ඇමුණුම් 1 සහ ඇමුණුම් 2 හි දක්වා ඇත.

iii. ඉහත ඇමුණුම් 1 සහ ඇමුණුම් 2 හි දක්වා ඇත.

iv. ඔව්.

v. ඉහත ඇමුණුම් 1 සහ ඇමුණුම් 2 හි දක්වා ඇත.

ඈ. i. ඔව්.

ii. ඉහත ඇමුණුම් 1 සහ ඇමුණුම් 2 හි දක්වා ඇත.

ඇ. i. ඔව්.

ii. ඇමුණුම් 2 හි දක්වා ඇත.

## පසුබිම් වාර්තාව

මදුරාවල ප්‍රාදේශීය සභාවෙහි පැවති ධූර කාලය 2015.07.17 දිනෙන් අවසන් විය. ඒ අනුව ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තියට අනුව, මදුරාවල ප්‍රාදේශීය සභාවෙහි ලේකම් විසින් බලතල කාර්යය කර්තව්‍ය ක්‍රියාත්මක කරනු ලබයි.

මදුරාවල ප්‍රාදේශීය සභාව විසින් 2015.07.17 දින සිට 2015.12.31 දින දක්වා ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති හා එම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා යෝජනා වූ ආකාරය ඊට අදාළ නිර්ණායක හා ව්‍යාපෘති වටිනාකම මෙන්ම ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලද කොන්ත්‍රාත්කරුවන් පිළිබඳ තොරතුරු ඇතුළත් ලේඛනය ඇමුණුම් 01 වශයෙන් සඳහන් කර මෙහිම කොටසක් වශයෙන් ඉදිරිපත් කරමි.

එසේම, මදුරාවල ප්‍රාදේශීය සභාව විසින් 2016.01.01 දින සිට 2016.12.23 දින දක්වා ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති හා එම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා යෝජනා වූ ආකාරය ඊට අදාළ නිර්ණායක හා ව්‍යාපෘති වටිනාකම මෙන්ම ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලද කොන්ත්‍රාත්කරුවන් පිළිබඳ තොරතුරු ඇතුළත් ලේඛනය ඇමුණුම් 02 වශයෙන් සඳහන් කර මෙහිම කොටසක් වශයෙන් ඉදිරිපත් කරමි.

**03.**

**ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු, ජල සම්පාදන හා ජලාපවහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය : (ප්‍ර/vi(1)16/117)**

අ. CAD 8773 දරන V 8 ජීප් රථය බස්නාහිර පළාත් සභාව සතු වාහනයක් බව ඔබතුමා දන්නේද?

ආ. එම වාහනය කුමන අමාත්‍යාංශයක් යටතේ සේවයේ යොදවා ඇත්ද?

ඇ. එම වාහනයේ හිටපු රියදුරු මහතුන් දෙදෙනෙකු විසින් ප්‍රධාන ලේකම් වෙත කැසන්ට් රෙන්ට් අ කාර් ආයතනයේ කුළී පදනමට යොදාව ඇති බවට 2016.03.24 වන දින පැමිණිලි කර ඇති බව දන්නවාද?

ඈ. ඉහත වාහනය කුළී පදනම මත ලබා දී එම ආයතනයෙන් 2015.04.21 සිට 2015.04.25 දින දක්වා 867 km වෙනුවෙන් රු. 129,200/- ක් හා 2015.03.24 සිට 2015.04.07 දක්වා 1090 km වෙනුවෙන් රු. 386,500/- ක් ලබාගෙන ඇති බව දන්නවාද?

ඉ. එම මුදල්වලින් කොටසක් ලංකා බැංකු ගිණුම් අංක 7079810 ගිණුමට බැර කර ඇති බව දන්නවාද?

ඊ. ඉහත වාහනය කුළී පදනම මත ලබා දී ගත් මුදල් බැර කර ඇති ගිණුම කාගේද?

උ. මේ සම්බන්ධව ඔබතුමා ක්‍රියා මාර්ගයක් ගෙන තිබේද? එම ක්‍රියා මාර්ගය සභාගත කරන්නේද?

ඌ. 2016.03.24 දින PE 6916 දරන කැබ් රථය සම්බන්ධයෙන් කරන ලද පැමිණිල්ල වෙනුවෙන් ගත් ක්‍රියා මාර්ගය කුමක්ද? එය සභාගත කරන්නේද?

**ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya - Chief Minister

අ. ඔව්.

ආ. බස්නාහිර පළාත් සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය යටතේ.

ඇ. අදාළ රථයේ හිටපු රියදුරු මහතුන් වන කේ.වී. සුජිත් සමන් කුමාර මහතා, එම්.ජේ.ඩී.ඩී.පී. ගුණතිලක මහතා හා ඩබ්. චන්දන මහතා යන අය විසින් 2016.03.24 වන දින ගරු ප්‍රධාන අමාත්‍යතුමා වෙත මේ සම්බන්ධයෙන් පැමිණිල්ලක් ඉදිරිපත් කර ඇත. (ඇමුණුම් අංක 01)[1] එම ලිපියේ ඡායාස්ථ පිටපතක් ප්‍රධාන ලේකම් වෙත ලබා දී ඇත.

ඈ. ඒ බව රියදුරන් විසින් සිදු කළ පැමිණිල්ලේ සඳහන් වේ.

ඉ. එලෙස ගිණුම්ගත කළ බවට අදාළ රියදුරන් විසින් බැංකු ලදුපතක් ලබා දී ඇතත්, එම ලදුපත ඡායාස්ථ පිටපතක් බැවින් පැහැදිලි නොවේ.

ඊ. අදාළ බැංකු ලදුපත පැහැදිලි නොමැති හෙයින්, ගිණුම් හිමියා පිළිබඳව පැහැදිලි නොවේ.

උ. මේ සම්බන්ධයෙන් නිසි පරීක්ෂණයක් සිදු කරන ලෙස ප්‍රධාන ලේකම්ගේ අංක CSO/CSP/04/12 හා 2016.03.30 වන දිනැති ලිපියෙන් පොලිස්පතිතුමා හට දන්වා ඇත. (ඇමුණුම් අංක 02)[2]

ඌ. මේ සම්බන්ධයෙන් බස්නාහිර පළාත් සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයෙන් විමසන ලදුව මෙම වාහනය අනතුරකට ලක්ව ඇති බව වාර්තා වී නොමැති බැවින් පරීක්ෂණයක් සිදු කර නොමැති බව සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ අංක WPH/A8/01/12 හා 2017.01.13 දිනැති ලිපියෙන් දන්වා ඇත. (ඇමුණුම් අංක 03)[3]

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ගරු සභාපතිතුමනි, මම දැනගන්න කැමැතියි. අපේ ගරු ප්‍රධාන ඇමැතිතුමා උත්තර දෙනකොට ප්‍රකාශ කළා, මෙම මුදල් ලංකා බැංකුවේ ගිණුමක ඇති බව දන්නවාද? ඒ ලදුපත් පැහැදිලි නැහැ කියලා. ඒ ලදුපත් පැහැදිලි නැත්නම් ඒ බැංකුවෙන් ලදුපතක් ලබා ගත්තේ නැත්තේ ඇයි කියන එක, එක අතුරු ප්‍රශ්නයක්. ඒ ලදුපත පැහැදිලි නැත්නම් ලබා ගත්තා නම් නිවැරැදියි. ඒක ලබා ගත්තා නම් මේ ප්‍රශ්න ඔක්කෝටම නිවැරැදි උත්තර දෙන්න තිබුණා. ඒ නිසා මම දැනගන්න කැමැතියි ඒ ලදුපත් ලබා ගත්තේ නැත්තේ ඇයි කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා ඒ ගැන මොකක් හරි -

**ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya - Chief Minister

ඒ ගැන අදාළ නිලධාරීන්ගෙන් අහලා තමයි මට කියන්න වෙන්නේ. මොකද, අභ්‍යන්තර විගණන එකෙන් කරන්න ඕනෑ. මට ඒ වාර්තාව ලැබිලා නැහැ.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

මන්ත්‍රීතුමා සෑහීමකට පත් වෙනවාද?

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

සෑහීමකට පත් වෙන්නේ නැහැ.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

සෑහීමකට පත් වෙන්නේ නැත්නම් තව අතුරු ප්‍රශ්නයක් අහන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමාට අවශ්‍ය නැහැ.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

අපට අතුරු ප්‍රශ්නයක් අහන්න බැරිද ගරු සභාපතිතුමනි?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට අහන්න බැහැ.

[1] හැන්සාඩ් අංශයේ තබා ඇත.
[2] හැන්සාඩ් අංශයේ තබා ඇත.
[3] හැන්සාඩ් අංශයේ තබා ඇත.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ගරු සභාපතිතුමනි, මම එක අතුරු ප්‍රශ්නයයි නේ ඇහුවේ. එතුමාට අවශ්‍ය නම් තව දෙකක් පුළුවන්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට දෙන්න පුළුවන්. එතුමා අවසර දුන්නා.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

කවුරුවත් අපහසුතාවයට පත් කරන්න නොවෙයි මම මේක අහන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අවශ්‍ය නැහැ. සුනිල් වටගල ගරු මන්ත්‍රීතුමාගේ නමින් යුත් ප්‍රශ්නය ගරු ප්‍රධාන ඇමැතිතුමාට යොමු කිරීමට අවස්ථාව.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

## 04.

**සුනිල් වටගල ගරු මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු, ජල සම්පාදන හා ජලාපවහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය : (ප්‍ර/vi(1)16/119)**

අ. හෝමාගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ රිලාවල පොල්ගස්ඕවිට “ශ්‍රී සරණංකර මාවත” යනුවෙන් මාවතක් වූ බව ඔබතුමා පිළිගන්නේද?

ආ. එම පාරට උක්ත නම යොදා ඇත්තේ ගමෙහි පිහිටි “සුසීමාරාමය” නැමැති විහාරස්ථානයෙහි ආදි කතෘවරයාණෝ වූ අතිපූජ්‍ය සරණංකර ස්වාමීන්ද්‍රයන් වහන්සේ වෙත පිදෙන ගෞරවයක් ලෙස බව ඔබතුමා දන්නවාද?

ඇ. ඒ අනුව වසර 60 කට අධික කාලයක් “ශ්‍රී සරණංකර මාවත” යනුවෙන් එම මාවතට එකී නාමය භාවිතා කළ බව ඔබතුමා පිළිගන්නේද?

ඈ. කරුණු මෙසේ තිබියදී පසුගිය නොවැම්බර් මාසයේ කිසියම් දිනක රාත්‍රියේදී “ශ්‍රී සරණංකර මාවත” නමින් ඇති නාම පුවරුව බලහත්කාරයෙන් කිසියම් පිරිසක් විසින් ඉවත් කොට ඒ වෙනුවට “තිලකරත්න රාජපක්ෂ” මහතාගේ නම යොදා නාම පුවරුවක් සවි කර ඇති බව ඔබතුමා පිළිගන්නේද?

ඉ. එකී ක්‍රියාව සම්පූර්ණයෙන් නීති විරෝධී ක්‍රියාවලියක් බව ඔබතුමා පිළිගන්නේද?

ඊ. නීති විරෝධී බව පිළිගන්නේ නම් නැවතත් “ශ්‍රී සරණංකර මාවත” සහිත නාම පුවරුව සවි කිරීමට අදාළ ආයතනවලට උපදෙස් දෙනු ලබන්නේද?

උ. මෙම අනීතික ක්‍රියාව සිදු කළ අයවලුන්ට එරෙහිව නීතිමය පියවර ගැනීමට ශ්‍රී ලංකා පොලීසියේ පොලිස්පතිවරයාටත්, බස්නාහිර පළාතේ පළාත් පාලන කොමසාරිස්වරයාටත් ඔබතුමා දැනුම් දෙන්නේද?

**ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya - Chief Minister

අ. 1975 අංක 04 දරන වීථි නම් කිරීම හා ස්මාරක ඉදි කිරීම පාලනය කිරීමේ පනතේ විධිවිධාන අනුකූලව හා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 198 වගන්තියෙහි විධිවිධානයන්ට අනුකූලව ශ්‍රී සරණංකර මාවත නමින් මාවතක් නම් වී තිබූ බවක් නොදනිමි.

ආ. නීත්‍යානුකූලව එවැනි නාමයක් යොදා තිබුණු බවක් නොදනිමි.

ඇ. පසුව වාර්තා වූ කරුණු අනුව යම් පිරිස් “ශ්‍රී සරණංකර මාවත” වශයෙන් අදාළ මාවත හඳුන්වන්නට යෙදී ඇති බව පිළිගනිමි.

ඈ. නොදනිමි.

ඉ. 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය

යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 198 වගන්තිය යටතේ බස්නාහිර පළාත් පාලන විෂයය භාර අමාත්‍යවරයා වශයෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, අදාළ මාර්ගය "තිලකරත්න රාජපක්ෂ මාවත" නමින් නම් කිරීමට තීරණය කර ඇති බැවින්, එනමින් එම මාර්ගය හෝමාගම ප්‍රාදේශීය සභාව විසින් නම් කිරීම නීත්‍යානුකූල වෙයි.

ඊ. නීත්‍යානුකූලව "තිලකරත්න රාජපක්ෂ මාවත" නමින් අදාළ මාර්ගය නම් කිරීම සඳහා හෝමාගම ප්‍රාදේශීය සභාවෙහි ලේකම් වෙත උපදෙස් දී ඇත.

උ. පැන නොනගී.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ගරු සභාපතිතුමනි, පළමුවැනි අතුරු ප්‍රශ්නය. 1975 අංක 4 දරන, 1987 ප්‍රාදේශීය සභා පනතේ බලතල මත තමයි ගරු මහ ඇමැතිතුමාගේ පිළිතුර අනුව පැහැදිලි වෙන්නේ එම පාර තිලකරත්න රාජපක්ෂ මාවත නමින් නම් කළයි කියලා. මම අහන්න කැමැතියි මේ නම් කිරීම සම්බන්ධයෙන් ප්‍රදේශවාසීන්ගේ විරෝධතාවයක් තිබුණාද කියලා.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

මෙතැන අහන්න ප්‍රශ්නයක් නැහැ. ගරු සභාපතිතුමනි, මේ මුළු සභාවම මේ නම අනුමත කළා. කාටවත් නැහැයි කියන්න බැහැ. විරෝධයක් ආවාම මේ සභාවේ මන්ත්‍රීවරු එක එක ඒවා කළාට මේ සභාව මේ නම අනුමත කළා.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ඒ යෝජනාව ගෙනාවේ කවදාද කියලා මම දැනගන්න කැමැතියි.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

මේ සභාව ඒක අනුමත කළා.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

කවදාද?

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ගරු සභාපතිතුමනි, දැන් මේකට කථා කළාම කවුරුත් කථා කරනවා. නමුත් තිලකරත්න රාජපක්ෂ කියන නම දාන්න ඕනෑ කියලා ඒකමතිකම මේ සභාව එදා -

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

කවදාද? මොන න්‍යාය පත්‍රයෙන්ද?

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

අපි දැන් මේකට උත්තර දෙන්න අවශ්‍යතාවයකුත් නැහැ. දැන් උසාවි ගිහිල්ලා තියෙන්නේ. උසාවියෙන් බේර ගත්තාම ඉවරයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අධිකරණයට භාජනය වී තිබීම ප්‍රශ්නයක් නේ? ඒ නිසා දැන් අපි තවදුරටත් මේ ගැන කථා කරන එක තේරුමක් නැහැ. දැන් අධිකරණයට යොමු වෙලා තිබෙනවා.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ගරු සභාපතිතුමනි, අවසන් ප්‍රශ්නය. වර්ෂ 1969.11.14 වැනිදා අංක -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දැන් අතුරු ප්‍රශ්න අහන එකේ තේරුමක් නැහැ. මෙතුමා කියනවා අධිකරණයට සම්බන්ධ වුණු කාරණාවක් කියලා.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

කරුණාකරලා නඩු අංකය කියන්න කියලා කියන්න. බොරු තොරතුරු කියන්න එපා. අසත්‍ය තොරතුරු.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

විෂයය භාර ඇමැතිවරයා හැටියට එතුමා කියන්නේ. ඉතින් මට ඒක පිළිගන්න වෙනවා.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ගරු සභාපතිතුමනි, අවසන් ප්‍රශ්නය මට අහන්න අවශ්‍යයි. වර්ෂ 1969.11.14 වැනිදා අංක 14880 දරන ගැසට් පත්‍රයේ සරණංකර මාවත යන නම සටහන් වෙලා තිබෙනවා. මේකට පිටින් ගැසට් පත්‍රයක් තිබෙනවාද? තිබේ නම් එය සභාගත කරන්න. මෙය සත්‍යයි කියලා පිළිගන්නවා නම් ගරු ප්‍රධාන ඇමැතිතුමා තිලකරත්න රාජපක්ෂ නමින් නම් කරන ලද මාවත නැවත සරණංකර මාවතක් බවට පත් කරනවාද කියලා දැනගන්න කැමැතියි. ඒ ගැසට් පත්‍රය මම සභාගත කරනවා.[4]

**ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya - Chief Minister

මේක මම වෙනස් කරනවා නම් වෙනස් කරන්නේ උසාවි නියෝගයකින් විතරයි. කවුරුවත් කිව්වාට කරන්න බැහැ. මේක නම් කරන්න පැහැදිලිවම සියලු දෙනාම එකඟ වුණා. ඒක වෙනස් කරනවා නම් වෙනස් කරන්න වෙන්නේ නීතියෙන් විතරයි. මට වෙනස් කරන්න බැහැ. මම වෙනස් කරන්නේ නැහැ.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ගරු සභාපතිතුමනි, සියලු දෙනාම එකඟ වුණා කියනවා. මේක වරප්‍රසාද සම්බන්ධ ප්‍රශ්නයක්. මම දන්න තරමින් මගේ හෘදය සාක්ෂියට එකඟව මම එහෙම එකකට අනුමැතිය දීලා නැහැ. මම දන්නේ නැහැ අනෙක් මන්ත්‍රීවරු මේකට එකඟතාවය දුන්නාද කියලා. එහෙම සරණංකර මාවත වෙනස් කිරීමට අදාළව.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ප්‍රධාන ඇමැතිතුමා ඔබතුමාට පුළුවන් නම් පසු අවස්ථාවක හරි අපේ සභාවේ තීන්දුව සම්බන්ධ කාල වකවානුව සභාවට ඉදිරිපත් කරන්න.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ගරු සභාපතිතුමනි, ජනතා විමුක්ති පෙරමුණේ කණ්ඩායම ඒකට එකඟ වෙලා නැහැ. එහෙම එකඟ වෙන්න -

[4] හැන්සාඩ් අංශයේ තබා ඇත.



**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

ගරු සභාපතිතුමනි, තිලකරත්න රාජපක්ෂ මැතිතුමාට අදාළව ශෝක ප්‍රකාශ යෝජනාව ඉදිරිපත් වුණු වෙලාවේදී මුළු සභාවම ඒකමතිකම යෝජනා කළා.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ශෝක ප්‍රකාශ යෝජනාව වෙනයි. ශෝක ප්‍රකාශය කොහොමද මේකට බලපාන්නේ. ඔබතුමා නීතිඥයෙක්.

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

සභාවේ යෝජනාවක් ආවේ ඒ අවස්ථාවේ.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ඔබතුමා නීතිඥයෙක්. ඒකට කොහොමද -

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ශෝක ප්‍රකාශ යෝජනාවකදී මාවතක් නම් කරන්න පුළුවන්ද?

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

මාවත නම් කරලා තිබෙන්නේ, ප්‍රධාන ඇමැතිතුමාට පැවරී තිබෙන බලතල අනුව.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේක දිගින් දිගටම යන්න දෙන්න බැහැ.

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

ප්‍රධාන ඇමැතිතුමාට තිබෙන බලතල අනුව ඒක නම් කරලා තිබෙන්නේ.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ගරු සභාපතිතුමනි, දැන් මේ කියන්නේ අපි අනුමත කළා කියලා නේ? අපි අනුමත කරලා නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දැන් මේක උසාවියට දාපු කාරණාවක්.

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

ඒකේ ගැටළුවක් තිබෙනවා නම්, අපි ආයිත් සභාවට යෝජනාවක් ගේමු.

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

හාමුදුරුවරුන්ගේ නම පවා ගලවලා දාලා.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

මේක සභාගත කරනවා ගරු සභාපතිතුමනි.

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

මේ රටේ හිටපු ප්‍රධාන හාමුදුරු කෙනෙකුගේ නමක් තිබුණේ.

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

අපේ පළාත් සභාවට සේවයක් කරපු මහජන නියෝජිතයෙකුගේ නමක් දාලා තියෙන්නේ.

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

නියෝජිතයා වටිනවා හාමුදුරුවන්ට වැඩිය.

[සභාවේ ඝෝෂා]

ගරු මහ ඇමැතිතුමා, ඔබතුමා තිලකරත්න රාජපක්ෂ නමින් වෙනත් පාරක් නම් කරන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සුනිල් වටගල ගරු මන්ත්‍රීතුමාගේ ඊළඟ ප්‍රශ්නය ඉදිරිපත් කිරීමට අවස්ථාව.

[සභාවේ ඝෝෂා]



**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

**05.**

**සුනිල් වටගල ගරු මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු, ජල සම්පාදන හා ජලාපවහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය : (ප්‍ර/vi(1)16/120)**

අ. වර්ෂ 2016.12.06 වන දින පළාත් සභා රැස්වීම් න්‍යාය පත්‍රයෙහි ප්‍රශ්න අංක 05 ලෙස ඇතුළත් වූ සරත් පතිරණ ගරු මන්ත්‍රීතුමා විසින් විමසන ලද ප්‍රශ්නයට ඔබතුමා පිළිතුරු ලබා දීමේදී එම ප්‍රශ්නයෙහි "ඇ" කොටසට ලබා දුන් "අනුමැතිය දී නැත" යනුවෙන් වූ පිළිතුරට අනුව අදාළ ගොඩනැගිල්ලෙහි නීති විරෝධී ඉදි කිරීම් කර ඇති කොටස් ඉවත් කිරීම සඳහා අදාළ ආයතන වෙත උපදෙස් ලබා දී තිබේද?

ආ. එසේ උපදෙස් පිළිපැදීමට අදාළ ගොඩනැගිල්ලේ හිමිකරු අපොහොසත්ව ඇත්නම් හෝ පැහැර හරින්නේ නම් නොපමාව රිට් ආඥාවක් මගින් අදාළ ගොඩනැගිලි ඉවත් කිරීමට ක්‍රියා මාර්ගය ගැනීමට අදාළ බලධාරීන් වෙත ඔබතුමා උපෙදස් ලබා දී තිබේද?

ඇ. නොඑසේ නම් ඒ මන්ද?

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

අ. අදාළ අනවසර ඉදි කිරීම සම්බන්ධයෙන් නාගරික සංවර්ධන අධිකාරි පනතේ විධිවිධාන අනුව කටයුතු කරන ලෙසට බස්නාහිර පළාතේ පළාත් පාලන කොමසාරිස් විසින් නාගරික කොමසාරිස් වෙත උපදෙස් ලබා දී ඇත.

ආ. අදාළ ඉදි කිරීම් සම්බන්ධයෙන් නාගරික සංවර්ධන අධිකාරී පනතේ විධිවිධාන අනුව පියවර අනුගමනය කිරීම සඳහා උපදෙස් ලබා දෙමි.

ඇ. පැන නොනගී.

0105

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ගරු සභාපතිතුමනි -

**ගරු සලෝචන ගමගේ**
Hon. Salochana Gamage

කොස්තා මැරෙන්න එපා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර සභාව නිශ්ශබ්ද වෙන්න. අනවශ්‍ය දේවල්වලට යන්න එපා.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

මේකට උත්තර දෙන්න තිබුණා, විපක්ෂ නායකතුමා හිටියා නම්.

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

ගරු සභාපතිතුමනි, සලෝචන ගමගේ ගරු මන්ත්‍රීතුමා මැරෙන්න එපා කියලා මට තර්ජනයක් කළා. ඒක ඉල්ලා අස්කර ගන්න කියන්න. ප්‍රසිද්ධියේ කිව්වා.

**ගරු සලෝචන ගමගේ**
Hon. Salochana Gamage

මම හොඳ ප්‍රාර්ථනාවක් කළේ මැරෙන්න එපා කියලා.

[සභාවේ ඝෝෂා]

සිවුරු ගලවලා හාමුදුරුවන්ට ගහන්න හොඳයි.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ගරු සභාපතිතුමනි, මේකට කථා කරන්න ඕනෑ හෝමාගම මන්ත්‍රීවරු. මේ කොහේවත් ඉන්න මන්ත්‍රීවරු මේකට කථා කරන්නේ. මේ කැස්බෑවේ.

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

හෝමාගම නොවෙයි. මගේ ආසනේ.

0106

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ඔබතුමා එදා කිව්වා මේක කරන්න ඕනෑ. මම මරුණාම මගේ නමත් දාලා තියන්න කියලා.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ගරු සභාපතිතුමනි, මගේ අතුරු ප්‍රශ්නය. මේ කීර්ති දිසානායක යන තැනැත්තා දැන් ඔබතුමාගේ සංචාරක අමාත්‍යාංශයේ සභාපති තනතුරේ වැඩ කරනවාද?

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

දැන් නැහැ.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ගරු සභාපතිතුමනි, මෙම මහල් නිවාසය මහල් 5 කින් යුක්ත මන්දිරයක්. මේ මන්දිරයට අවසර අරගෙන තිබෙන්නේ මහල් දෙකකට විතරයි. එතකොට ඉතිරි මහල් සම්බන්ධයෙන් ගන්න ක්‍රියා මාර්ගය තමයි මම මේ අහලා තිබෙන්නේ. නමුත් දෙවැනි ප්‍රශ්නයට ගරු ප්‍රධාන ඇමැතිතුමාගේ උත්තරය මේ සභාවේ ඝෝෂාව නිසා මට ඇහුනේ නැහැ. දෙවැනි උත්තරය මොකක්ද කියලා මට කියන්න පුළුවන්ද?

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ආ. අදාළ ඉදි කිරීම් සම්බන්ධයෙන් නාගරික සංවර්ධන අධිකාරී පනතේ විධිවිධාන අනුව පියවර අනුගමනය කිරීම සඳහා උපදෙස් ලබා දෙමි.

ඇ. පැන නොනගී.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

එතකොට ගරු සභාපතිතුමනි, නාගරික සංවර්ධන අධිකාරී පනතේ අදාළ විධිවිධාන සහ මහ නගර සභා ආඥා පනතේ අදාළ විධිවිධාන අනුගමනය කරලා නැති බව තමයි අපට පේන්නේ. ඒ අනුව ඉදිරි නීතිමය පියවර ගන්නවාද කියලා තමයි මම අහන්නේ.

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

නීතිමය පියවර ගන්න අවශ්‍ය වුණොත්, ගන්නවා.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

අවශ්‍ය වුණොත් ගන්නවා?

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ඔව්.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

හරි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ප්‍රසන්න සංජීව ගරු මන්ත්‍රීතුමාගේ නමින් යුත් 06 වන ප්‍රශ්නය ගරු ප්‍රධාන ඇමැතිතුමාට යොමු කිරීමට අවස්ථාව.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon . O. W. Prasanna Sanjeeva

ගරු සභාපතිතුමනි, ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ගරු සභාපතිතුමනි, 06, 07 සහ 08 ප්‍රශ්න සඳහා පිළිතුරු දීමට සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාගේ ප්‍රශ්න තුනටම ගරු ප්‍රධාන ඇමැතිතුමා සති දෙකක් කල් ඉල්ලා සිටිනවා.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon . O. W. Prasanna Sanjeeva

හොඳයි. නිවැරැදි පිළිතුරු බලාපොරොත්තු වෙනවා.

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

එහෙම ඔබතුමාට ඕනෑ විධියට දෙන්නේ නැහැ. මට ඕනෑ විධියට දෙන්නේ.

# නොපැමිණ සිටීමේ අවසරය
## LEAVE OF ABSENCE

**ගරු ගුණසිරි ජයනාත් -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Gunasiri Jayanath - Chief Government Whip

ගරු සභාපතිතුමනි, *"මොහොමඩ් ෆායිස් ගරු මන්ත්‍රීතුමාට මාස දෙකක කාලයක් සඳහා නිවාඩු අනුමත කළ යුතු යැයි "* යෝජනා කරනවා..

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ගරු සභාපතිතුමනි, මගේ වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. සභා ලේකම් කාර්යාලය කියන්නේ, මටත් කාර්යාලයක් තිබෙන මන්ත්‍රීවරයෙක්. ආණ්ඩුකාරතුමා විසින් 2017.01.04 වැනිදා ලිපියක් එවලා තිබෙනවා. ලේකම්තුමා විසින් එවලා තිබෙන්නේ. කාර්යාලයේ සේවකයෝ දෙපැත්තකට බෙදීමක් කරලා වාගේ දෙයක් තමයි මේකෙන් කරලා තියෙන්නේ. ඒ නිසා ඔවුන්ට අසාධාරණයක් වෙලා තිබෙනවා. කළමනාකරණ සහකාර, රියදුරු සේවකයින්, කාර්යාල කාර්ය සේවකයින් සම්බන්ධව දිරි දීමනා ගෙවීමේදී අකටයුත්තක් වෙලා තිබෙන බව තමයි සඳහන් වෙලා තිබෙන්නේ. එම නිසා කණ්ඩායම් දෙක දෙපැත්තකට බෙදීමක් වෙලා තිබෙනවා. මම මේක සභාගත කරනවා. ගරු සභාපතිතුමා මාර්ගයෙන් ඉල්ලීමක් කරනවා, මේ කාලයක් ඉඳලා ආපු දෙයක්. නිලධාරීන් මේ වාගේ බෙදන්නේ නැතුව සාධාරණව, මම කාටවත් වෙන් කිරීමක් නොවෙයි. සියලුම නිලධාරීන් එක මට්ටමකට ගන්න කියලා ඉල්ලීමක් කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපි හෙට 01.00 ට ඒ කමිටුව රැස් වෙනවා. ඔබතුමාත් ඉන්නවා නේ?

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

මම මේක සභාගත කරනවා.[5]

[5] කථාව අවසානයේ පළ කර ඇත.

**බස්නාහිර පළාත් සභාව**

**0105**

"විශිෂ්ඨ රාජ්‍ය සේවාවක් සඳහා ඇප කැපවෙමු."

ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
பிரதம செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE

"ශ්‍රාවස්ති මන්දිරය", 32, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත, කොළඹ 07.
"சிராவஸ்தி" கட்டடம் ,32, ஸ்ரீமத் மாக்கஸ் பர்னாந்து மாவத்தை, கொழும்பு 07.
"Sravasthi Mandiraya", 32, Sir Marcus Fernando Mawatha, Colombo 07.

ප්‍රධාන ලේකම් / பிரதம செயலாளர் / Chief Secretary — දුරකථන / தொலைபேசி / Telephone - 2698409; ෆැක්ස් / பெக்ஸ் / Fax - 2694667; ඊ-මේල් / ஈ-மெயில் / Email chiefsecretary@wpc.gov.lk
පොදු දුරකථන / தொலைபேசி / General Telephone — 2682868, 2682869, 2682870

මගේ අංකය / எனது இல. / My No. CSO/PTR/1/9 — ඔබේ අංකය / உமது இல. / Your No. — දිනය / திகதி / Date. 2017.01.04

සභා ලේකම් (බ.ප)
ලේකම්, ප්‍රවාහන හා සමූපකාර අමාත්‍යාංශය (බ.ප)
පළාත් ආදායම් කොමසාරිස් (බ.ප)

<u>දිරි දීමනාව ගෙවනු ලබන කාලසීමාව සීමා කිරීම</u>

බස්නාහිර පළාත් සභාව යටතේ ඇති අමතර ප්‍රතිලාභ හිමි ප්‍රියමනාප සේවා ස්ථාන වශයෙන් හඳුනාගෙන ඇති පහත සඳහන් දෙපාර්තමේන්තු වල දීර්ඝ කාලීනව සේවයේ නිරතව සිටීම හේතුවෙන් එම දෙපාර්තමේන්තු සඳහා ස්ථාන මාරු අපේක්ෂාවෙන් සිටින නිලධාරීන්ට අගතියක් සිදුවන අතර, ස්ථාන මාරු පරිපාටිය ක්‍රියාත්මක කිරීමේදීද යම් ගැටළුකාරී තත්ත්වයක් ඇතිවී තිබේ.

02. ඒ අනුව, පහත සඳහන් දෙපාර්තමේන්තු වල සේවයේ නියුතු ස්ථාන මාරු වලට යටත් වන නිලධාරීන් වගුවේ සඳහන් කාලසීමාව ඉක්මවා යම්කිසි විශේෂ හේතුවක් මත එකී දෙපාර්තමේන්තුවේ තවදුරටත් සේවයේ යෙදෙන්නේ නම් ඔවුන්ට හිමිවන දිරි දීමනාව 2017.01.01 දින සිට ක්‍රියාත්මක වනසේ පහත සඳහන් පරිදි සීමා කිරීමට ගරු ආණ්ඩුකාරතුමා විසින් තීරණය කරනු ලැබ ඇත.

| දෙපාර්තමේන්තුව/කාර්යාලය | සේවය | දීමනා ගෙවිය හැකි උපරිම කාල සීමාව |
|---|---|---|
| පළාත් ආදායම් දෙපාර්තමේන්තුව (බ.ප.) | කළමනාකරණ සහකාර සේවය | වසර 03 |
| | රියදුරු සේවය | |
| | කාර්යාල සේවක සේවය | |
| පළාත් මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් කාර්යාලය (බ.ප)<br>සභා ලේකම් කාර්යාලය (බ.ප) | සංවර්ධන නිලධාරී සේවය | වසර 05 |
| | කළමනාකරණ සහකාර සේවය | |
| | රියදුරු සේවය | |
| | කාර්යාල සේවක සේවය | |
| පළාත් ව්‍යාපාර නාම රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව (බ.ප) | කළමනාකරණ සහකාර සේවය | වසර 05 |
| | රියදුරු සේවය | |
| | කාර්යාල සේවක සේවය | |

03. ඒ අනුව මේ සම්බන්ධයෙන් අදාල අංශ දැනුවත් කර අවශ්‍ය ඉදිරි කටයුතු සිදුකරන මෙන් කාරුණිකව දන්වමි.

එම්.ඒ.බී. දයා සෙනරත්
ප්‍රධාන ලේකම්
බස්නාහිර පළාත

පිටපත් :
01. නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) - දැ.ගැ.ස. සහ අ.ක.ස.
02. නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය) - දැ.ගැ.ස. සහ අ.ක.ස.
03. පළාත් මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් (බ.ප.) - දැ.ගැ.ස. සහ අ.ක.ස.
04. පළාත් ව්‍යාපාර නාම රෙජිස්ට්‍රාර් (බ.ප) - දැ.ගැ.ස. සහ අ.ක.ස.
05. ප්‍රධාන අභ්‍යන්තර විගණක - දැ.ගැ.ස.

| Deputy Chief Secretary | Administration | Personnel & Training | Finance | Planning | Engineering | Director Internal Audit |
|---|---|---|---|---|---|---|
| | Tel: 2693964<br>Fax:2669479 | Tel: 2690058<br>Fax:2693952 | Tel: 2693978<br>Fax:2679958 | Tel: 2693970<br>Fax:2676280 | Tel: 2693968<br>Fax:2689900 | Tel: 2689011<br>Fax:2689011 |

**0106**

[illegible]

1. [illegible]
2. [illegible]
3. [illegible]
4. [illegible]
5. [illegible]
6. [illegible]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම ඒ කමිටුවේ සාමාජිකයින්ට ආරාධනා කරනවා හෙට පස්වරු 01.00 ට මගේ නිල කාමරයේ ඒ සම්බන්ධව සාකච්ඡාවක් තිබෙනවා. කරුණාකරලා හැම කෙනෙක්ම ඒකට සම්බන්ධ වෙන්න.

# පෞද්ගලික පැහැදිලි කිරීම්
# PERSONAL EXPLANATIONS

**ගරු ගුණසිරි ජයනාත් -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Gunasiri Jayanath - Chief Government Whip

ගරු සභාපතිතුමනි, ලොතරැයි පත් අලෙවි කිරීම පිළිබඳව ඇති වෙලා තිබෙන ගැටළුව සම්බන්ධයෙන් රජයත් එක්ක අලෙවිකරුවන් සාකච්ඡා වට කිහිපයක් තිබිලා, මම හිතන්නේ අසාර්ථක තත්ත්වයකට පැමිණිලා තිබෙනවා. විශේෂයෙන් ගරු සභාපතිතුමනි, අපේ පළාත් සභාවට අදාළ නොවුණත් අපේ පළාත් සභාව තුළ ජීවත් වන ස්වයං රැකියාවක් හැටියට මෙම ටිකට්පත් අලෙවි කටයුතුවල යෙදෙන ඒ අසරණ පුද්ගලයින්ගේ ජීවනෝපාය මේ වනකොට බරපතළ ලෙස කඩා වැටීමකට ලක් වෙලා තිබෙනවා. මේ ලොතරැයි පත් අලෙවි කිරීමේ ප්‍රශ්නය ගැටළුව මතු වෙලා තිබෙන නිසා. මම නියෝජනය කරන විශේෂයෙන් අපේ ගම්පහ දිස්ත්‍රික්කය ගත්තොත්, ගම්පහ දිස්ත්‍රික්කයේ අලෙවි නියෝජිතයින් විශාල ප්‍රමාණයක්. මුළු රටේම ලොතරැයි පත් අලෙවි නියෝජිතයෝ 2500 ක පමණ ප්‍රමාණයක් සිටිනවා. ඒ වාගේම ගරු සභාපතිතුමනි, දිස්ත්‍රික් අලෙවි නියෝජිතයෝ 80 ක පමණ ප්‍රමාණයක් සිටිනවා. විශේෂයෙන් මේ අලෙවි සහායකයින් ලංකාවේම 12,000 කට වැඩි ප්‍රමාණයක් සිටිනවා. මේ අලෙවි සහායකයින් 12,000 ක ප්‍රමාණයට මේ වනකොට ඇති වෙලා තිබෙන ආර්ථික අපහසුතාවය ඉතාම බරපතළයි ගරු සභාපතිතුමනි. ඇත්තටම ගරු සභාපතිතුමනි, ටිකට් පතක් රුපියල් 10 සිට 20 දක්වා වැඩි කිරීමේදී ලොතරැයි පත්වල ත්‍යාග මුදල, ඊට සාපේක්ෂව වැඩි කළා. ඒ වාගේම ලොතරැයි පතක් අලෙවියෙන් හම්බ වන කමිෂන් එක ඊට සාපේක්ෂව වැඩි වුණා. නමුත් වර්තමානයේ සිද්ධ වෙලා තිබෙන්නේ මේක වැඩි කරද්දී ඊට සාපේක්ෂව ලොතරැයි දිනුම් ප්‍රමාණයත්, ඒ වාගේම අලෙවි සහායකයින්ට හම්බ වන කොමිස් මුදලත් ඊට සාපේක්ෂව වැඩි වීමක් සිද්ධ නොවීමයි. ඊට පස්සේ ගරු සභාපතිතුමනි, මේ වැඩි කිරීම තුළ නැවත ලොතරැයි පත් අලෙවි කරන්න වෙළඳ පොළට ගියාම පාරිභෝගිකයින් මේ මුදලට මේ ටිකට් පත මිලදී ගන්නේ නැති තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. ඒ නිසා මේ වනකොට ලොතරැයි පත් අලෙවිය සියයට 50 කට ආසන්න ප්‍රමාණයකින් කඩා වැටීමක් සිද්ධ වෙලා තිබෙනවා. ඒ හරහා ලොතරැයි අලෙවි කරන මේ සහායකයින්ගේ ජීවිකාව ගෙවා ගන්න බැරි බොහෝ අසරණ අපහසුතාවයකට මේ වනකොට පත් වෙලා තිබෙනවා.

ඒ වාගේම ගරු සභාපතිතුමනි, 2016 වසරේ තමයි ලොතරැයි පත්වලින් අලෙවි ඉලක්ක සපුරාගෙන තිබෙන්නේ. ලංකා ඉතිහාසයේ වැඩිම මුදලක් රුපියල් බිලියන 20.5 ක ඉලක්කයක් ලොතරැයි පත් අලෙවියෙන් රජය සපුරාගෙන තිබෙනවා. ලාභය. ආදායම. ඉලක්කගත මුදල රුපියල් බිලියන 20 යි. 20.5 ක් දක්වා වැඩි වෙලා තිබෙනවා. ලංකා ඉතිහාසයේ වැඩිම ලොතරැයි පත් අලෙවිය සිද්ධ වෙලා තිබෙන්නේ ගිය වසරේ. ඒ නිසා රජයට විශාල ආදායමක් එකතු වෙලා තිබෙනවා.

විශේෂයෙන් ගරු සභාපතිතුමනි, මේ ලොතරැයි පත් අලෙවියෙන් රජය ගන්න බදු මුදලින් වැඩිම මුදලක් යන්නේ ජනාධිපති අරමුදලට. අපි දන්නවා ජනාධිපති අරමුදල හරහා අපේ රටේ බොහොම අසරණ, අහිංසක රෝගීන්ට විශාල ලෙස සත්කාරය සිද්ධ වන දෙයක් බවට පත් වෙලා තිබෙනවා. මේ ලොතරැයි පත් අලෙවිය කඩා වැටීම තුළ ජනාධිපති අරමුදලට හම්බ වන මුදල අඩු වීමෙන් අපේ රටේ අන්ත අසරණ රෝගීන් තමයි අපහසුතාවයට පත් වෙන්නේ. ඊට පස්සේ ජාතික ඒකාබද්ධතා අරමුදලට යනවා. ඒ වාගේම කෘෂිකර්ම අමාත්‍යාංශයට. කම්කරු අමාත්‍යාංශයට. සෞඛ්‍ය අමාත්‍යාංශයට ආදී වශයෙන් මේ බදු මුදල් යනවා. ඒ නිසා වර්තමාන රජය, යහපාලන ආණ්ඩුව මේ යථාර්ථය හරියට තේරුම් අරගෙන නැහැ. අද වනකොට ලොතරැයි පත් අලෙවි නියෝජිතයෝ මේ වැඩි කරපු මුදලට ටිකට් පත විකුණා ගන්න බැරිව විශාල අපහසුතාවයකට පත් වෙලා තිබෙනවා. ඒ නිසා මේ රජය වහාම මැදිහත් වෙලා, පෙර මුදලට ගෙනැල්ලා ඊට සාපේක්ෂව දිනුම් සහ ලොතරැයි පත් අලෙවි නියෝජිතයින්ට අවශ්‍ය ඒ කමිෂන් මුදල ඒ ආකාරයෙන් ලබා දෙන වැඩ පිළිවෙළකට අවතීර්ණ නොවුණොත් විශාල අපහසුතාවයකට පත් වෙනවා. විශේෂයෙන් ඊළඟ වැදගත්ම

කාරණය තමයි ගරු සභාපතිතුමනි, මේ අලෙවි සභායකයින් 12,000 අතර විශාල ප්‍රමාණයක් ආබාධිත පුද්ගලයෝ ඉන්නවා. මෙන්න මේක තමයි මෙතැන තිබෙන වැදගත්ම කාරණය. ස්වයං රැකියාවක් හැටියට - ආබාධිත පුද්ගලයින්ට ලෙහෙසියෙන්ම ස්වයං රැකියාවක් ලෙස නියැලෙන්න පුළුවන් කාරණාව තමයි ලොතරැයි පත් අලෙවියට යෑම. මෙන්න මේක තමයි බරපතළ කාරණය. රජයක් හැටියට විශේෂයෙන් හිතන්නට ඕනෑ මේ ආබාධිත පුද්ගලයෝ ලොතරැයි පත් අලෙවි සභායකයෝ හැටියට කටයුතු කරනවා. ඒ අයගේ ජීවනෝපාය ගෙන යෑම සඳහා යම් පිටිවහලක් කරගෙන තිබෙනවා. ඒ නිසා විශේෂයෙන් රජය මෙන්න මේ කාරණය පිළිබඳව වැඩි අවධානයක් යොමු කරලා මේ ලොතරැයි පත් අලෙවි සභායකයින් හැටියට කටයුතු කරන ආබාධිත පුද්ගලයින් දිහා රජයේ කරුණාව ලැබෙන්න ඕනෑ කාල වකවානුවක්. ඒ නිසා විශේෂයෙන් ඒ කාරණාවට මේ රජය වහා මැදිහත් විය යුතුයි කියන කාරණාවයි මේ වෙලාවේ මම මතක් කරන්න. බොහොම ස්තුතියි.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ගරු සභාපතිතුමනි, 36 (1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක්. බණ්ඩාරගම අධ්‍යාපන කලාපය ගැන. ගරු සභාපතිතුමනි, හොරණ අධ්‍යාපන කලාපයට අයත් බණ්ඩාරගම අධ්‍යාපන කොට්ඨාශයට පරිපාලන නිලධාරියෙක් පත් වෙලා ආවට පස්සේ ඒ නිලධාරියාට දේශපාලන ආශිර්වාදය ප්‍රාර්ථනා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔය 36 (1) කිව්වාට ඔබතුමාගේ වරප්‍රසාද කඩවීමක් නොවෙයි නේ?

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

මේ මටයි, ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමාටයි -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා වාඩි වෙන්න. ඔබතුමා නීතිඥ මහත්තයෙක්.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ඔබතුමා බාධා කරන්න එපා. මේ කාරණයට ඇහුම්කන් දීලා ඒ කාරණය ආදාළ නැත්නම් වරප්‍රසාද නොවෙයි කියලා ඔබතුමා කියන්න. ඔබතුමා කථා කරන්න හදන කොටම මේක විනාශ කරන්න හදනවා. මම කියන කාරණය මුලින්ම අහන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා කරුණාකරලා, 36 (1) රීතිවල කොහේවත් නැහැ -

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ඔබතුමා අහන්න. මගෙයි ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමාගෙයි -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා නීතිඥ මහත්මයෙක්. ඔබතුමා ඉස්සෙල්ලා මට රීතිය කියවන්න.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

36 (1) යටතේ වරප්‍රසාද කඩවීමක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ප්‍රශ්නය තියෙන්නේ හොරණ අධ්‍යාපන කලාපයේ. ඔබතුමාගේ වරප්‍රසාද කඩ වෙලා නැහැ.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

හොරණ අධ්‍යාපන කලාපයේ පළාත් සභා මන්ත්‍රීවරයෙකු විධියට කටයුතු කරද්දී මම අහන්නේ, කවුරු හරි අධ්‍යාපනයට පත් වෙලා ආපු පරිපාලන නිලධාරියෙකුට පළාත් සභාවෙන් බණ්ඩාරගම පළාත් සභා මන්ත්‍රී කෙනෙක් පත් කරලා තිබෙනවාද ආශිර්වාද ගන්න කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා ඕක වරප්‍රසාද කියලා අහන්න දෙයක් නැහැ. ඇමැතිතුමාගෙන් අහන්න.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

අපේ වරප්‍රසාද කඩ වෙලා තියෙන්නේ. අපි හතර දෙනෙක් ඉන්න කොට එක්කෙනෙක් පත් කරලා තිබෙනවාද ආශිර්වාද ගන්න කියලා. හොරණ අධ්‍යාපන කලාපයෙන් අදාළ නිලධාරියාට කියනවා නම් අදාළ පළාත් සභා මන්ත්‍රීවරයාගෙන් ආශිර්වාද ගන්න කියලා, ඒක අපේ අයිතිවාසිකම් කඩවීමක් නොවෙයිද?

**ගරු රංජිත් සෝමවංශ** (අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමා)
Hon. Ranjith Somawansa (Minister of Education, Cultural and Arts Affairs, Sports and Youth Affairs and Information Technology.)

මෙහෙමයි. ඔබතුමාගේ අතේ තිබෙන රීති සංග්‍රහය අනුව මට මේවාට උත්තර දෙන්න බලයක් නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා මේ සභාවට එද්දී හෝ යද්දී හෝ මේ සභා ගර්භය තුළදී හරි ඔබතුමාට යම් දෙයක් වුණා නම් අපට ඒ ගැන කථා කරන්න පුළුවන්.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

36 තිබෙනවා ගරු සභාපතිතුමා, ඊළඟට ගන්න ඕනෑ ක්‍රියා මාර්ගයත්. එතුමාට උත්තර දෙන්න බැරි වුණාට ඒකේ තිබෙනවා ගන්න ඕනෑ ක්‍රියා මාර්ගය. රාජ්‍ය නිලධාරියෙකුට මන්ත්‍රීවරයෙකුගෙන් ආශිර්වාද ගන්න කියනවා නම්, ඉතුරු මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාද කඩවීමක් නොවෙයිද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒකේ කොහෙත්ම වරප්‍රසාද කඩවීමක් නැහැ.



**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

ගරු සභාපතිතුමනි, 36 (1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක් යොමු කිරීමට තිබෙනවා. අයවැය විවාද අවස්ථාවේදී මම මෙය මතු කළා. මම මේ සභාව ආරම්භයේ කටයුතු කළේ, අධ්‍යාපන කටයුතු පිළිබඳ අධීක්ෂණ කටයුතුවලට සම්බන්ධ වෙලා. එතකොට පසුගිය කාල පරිච්ඡේදයේ අමාත්‍ය මණ්ඩලය වෙනස්වීම තුළ නැවත වතාවක් මේ සංශෝධන සිද්ධ වුණා. මම පැහැදිලි කරලා කිව්වා, මම යම් වැඩ කොටසක් මේ දෙපාර්තමේන්තුව යටතේ කරගෙන යනවා. ඒ නිසා මගේ අමාත්‍යාංශය අධ්‍යාපන අමාත්‍යාංශය බවට - එවක හිටපු සුමිත් ලාල් මෙන්ඩිස් ගරු ඇමැතිතුමා ඒ කටයුත්ත ඒ ආකාරයෙන් සිද්ධ කරනවා කියලා භාර ගත්තා. නමුත් ගිය අයවැය වනකොටත් නියම ආකාරයෙන් නිවැරදි වෙලා තිබුණේ නැහැ. මම ගරු ඔබතුමාට අයවැය අවස්ථාවේදීත් මේ පිළිබඳව පැහැදිලි කළා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මට මතකයි.

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

මේ වනතුරුත් මට කිසිම දැනුම්දීමක් කරලා නැහැ. ඒ නිසා කරුණාකරලා අවශ්‍ය කටයුතු -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා දැන් ඔබතුමාට අවශ්‍ය අධ්‍යාපන අමාත්‍යාංශ උපදේශක කාරක සභාවට සම්බන්ධ වෙන්නද?

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

ඔව්. මම ආරම්භයේ ඉඳල වැඩ කළේ අධ්‍යාපන අමාත්‍යාංශයේ. කොහොම හරි වෙනසක් කරලා තිබෙන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා දැන් ඉන්නේ සෞඛ්‍යයේ නේද? දැන් ඔබතුමාගේ උපදේශක කාරක සභාව සෞඛ්‍ය අමාත්‍යාංශය නේද දැන් ඉන්නේ?

0105

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

මම ඒක දැන ගත්තේ අයවැය අවස්ථාවේදී.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම ඒක නිවැරැදි කරන්නම් ගරු මන්ත්‍රීතුමා

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

මම සුමිත් ලාල් මැන්දිස් හිටපු සංවිධායකතුමාගෙන් ඒක ඇහුවාම එතුමා කිව්වා, වැරැදීමක් වෙලා තිබෙනවා. ඒක නිවැරැදි කරනවා කියලා. මම ඒ නිවැරැදි කිරීම අපේක්ෂාවෙන් හිටියා. නමුත් ඒක තව වනතුරු සිද්ධ වෙලා නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම ඒක නිවැරැදි කරන්නම් ගරු මන්ත්‍රීතුමා. ඊළඟ සභාව වනකොට මම ඒක අනිවාර්යයෙන් නිවැරදි කරලා දෙනවා. අන්න වරප්‍රසාද. ජ්‍යෙෂ්ඨ ඇමැතිවරයෙක්.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

මුලින්ම ඇහුම්කන් දීලා ඉන්න. පටන් ගන්න කොටම දිව්‍ය ඥාණය තියෙනවා වාගේ නේ? සභාපති පුටුවට නැග්ගට පස්සේ දිව්‍ය ඥාණය පහළ වෙන්නේ නැහැ නේ? අහගෙන ඉඳලා ඊළඟට කියන්න.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ගරු සභාපතිතුමනි, මම ඊයේ පළාත් පාලන ලේකම්තුමා හරහා හදිසි රැස්වීමක් කැඳවූවා. අද සවස් වනකොට මන්ත්‍රීවරු ඔක්කෝටම දුරකථන මගින් මගේ කාර්යාලයෙන් කථා කරයි. දැන් බරපතළ ලෙස නියගය ක්‍රියාත්මක වෙනවා. අපි කඩිනමින් වහා ක්‍රියා මාර්ග ගත යුතුයි. ඒ නිසා අපට තිබෙන යාන්ත්‍රණය තමයි පළාත් පාලන ආයතන. මම දැන් අපේ උපදේශක කාරක සභාව හදිසියේ කැඳ වූවා. සියලුම ගරු මන්ත්‍රීවරුන් ඇමැතිවරුන්ටත් මම හෙට සවස 02.00 ට ආරාධනා කරනවා. වැඩි මනක් වශයෙන් සියලුම ගරු මන්ත්‍රීවරුන්ට

0106

අපි දුරකථනයෙනුත් දැනුම්දීමක් කරනවා. නියගය ගැන අපි මොකක්ද ගන්න තීන්දුව කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ප්‍රධාන ඇමැතිතුමා අපි සම්ප්‍රදායානුකූලව පවත්වන කාරක සභාවක් තිබෙනවා. ඒ තමයි සභා කටයුතු කාරක සභාව. ඒක 02.30 ට පැවැත් වෙනවා.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ඒකත් එතැනම රැස් වෙන්න දාගන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒක එතැනට බැහැ. ලේකම්තුමා සම්බන්ධ වෙනවා. න්‍යාය පත්‍රය හදන්නේ. ඒ අය පොඩ්ඩක් අත්හරින්න. ආවේ නැති වුණාට කමක් නැහැ. ඒ අයත් එක්ක පස්සේ කථා කරන්න.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

සභා ලේකම්තුමාත් ඉන්න නිසා ඔබතුමන්ලා 02.00 ට ඇවිල්ලා ඒක ඉවර කරලා සාකච්ඡාවට සම්බන්ධ වෙන්න පුළුවන් නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ප්‍රධාන ඇමැතිතුමා අපේ වරප්‍රසාද කමිටුව 01.30 ට දාලා තිබෙනවා. මම කලින් නිවේදනය කළේ ඒකයි.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ඔබතුමා සුදුසු දෙයක් කරන්න කෝ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා 03.30 ට විතර දැම්මොත් අපට එන්න පුළුවන්.

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

එහෙම නම් අපි 03.00 ට කියලා කියන්නම්. එහෙම නම් 03.00 ට දාමු.

**0071**

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එහෙම නම් ඔබතුමාගේ වෙලාව 03.30 ද?

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ඔව්. 03.30 ට දාමු.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

බස්නාහිර පළාත් සභාව විසින් හොරණ කලාපයේ පාසල්වල දරුවන් සඳහා ලබා දෙන ලද ශබ්ද කෝෂය සම්බන්ධව පෞද්ගලික පැහැදිලි කිරීම සඳහා ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමාට විනාඩි 05 ක කාලයක් තිබෙනවා.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ගරු සභාපතිතුමනි, ඇත්තටම මම ගිය වසරේ මුදල් ප්‍රතිපාදනවලින් හොරණ කලාපයේ දරුවන් සඳහා ශබ්ද කෝෂයක් ලබා දෙනු ලැබුවා. මම හිතන්නේ, ඒ ලබා දීමේදී අපි මේක පළාත් සභාවේත් කථා කරලා, අධ්‍යාපන උපදේශක කාරක සභාවේත් තීන්දුවක් අරගෙන, ඒ ශබ්ද කෝෂයත් එක්කම ළමයින්ගේ දැන ගැනීම සඳහා ක්‍රි.පූ. 161 ඉඳන් මේ දක්වා රට එක්සේසත් කරපු නායකයන්ගේ වර්ෂත් එක්ක ඒකේ සඳහන් කරනු ලැබුවා. ඒ සඳහන් කරනු ලැබුවේ පළාත් සභාවේ එකඟතාවයක් උඩ. ඊට පස්සේ මම ගිය සතියේ අළුබෝමුල්ල මහින්ද විද්‍යාලයේ උත්සවයකදී මේ පොත් බෙදන කොට මම එතැනදී පොත දැක්කාම රට එක්සේසත් කරපු නායකයෝ 12 දෙනෙක් මේ රටේ හිටියා. ඒ 12 දෙනාගේම පිටුව ගලවලා අයින් කරලා. ඉතින් ඊට පස්සේ මම විදුහල්පතිතුමාගෙන් ඇහුවා, කවුද මේක ගැලෙව්වේ කියලා. විදුහල්පතිතුමා පැහැදිලිව කිව්වා, මේ මට එවපු විධිය තමයි කියලා. ඊට පස්සේ මම හොරණ කලාප අධ්‍යක්ෂතුමියගෙන් ඇහුවා. හොරණ කලාප අධ්‍යක්ෂතුමිය කිව්වා මම නොවෙයි. ගණකාධිකාරීවරයා විසින් කරපු දෙයක් කියලා. මම ආපහු එතුමියට කථා කළාම එතුමිය කිව්වා මට කරන්න දෙයක් නැහැ කලාප අධ්‍යක්ෂ - නැවත මම කලාප අධ්‍යක්ෂතුමියට කථා කළාම කලාප අධ්‍යක්ෂතුමිය කියපු දේ තමයි ඉහළ නියෝගයක් අනුව තමයි මේ කටයුත්ත කළේ කියලා. ඉතින් ඒ නිසා මම දැනගන්න කැමැතියි -

**0072**

**ගරු ගාමිණී තිලකසිරි** (කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, ධීවර, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන අමාත්‍යතුමා)
Hon. Gamini Thilakasiri (Minister of Agriculture, Land, Irrigation, Fisheries Animal Production and Health and Agrarian Development.)

ඒ නාම ලේඛනය පොඩ්ඩක් කියෙව්වා නම් හරි. ඒ වීරවරයෝ 12 දෙනාගේ නම් කවුද කියලා දන්නේ නැහැ.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ඒ නාම ලේඛය මේ පොතේ තිබෙනවා.

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

නාම ලේඛනය දැම්මොත් හොඳයි නේද?

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ඉතින් රට එක්සේසත් කරපු නායකයන්ගේ -

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

මහින්ද මහත්තයාගේ නමත් අන්තිමට දැම්මාද?

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

මම කියන්නේ මේක ගැන පක්ෂ පාට භේද හිතන්න එපා. මේක එහෙම හිතන්න ඕනෑ දෙයක් නොවෙයි. මම කියන්නේ එහෙම අයින් කරනවා නම් -

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ඉස්කෝල පොත්වල දේශපාලනය කරන්න එපා. ඒක ඩික්ෂනරියක් නේ?

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

පොඩ්ඩක් කථා කරන්න දෙන්න කෝ? පළාත් සභාවේ මේක එහෙම අයින් කරනවා නම් - පළාත් සභාවේ කථා කරලා පළාත් සභාවේ අනුමැතිය දුන්නා. උපදේශක කාරක සභාවේ අනුමැතිය දුන්නා. එහෙම නම් කලාප කාර්යාලයෙන් අයින් කරනවා නම් නැවත උපදේශක

කාරක සභාවට දාලා ඒකේ අනුමැතියක් අරගෙන තමයි කරන්න ඕනෑ. එහෙම නැතුව කලාප අධ්‍යක්ෂතුමිය මේ තීන්දුව ගත්තේ කොහොමද? කවුද කලාප අධ්‍යක්ෂතුමියට ඉහළ නියෝගයක් දුන්නේ?

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ආශිර්වාද දෙන එක්කෙනා.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ඒ නිසා මේක ලොකු ගැටළුවක්. මම කියන්නේ, මේක ඇත්තටම අපි සාමාන්‍යයෙන් අධ්‍යාපනය කරන කාලයේ ඉතිහාසයේ බලන කොට, අපට මතක හිටින්න ඕනෑ නිසා, අපි පන්ති කාමරවල ඉතිහාසයේ රට එක්සේසත් කරපු නායකයන්ගේ පින්තූර වර්ෂත් එක්ක ගහනවා. ඒ දරුවන්ගේ දැන ගැනීම සඳහා. ඉතින් එහෙම කරන කොට මේ පොතට රට එක්සේසත් කරපු නායකයන්ගේ පින්තූර ටික දැම්මාම මේක ගලවලා අයින් කරනවා නම්, ඒ ගලවපු කෙනා කවුද කියන එකයි අපට දැනගන්න ඕනෑ. ගලවන්න නියෝග දුන්නේ කවුද කියන එකයි අපට දැනගන්න ඕනෑ ගරු සභාපතිතුමනි.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

බණ්ඩාරගම ආශිර්වාද දෙයියන්ගේ වැඩක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා අනුමැතිය ගත්තේ අමාත්‍යාංශයෙන්ද?

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

අමාත්‍ය මණ්ඩලයෙන් අනුමැතිය දුන්නා. ගරු සභාපතිතුමනි, මම මේක පළාත් සභාවේත් කථා කළා. ඊට පස්සේ අධ්‍යාපන උපදේශක කාරක සභාවේත් කථා කළා. ඊට පස්සේ අධ්‍යාපන ඇමැතිතුමා උපදේශක කාරක සභාවට දාලා මට අනුමැතිය දුන්නා. මේක බෙදන්න. අනුමැතිය දීලා කලාපයටත් කිව්වා. කලාපයටත් දුන්නාට පස්සේ තමයි මේක කළේ. මම කියන්නේ මෙහෙම කරනවා නම් ඒක නැවත මේවා කරන්න ඕනෑ. මම කියන්නේ මේක කළේ කවුද කියලා පරීක්ෂණයක් කරලා සභාවට වාර්තාවක් දෙන්න කියලා ඔබතුමා හරහා ගරු අධ්‍යාපන ඇමැතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. ඇමැතිතුමාටත් ඉහළින් ඉන්න මෙපමණ බලගතු කෙනා කවුද කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු අධ්‍යාපන ඇමැතිතුමාත් මේ සභාවේ ඉන්න නිසා, ඔබතුමා මොනවත් මේ ගැන දන්නේ නැද්ද? ඒ සම්බන්ධව ඔබතුමා මොනවත් දන්නේ නැද්ද?

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, මගෙන් අහන්න අවශ්‍ය නැහැ. ඔබතුමාගේ අතේ රීති පොත තිබෙනවා. ඉතින් මගෙන් ඕක අහන එක වැරැදියි. මට අදාළ නැහැ. මම ඔය රීතියෙන් පිට වැඩ කරන්නේ නැහැ. මම ඔබතුමාගේ ඇවෑමෙන් මූලාසනයේ හිටපු කෙනෙක්. මම කවදාවත් රීතිය කඩන්න කැමැති නැහැ. වැරැදිලාවත් කැඩුණොත් සමාව ඉල්ලනවා.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ගරු සභාපතිතුමනි, මම ඉල්ලන්නේ මේකට පරීක්ෂණයක් කරලා සභාවට වාර්තාවක් දෙන්න කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම ඒ ගැන බලන්නම්. මම ලේකම්තුමාට උපදෙස් දෙනවා ඒ ගැන පරීක්ෂණයක් පවත්වන්න කියලා. අනිවාර්යෙන්ම මම ඒ දේ කරනවා. පළාතේ පාසල් පරිපාලනය අර්බුදයක. සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමා ඔබතුමාට විනාඩි 04 ක කාලයක් තිබෙනවා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, මම ගරු ප්‍රධාන අමාත්‍යතුමාගෙන් ඉල්ලීමක් කරනවා. ගරු ප්‍රධාන ඇමතිතුමනි, මම මේ කියන එක විනාඩි දෙකක් සමාවෙලා කන් දීලා ගියොත් ඒක වැදගත් වෙයි මේ පිළිබඳව විධිමත් පියවරක් ගන්න. ගරු සභාපතිතුමනි, ජනවාරි මාසේ හතර වැනිදා ලංකාදීප

[ගරු සුසිල් කිඳෙල්පිටිය]

පුවත්පතේ ප්‍රවෘත්තියක් පළ වෙනවා. ඒ ප්‍රවෘත්තියේ මොකක්ද පළ වෙන්නේ. *ක්‍රිකට් පුහුණුවට කියා දැරියක කැලේට ගෙන ගිය පුහුණුකරු අත්අඩංගුවට* කියලා මෙන්න ප්‍රවෘත්තිය තිබෙනවා. මේ ප්‍රවෘත්තිය පිළිබඳ කාරණය නොවෙයි. අවුරුදු 13 ක දැරියක්. ක්‍රිකට් පුහුණුකරු විසින් ජනවාරි 01 වැනිදා උදේ ගෙදරට ගිහිල්ලා පුහුණුව සඳහා කියලා අරගෙන ගිහිල්ලා. මේ දැරියව කෑගල්ල ප්‍රදේශයට අරගෙන යනවා. කෑගල්ල ප්‍රදේශයට අරගෙන යන ගමන් මේ දැරියට යම් බලපෑමක් කරන්න අරගෙන යන්නේ. දැරිය මේ පුහුණුකරුගෙන් බේරෙන්න බැරි තැන කෙටි පණිවුඩයක් යවනවා, තමන්ගේ යාළුවෙකුට. ගලිගමුව පැත්තේ. මම හරි අමාරුවක වැටිලා ඉන්නේ. පුහුණුකරු මාව අරගෙන යනවා. මට හයයි. මේ ගැන මොකක් හරි කරන්න කියලා. ඒ දැරියගේ යාළුවා මේක පොලීසියට දැනුම් දෙනවා. පොලීසියට දැනුම් දුන්නාට පස්සේ, මේ දැරිය කෑගල්ල ප්‍රදේශයේ කුරුළු කැලේට ගෙනියන කොට පොලීසිය වටලලා, දැරියව සහ පුහුණුකරුව අත්අඩංගුවට ගන්නවා. මේ පුහුණුකරු මේ දැරියට ඒ වන කොට මත්ද්‍රව්‍යයක් පොවලා තිබෙනවා. මේ දැරිය ඒ වෙලාවේ ගත් තීරණය නිසා ඒ දැරියගේ කල්පනාව නිසා මේ දැරියගේ ජීවිතය බේරෙනවා. මේ දැරියට අතවරයක් කරන්න අරගෙන යන්නේ. දැන් මේ පුහුණුකරු කවුද? මේකේ නම තිබෙනවා.

දැන් මේකේ ප්‍රශ්නය මේකයි. මේක සිද්ධ වෙන්නේ මාළඹේ රාහුල බාලිකා විද්‍යාලයේ. මේ පුහුණුකරු අවුරුදු කිහිපයක් මේ පාසලේ වැඩ කරනවා. අවුරුදු තුනක්. මේ පුහුණුකරු සම්බන්ධයෙන් මීට කලින් පැමිණිලි එනවා. ක්‍රිකට් පුහුණුවට අරන් යන ගැහැණු දරුවන්ට බියර් පෙව්වාය කියලා. එතකොට මේ දැරියෝ කිහිප දෙනෙක් අපයෝජනයට ලක් කරන්න, මේ පුහුණුකරු උත්සාහ කරනවා. වාසනාවට ඒවා වැළකෙනවා. මේකේ කූඨප්‍රාප්තියට පත් වෙන්නේ, අවසානයේ මේ දැරියව මේ පුහුණුකරු විසින් තමන්ගේ වාහනයේ දා ගෙන අතවරයක් කිරීම සඳහා අරගෙන යන වෙලාවේදී. ජනවාරි 01 වැනිදා. දැන් මේකේ ප්‍රශ්නය මේකයි. වාසනාවට වෛද්‍ය පරීක්ෂණයකින් දැරියට අතවරයක් වෙලා නැහැයි කියලා ඔප්පු වෙනවා. පොලීසිය වෙලාවට ආපු නිසා, ඒ පුංචි දරුවෝ ගත්ත තීරණය නිසා මේ දරුවාගේ ජීවිතය බේරෙනවා. හැබැයි, මේ දරුවාගේ අම්මාට කථා කරලා විදුහල්පතිනිය කියනවා, මේ දරුවා ඉස්කෝලේ එවන්න එපා. ඉස්කෝලේ එවන්න එපා කිව්වාම මොකක්ද යන පණිවුඩය? ඒ කියන්නේ, මේ දැරියට අතවරයක් වෙලා. සමහරු කට කථා යවනවා මේ දැරිය ගැබ් අරගෙන කියලා. ඒ නිසා මේක බරපතළ තත්ත්වයක්. පස්සේ දිගින් දිගටම විවිධ අය මැදිහත් වෙනවා, මේ දරුවාව ඉස්කෝලෙට ගේන්න. හැබැයි, විදුහල්පතිනිය ඉඩ දෙන්නේ නැහැ.

ගරු සභාපතිතුමනි, ගරු මහ ඇමතිතුමනි, විදුහල්පතිනියට කරන්න තිබුණේ මොකක්ද? විදුහල්පතිනියට කරන්න තිබුණේ, මේ දැරියගේ දෙමව්පියෝ ගෙන්වලා, මුළු පාසල ඉස්සරහාම මේ දැරියගේ වීර ක්‍රියාව, මේ දැරිය ජීවිතය ආරක්ෂා කර ගනිමින් දුන්න ආදර්ශය, පරමාදර්ශය දරුවෝ ඉස්සරහා පෙන්වලා මේ දැරියව වීර දැරියක් කරන එකයි. එහෙම කරනවා වෙනුවට, මේ විදුහල්පතිනිය කරන්නේ මොකක්ද? දිගින් දිගටම රැස්වීම් පවත්වමින්, මේ ක්‍රිකට් ගහන දරුවන්ගේ අම්මලා ගෙන්වලා මේ පුහුණුකරුව සාධාරණීකරණය කරන්න උත්සාහ කරනවා. ඒ නිසා මේක බරපතළ තත්ත්වයක්. මේ දැරියගේ අයිතිවාසිකම් වෙනුවෙනුයි මම මේ මොහොතේ කථා කරන්නේ. සමහර වෙලාවට අධ්‍යාපන ඇමතිතුමා මේක දන්නේවත් නැතිව ඇති. මම මේ අහම්බෙන් පුවත්පතක දැකලා මේක සොයන කොට ඊයේ දවසේ මගේ ගෙදර - මේක තැපෑලේ ආවේ නැහැ. මේක ජනාධිපතිතුමාට යවපු ලිපියක්. මට පිටපතක් මගේ ගෙදර තැපැල් පෙට්ටියේ දාලා තිබුණා ගරු සභාපතිතුමනි. ඊට පස්සේ මම මේ ගැන සොයලා බැලුවා. ඒ නිසා මේක බරපතළ තත්ත්වයක්. මීට කලිනුත් මේ පාසලේ ප්‍රශ්න පිළිබඳව මම මේ සභාවේදී මතු කරලා තිබෙනවා. අපේ මන්ත්‍රීවරු දන්නවා. මේ විදුහල්පතිනියගේ ක්‍රියාකලාපය පිළිබඳව බරපතළ ප්‍රශ්න තිබෙනවා. ඒ නිසා දැන් මේ විදුහල්පතිනිය මොකක්ද කරන්නේ? අර ක්‍රිකට් පුහුණුකරුට කරන්න බැරි වුණු අපරාධය විදුහල්පතිනිය කරනවා. ඒ නිසා ගරු සභාපතිතුමනි, කරුණාකර මේ ගැන සොයා බලන්න. අධ්‍යාපන ඇමතිතුමා නම් දන්නේත් නැතිව ඇති. මේ ගැන සොයලා බලලා, වහාම මේ ගැන තීරණයක් ගන්න. මේක ඉතාම බරපතළ ප්‍රශ්නයක් කියන එක මතු කරනවා. බොහොම ස්තුතියි.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

පොඩි උත්තරයක් දෙන්න බැරිද?

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

බැහැ, බැහැ. රීතියට පිටින් බැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමාගේ කාරණාව බරපතළ කාරණාවක්. රීති පොතේ නැහැයි කියලා කාටවත් ඔය ප්‍රශ්නයෙන් නිදහස් වෙන්න බැහැ. ළමයෙක් පිළිබඳව බරපතළ චෝදනාවක් කරන්නේ. ඕක පළාත් සභාවටත් ප්‍රශ්නයක්. රීති පොතේ නැහැ කියලා ඔය ප්‍රශ්න මඟ හරින්න බැහැ. එතුමා ප්‍රකශ කළේ බරපතළ කාරණාවක්. ඔබතුමාටත් අදාළයි.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

සමාවෙන්න ගරු සභාපතිතුමනි. මම කියන්නේ ඔය වාගේ තැන්වලදී පිළිතුරක් දෙන්න හරි අපි කලින් කිව්වා ඔය රීති සංශෝධනයකට ලක් කරන්න කියලා. ගරු සභාපතිතුමනි -

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

විශේෂ ප්‍රකාශවලට උත්තර දෙන්න බැහැ නේ?

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

පොඩ්ඩක් කියන කල් ඉන්න කෝ? එතකොට සභාපතිතුමා දෙන නියෝගයක් පිළිපදින්න අපි එකඟයි. මට ඒ වචනය පාවිච්චි කරන්න පුළුවන්. මට රීතිය කඩන්න බැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒ සම්බන්ධව ඔබතුමා පරීක්ෂණයක් කරන්න ගරු ඇමැතිතුමා. දරුවන් වෙනුවෙන්. ඔබතුමා අපේ අධ්‍යාපන ඇමැතිතුමා.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

ගරු සභාපතිතුමනි, එතුමා කියපු දේ පිළිබඳව මට ඌණ පූර්ණයක් කරන්න අවස්ථාවක් තිබෙනවාද?



**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දැන් ගරු ඇමැතිතුමා පැහැදිලි කිරීමක් කළා නේ? ඒක ප්‍රශ්නයක් වෙනවා. එතුමාගේ කඩුවෙල කොට්ඨාශයේ.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

ගරු සභාපතිතුමනි, කඩුවෙල මගේ කොට්ඨාශය. එතුමා කොලොන්නාව ආසනයේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එහෙම නම් ඔබතුමා උදේ ඇවිල්ලා ඒ ප්‍රකාශය කරන්න ඕනෑ.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

මම කොළඹ දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරයෙක්. මම උපදේශක කාරක සභාවේ සාමාජිකයෙක්. ව්‍යූහ කමිටුවේ සාමාජිකයෙක්. ගරු සභාපතිතුමනි, මම කථා කළේ විදුහල්පතිනිය සම්බන්ධයෙන් නොවෙයි. දරුවාගේ අයිතිවාසිකම් ගැන මම කථා කළේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපේ ඇමැතිතුමා දැන් පරීක්ෂණයක් කරනවා. ඒක දැන් ඉවරයි. ඔබතුමා සාධාරණ පරීක්ෂණයක් කරන්න. නෑබොඩ ආයුර්වේද රෝහලේ උද්ගත වී ඇති සේවක නොසන්සුන්තාවය පිළිබඳව අදහස් දැක්වීමට සුනිල් වටගල ගරු මන්ත්‍රීතුමාට විනාඩි 04 ක කාලයක් තිබෙනවා.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ගරු සභාපතිතුමනි, සෞඛ්‍ය අමාත්‍යවරයා හිටියා නම් හොඳයි. මම හිතන්නේ සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයාවත් ඉන්නවාද දන්නේ නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ. කවුරුත්ම නැහැ. කිසිම කෙනෙක් නැහැ.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ලේකම්වත් නැහැ නේද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ලේකම් නැහැ. පේන්න නම් නැහැ.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ගරු සභාපතිතුමනි, ඔබතුමාගේ මාර්ගයෙන් මම අවධානය -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා මට ඉදිරිපත් කරන්න. මම ඒක දැනුවත් කරන්නම්.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ඔබතුමාගේ මාර්ගයෙන් මම අවධානය යොමු කරනවා. විශේෂයෙන් නැබොඩ ආයුරේවේද රෝහලේ ප්‍රශ්නයක් උද්ගත වෙලා තිබෙනවා. සෞඛ්‍ය ඇමැතිතුමා නැති වුණාට හිටපු සෞඛ්‍ය ඇමැතිතුමා ඉන්නවා. මේක ඔබතුමාගේ දිස්ත්‍රික්කයේ ප්‍රශ්නයක්. ගරු සභාපතිතුමනි, නැබොඩ ආයුර්වේද රෝහලේ සේවක නොසන්සුන්තාවයක් ඇති වෙලා තිබෙනවා. ඒ නොසන්සුන්තාවය ඇති වෙලා තිබෙන්නේ එක්තරා සුළු සේවක උපස්ථායිකාවකගේ නොමනා හැසිරීමක් නිසා. එතකොට සුළු සේවකයන් භාර, පරිපාලන විෂයය භාර AO මේ පිළිබඳව පරීක්ෂණයක් කරලා තිබෙනවා. පරීක්ෂණයක් කරලා, ඒ පරීක්ෂණයේ වාර්තාව ආයුර්වේද කොමසාරිස්වරිය වෙත යවලා තිබෙනවා. පසුව ආයුර්වේද කොමසාරිස්වරියත් ගිහිල්ලා මේ පිළිබඳව පරීක්ෂණයක් කරලා තිබෙනවා. එතකොට මේ පරීක්ෂණ දෙකේම ප්‍රතිඵල ගරු සභාපතිතුමනි, නොමනා හැසිරීමක් තිබෙන මේ උපස්ථායිකාව ස්ථාන මාරු කරන්න කියලා. නමුත් ගරු සභාපතිතුමනි, ඇමැතිතුමා කිව්වා කියලා, මධ්‍යම රජයේ අමාත්‍යවරයෙක් කිව්වා කියලා, ඒ උපස්ථායිකාව මාරු කරන්නේ නැතුව ඉන්නවා. එතකොට වෛද්‍යවරුන් සහ සුළු සේවකයන් අතර බරපතළ ගැටළුවක් ඇති වෙලා තිබෙනවා. එතකොට මේ ගැටලුව හමුවේ මේ ආයුර්වේද කොමසාරිස්වරියට මම සෘජුව පස් පාරක් කථා කරලා තිබෙනවා.

ගරු සභාපතිතුමනි, කියන්න ලැජ්ජයි. මේ ආයුර්වේද කොමසාරිස්වරියට මේ තනතුර සුදුසු නැහැ. ඒ තරම් අසත්‍ය ප්‍රකාශ කරන්නේ. මේ ආයුර්වේද කොමසාරිස්වරිය මා හට ප්‍රකාශ කරපු දේවල්. ඒ වාගේම ගරු සභාපතිතුමනි, මේ ආයුර්වේද කොමසාරිස්වරියව මේ තනතුරේ තියාගන්න හොඳ නැහැ. ඒ තරම් අසත්‍ය ප්‍රකාශ කරන තැනැත්තියක්. එතකොට මේ තැනැත්තිය මට ප්‍රකාශ කළා, මේ රෝහලට ගිහිල්ලා පරීක්ෂණයක් කරලා ඒකට අදාළ ප්‍රගතිය ගැන ගරු මන්ත්‍රීතුමාටත් කියන්නම් කියලා. අද වනතුරු මේ වාර්තාව හංගගෙන ඉන්නවා. මේ වාර්තාව හංගගෙන ඉන්නේ, මේ සෞඛ්‍ය ඇමැතිවරයා කිව්වා කියලා. එතකොට මේ සෞඛ්‍ය ඇමැතිවරයාට තිබෙන සදාචාරය මොකක්ද? මේ සේවක නොසන්සුන්තාවය මධ්‍යයේ - ඉස්පිරිතාලේ සේවක නොසන්සුන්තාවයක් ඇති වෙලා තිබෙනවා. බෙහෙත් දීමට අදාළව ගැටලුවක් ඇති වෙලා තිබෙනවා. ඒක විසඳන්නේ නැතිව අර උපස්ථායිකාවගේ පැත්ත අරගෙන අදාළ පරීක්ෂණයේ වාර්තාව ක්‍රියාත්මක කරන්නේ නැතිව ඉන්නවා. ගරු සභාපතිතුමනි, ඔබතුමාගේ මාර්ගයෙන් මම අවධානය යොමු කරනවා. නොමනා හැසිරීමක් තිබෙන මේ උපස්ථායිකාව වහාම මේ වෙන තැනකට මාරු කරලා සේවකයන් අතර තිබෙන සමගිය ආරක්ෂා කරන්නය කියලා. ඒකට වඩාත්ම වින කටින්නේ මේ ආයුර්වේද කොමසාරිස්වරිය. ඒක පිටිපස්සේ මේ අමාත්‍යවරයා ඉන්නවා. එතකොට අවාසනාවකට මේ සභාවේ මේ පණිවිඩය ගෙනියන්න සෞඛ්‍ය ඇමැතිවරයාවත් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපි සාධාරණය බලාපොරොත්තු වන්නේ කාගෙන්ද? කොමසාරිස්වරියත් පිටිපස්සේ ඉන්නවාලු. ඒ අය ආරක්ෂා කරන්න.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ගරු සභාපතිතුමනි, බරපතළ ප්‍රශ්නයක් තිබෙනවා.

0105

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, රීති ප්‍රශ්නයක් තිබෙනවා. දැන් මේ ගරු සභාපතිතුමා මම වුණත්, කවුරු වුණත් මේ ඇමැතිවරයෙක් සහ අදාළ මන්ත්‍රීවරයා නැති වෙලාවේ එහෙම කථා කරලා, එහෙම චෝදනා කිරීමේ ස්වරූපයෙන් කථා කිරීම -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමැතිතුමා, පෞද්ගලික පැහැදිලි කිරීම් කරන්න එතුමාට අයිතියක් තිබෙනවා. ගරු ඇමැතිතුමා නැහැයි කියලා - ගරු මන්ත්‍රීතුමාට පෞද්ගලික පැහැදිලි කිරීම් කරන්න පුළුවන්. එතුමා සභාවේ ඉන්න ඕනෑ.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ඔබතුමා කොහෙද ඉන්නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඇමැතිතුමා යනවා නම් සභා ගර්භයේ කවුරු හරි තියලා යන්න ඕනෑ.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

මගේ තිබෙන චෝදනාව, මේකට අදාළ වගකීම ගන්න අමාත්‍යවරයාත් නැහැ. අදාළ ලේකම්වරයාත් නැහැ. තමුන්නාන්සේ කියනවා, මට කථා කරන්න අයිතියක් නැහැයි කියලා. මේ කියන කථා මොනවාද? පිස්සු කථා.

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

ලේකම්තුමිය ඉන්නවා.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

කෝ, ලේකම්තුමිය ඉන්නවාද? හරි.

0106

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

මේ 2020 වනතුරු පෙරළෙන්නේ නැහැ. හරිද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අමාත්‍යාංශයේ ලේකම්තුමිය ඉන්නවා.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ගරු සභාපතිතුමනි, ඔබතුමාගේ මාර්ගයෙන් මම අවධානය යොමු කරනවා.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

මේ 2020 වනතුරු පෙරළෙන්නේ නැහැ. හරිද?

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

මේ මෙතුමන්ලා ඉල්ලන් කනවා. පළාත් පාලන මැතිවරණය තියන්න කෝ බලන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අනවශ්‍ය කථා වලට යන්න බැහැ. ඔබතුමාගේ කාලය ඉවරයි. ගරු මන්ත්‍රීතුමා වාඩි වෙන්න. පැහැදිලියි. මේ අවස්ථාවේදී ගරු ඇමැතිතුමා නොසිටියත් (බාධා කිරීම්) සුනිල් වටගල ගරු මන්ත්‍රීතුමා කිව්ව කාරණාව, අපේ අමාත්‍යාංශයට බරපතළ චෝදනාවක් කළේ. ඇමැතිතුමාත් මේ අවස්ථාවේ නැති නිසා මම සන්තෝෂ වෙනවා, ලේකම්තුමිය සභා ගර්භයේ සිටීම පිළිබඳව. ලේකම්තුමිය කරුණාකරලා මේ සම්බන්ධව ඔබතුමියගේ දැඩි අවධානය යොමු කරලා මේ පිළිබඳව ගන්න තීන්දු පිළිබඳව ගරු මන්ත්‍රීතුමා දැනුවත් කරන්න. ගත්ත තීන්දුව පිළිබඳව මෙතුමාව දැනුවත් කරන්න.

මදුරාවල ප්‍රාදේශීය සභාවේ අලුතින් ලබා දෙන ලද ඩබල් කැබ් රථය සම්බන්ධව. ලලිත් වර්ණකුමාර ගරු මන්ත්‍රීතුමාට විනාඩි 04 ක කාලයක් තිබෙනවා.

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

ගරු සභාපතිතුමනි, ස්තූතිවන්ත වෙනවා. මේ මදුරාවල ප්‍රාදේශීය සභාවේ පස්වැනි පළාත් සභා කාලය තුළ හිටපු ගරු ප්‍රධාන අමාත්‍යතුමා ගෙවීමේ ක්‍රමවේදය මත කොළඹ මහ නගර සභාව හැර සියලුම ප්‍රාදේශීය සභාවන්වලට අලුත් වාහන ලබා දුන්නා. ඒ වැඩ කටයුතු සාර්ථකව කරගන්න. ඉතින් මේ වකවානුවල මහජන නියෝජිතයන් නැහැ. සියලුම කාරණාවන් මේ නිලධාරීන් හරහා කෙරෙන්නේ. අද මේ මොහොත වන විට මම හිතන්නේ, මේ ලබා දීපු අලුත්ම ඩබල් කැබ් රථයේ එන්ජිම සම්පූර්ණයෙන්ම විනාශ කරලා, මට ආරංචි තරමට ඒක හදන්න රුපියල් ලක්ෂ තිස් ගණනක කොටේෂන් එකක් දීලා. ලේකම්තුමිය ඒකට එකඟයි කියලා ලියුමක් දීලා තිබෙන්නේ. මම කියන්නේ ඒක නොවෙයි වැඩේ. මේ මහජන නියෝජිතයන් නැති වෙලාවේ, දිගින් දිගටම මේ මදුරාවල ලේකම්තුමිය තිබෙන පොදු ඉඩම් ටික විනාශ කරනවා. කිසිම අරමුණක් නැතිව, කිසිම පදනමක් නැතිව වෙන වෙන දේවල්වලට යොදවනවා. මේ අවුරුදු ගණනක් තිස්සේ හදාගෙන ආ වැඩ පිළිවෙළවල් සියල්ල වෙනස් කරනවා. හදන්න ඕනෑ තැන මාර්ගය හදන්නේ නැහැ. දාන්න ඕනෑ ලයිට් එක දාන්නේ නැහැ. ගම විනාශ කරනවා විතරක් නොවෙයි, සභාවේ තිබෙන යාන වාහන ටිකත් දැන් විනාශයට පත් කරනවා.

විශේෂයෙන්ම මම දන්න තරමට මුරකරුවෙක් ආදේශ කරලා තමයි මේ රථය පදවන්නේ. දැන් පළාත් සභාවේ මහජන නියෝජිතයන් හැටියට අපි මළ ගෙදරක යන කොට, අපේ වාහනවල අපි තෙල් ගහගෙන මළ ගෙදර යනවා. නමුත් අපි හිතන විධියට රියැදුරා යනවා, ඒ වාහනයේම ඒ මළ ගෙවල්වලට රජයේ මුදල් ප්‍රතිපාදන අරගෙන, ඒවා වියදම් කරගෙන. එහෙම ගිහිල්ලා තමයි මෙවැනි අකරතැබ්බවලට මුහුණ පාලා තිබෙන්නේ. මේ අලුතෙන්ම ලබා දීපු වාහන. මේවා පරිස්සම් කරගන්න ඕනෑ. අද දවසට කිලෝ මීටර් විශාල ප්‍රමාණයක්, ලේකම්තුමිය මම හිතන්නේ ඉතා දුර සිට එන්නේ. උදේට යනවා. එක්කගෙන එනවා. ආයේ හවසට ගිහින් දානවා. හැම තැනම යනවා. අපට කමක් නැහැ. ඒ වැඩ කරන නිලධාරීන්ට ඒ පහසුකම් තිබෙන්න ඕනෑ. නමුත් ඒවා ආරක්ෂා කරගන්න ඕනෑ. කවුරුත් නැහැයි කියලා මේවා විනාශ වෙන්න දෙන්න බැහැ.

හැබැයි, ගරු මහ ඇමැතිතුමාත්, විශේෂයෙන්ම අපේ කොමසාරිස්තුමියට ස්තූතිවන්ත වෙනවා. දැන් ලේකම්තුමිය. ලොකු කැපවීමක් කරලා මේවා ආරක්ෂා කරන්න උත්සාහ කරනවා. නමුත් එතුමියන්ලාටත් අවනත නැතිව මහා අමුතු ගති ලක්ෂණ පෙන්නුම් කරමින් මේ කටයුතු කරන තැන්වලට විශේෂ පරීක්ෂණ අවශ්‍ය වෙනවා. ඊට පස්සේ මේවා කැඩිලා ගියාට පස්සේ අන්න එයාව නැවත මුරකරු සේවයට යොදවනවා. එතකොට හොඳ නැහැ. කැඩුවාට පස්සේ. එතකන් හැම තැනම ගෙනි යන්නේ, ඒ හැම තැනම යන්න, එන්න සියලුම දේවල්වලට මේ රියැදුරන් වාහන භාවිතා කරනවා. මේවායේ යම්කිසි ක්‍රමවේදයක් තිබිය යුතුයි. මේ රටේ ජනතාවගේ සල්ලි අපරාදේ. බදු මුදල්වලින් ගන්න දේවල් මෙහෙම විනාශ කරන්න දෙන්න බැහැ. අද මම ගරු ප්‍රධාන අමාත්‍යතුමාගෙන් ප්‍රශ්න ඇහුවෙත් ඒකයි. පොදු ඉඩම් ටික විනාශ කරනවා. එහෙම නැත්නම් අපේ ජනතාවට හිමි දේවල් නැති කරනවා. ඒ අතර දැන් මේ තිබෙන සම්පත් ටිකත් නැති කරනවා. මේකට කඩිනමින් විශේෂ පරීක්ෂණයක් පවත්වලා යම්කිසි පියවරක් ගන්න. ඒ අයගේ වරදක් නම්, ආරංචි විධියට තිබෙන්නේ, රෑ සිදු වුණු දෙයක් කියලා. නමුත් සමහරවිට ආරංචි තිබෙනවා. ලේකම්තුමිය කියනවා, එයත් එක්ක යන කොට මෙය සිදු වුණා කියලා. අපි දන්නේ නැහැ. කෙසේ වෙතත් මෙහෙම කැඩිලා තිබෙනවා. අපි දන්නේ එච්චරයි. කැඩෙන්න විධියක් නැහැ. මේ අලුත් වාහන. මේවා අරගෙන අවුරුදු කිහිප යයි. Brand New වාහන. ඉතින් මේවා කැඩෙන්න විධියක් නැහැ. මෙයට විශේෂ පරීක්ෂණයක් කරන්නය කියලා ඔබතුමා මගින් මම ඉල්ලා සිටිනවා. බොහොම ස්තූතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

බොහොම ස්තූතියි. මේ අවස්ථාවේදී ගරු ඇමැතිතුමා සභා ගර්භයේ නැහැ. වැඩ බලන ලේකම්තුමිය ඉන්නවාද? පළාත් පාලන කොමසාරිස්තුමිය නිලධාරීන්ගේ කුටියේ ඉන්නවාද? ගරු ලේකම්තුමිය මෙතුමා බරපතළ ප්‍රකාශයක්

කළා. මදුරාවල ප්‍රාදේශීය සභාවේ - ඔබතුමියට ඇහෙනවාද? පළාත් පාලන කොමසාරිස්තුමිය ඉන්නවා නේද? එයත් නැද්ද? ඒ පිළිබඳව මම එතුමියව දැනුවත් කරන්නම්.

මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය සභාපති යසපාල කෝරළගේ මැතිතුමා මූලාසනයේ අසුන් ගන්නවා ඇති.

***ඊට අනුකූලව ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නියෝජ්‍ය සභාපතිතුමා [යසපාල කෝරලගේ මහතා ] මූලාසනාරූඪ විය.***

*Accordingly Hon. Chairman [Mr. Sunil Wijeratne] left the Chair and Hon. Deputy Chairman [Mr. Yasapala Koralage] took the Chair.*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමියට විනාඩි 04 ක කාලයක් තිබෙනවා.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මා විසින් කරන මේ විශේෂ ප්‍රකාශය සම්බන්ධයෙන් ඔබතුමා මගින් සභාවේ අවධානය යොමු කරනවා. වසර 30 ක යුද්ධයෙන් පස්සේ විශාල වශයෙන් මේ රටේ මරණ සිද්ධ වන්නේ රිය අනතුරුවලින් කියලා මේ දවස්වල විශාල කතිකාවක් ඇති වෙලා තිබෙනවා. විශේෂයෙන්ම බස්නාහිර පළාතේ තමයි වැඩිම ජනගහනයක් ඉන්නේ. මේ කාරණාවේදී දැනට ජාතික රූපවාහිනිය පරිස්සමින් ගිහින් එන්න කියලා වැඩ සටහනක් දියත් කරලා රිය අනතුරු අවම කරන්න කටයුතු කරමින් ඉන්නවා. බස්නාහිර පළාත විධියට මේ අනතුරු වැඩිවීමත් එක්ක මේක අවම කර ගැනීමට මේ කටයුතුවලට දායක වන්න මම අපේ ප්‍රතිපාදන වෙන් කරලා, රිය පුහුණුව දෙන්න වැඩ පිළිවෙළක් සකස් කරලා, මුදල් වෙන් කිරීම සිදු කරනවා. ඉතා කනගාටුදායක තත්ත්වය වන්නේ දැන් පසුගිය වසරේ මුදල් වෙන් කරලා විභාග සමත් වෙලා ඉන්න අයට අද වන කොටත් මට රිය පුහුණුවක් දෙන්න බැහැ. මේ අමාත්‍යාංශයට වාහනයක් නැහැයි කියලා. මම හිතන්නේ මේ රිය පුහුණුව පසුගිය කාලයේ ප්‍රධාන අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයෙන් ඉතා පිළිවෙළකට සහ ලස්සනට වැඩ පිළිවෙළක් දියත් කෙරුණා. නියම විධියට පුහුණුව දෙනවා. රියැදුරු බලපත්‍රය නියම වෙලාවට ගන්නවා. වාහන නියම වෙලාවට දීලා පුහුණුව ලබා ගන්න පුළුවන්. අද අපේ ලලිත් වනිගරත්න ගරු ඇමැතිතුමා තමයි ප්‍රවාහන අමාත්‍යාංශය භාරව ඉන්නේ. අවස්ථා කිහිපයකදීම වාහන නැහැයි කියලා මේ පුහුණු කරන අයව අතරමං කරනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, එක දවසක් අවුරුදු තිහක් විතර පරණ L 200 කියන මම හිතන්නේ කැළි ගැල වුණු දිරච්ච වාහනයක් එවලා තිබුණා. එම වාහනේ දුම් සහතිකයවත් නැහැ. රජයේ වාහනවල දුම් සහතිකය ගන්නෙත් නැහැ. මේ වාහන වලින් පුහුණු කළොත් ඒ ළමයිනුත් පුරුදු වෙනවා, ඒ වාගේ කබල් වාහනවල ගිහිල්ලා මිනිස්සු හප්පලා දාන්න. ඒ නිසා මා ඉතාම ගෞරවයෙන් ඔබතුමා හරහා අමාත්‍යාංශයේත් අවධානය යොමු කරනවා. ගරු මහ ඇමැතිතුමාගේත් අවධානය යොමු කරනවා. විශේෂයෙන්ම බස්නාහිර පළාත් සභාව කියන්නේ වගකිවයුතු පළාත් සභාවක්. යම්කිසි වැඩ කටයුත්තක් කරද්දී, ඒක හරියට කරන්න ඕනැ. එහෙම නැතිව අපි මුදල් ටික වෙන් කරගෙන අමාත්‍යාංශයේ සල්ලි ටික අරගෙන, මේ මිනිස්සු අමාරුවේ දැම්මාම අන්තිමට ඒ තරුණ තරුණියන් හිතන්නේ, මේ අපේ අකාර්යක්ෂමතාවයක් නිසා තමයි මේ වැඩේ සිද්ධ වෙන්න නැත්තේ කියලා. මම සාමාන්‍යයෙන් වැඩ පහු කර කර ඉන්න කෙනෙක් නොවෙයි. අද ලියුම ආවොත් එවලේම උත්තරයක් ගහනවා, ඕනැම එහෙකට. එහෙම කරලා දුරකථන ඇමතුමකුත් දෙනවා. ඉතින් මේ අමාත්‍යවරයාගේ නොදන්න කමද? නොසැලකිලිමත් කමද? ඕනැකමෙන්ම කරනවාද කියලා මට තේරෙන්නේ නැහැ. ඒ අමාත්‍යාංශයට කරන්න බැරි නම්, මේ සල්ලි වෙන් කරපුවාම රියැදුරු පුහුණුව දෙන්න වාහන නැහැයි කියලා ප්‍රතික්ෂේප කරලා එවන්න ඕනැ. එහෙමනම් සල්ලිත් අරගෙන අවුරුද්දක් ගත වෙලා මම මේක ගැන ඉතා තදින් අවධානය යොමු කර සිටිනවා. එහෙම නැත්නම් පාරට බැහැලා අමාත්‍යාංශය ඉදිරිපිටට ඇවිල්ලා උද්ඝෝෂණය කරන්න තමයි සිද්ධ වන්නේ. මා මෙහිදී විශේෂයෙන් කියා සිටිනවා. මේ අපේ මුදල් වෙන් කරලා, අවුරුද්දක් ඇතුළත අපි අවසන් කරලා, පළාත් සභාව යම්කිසි දෙයක් කළා කියලා ජනතාවට දෙන්න අපි බලාපොරොත්තු වෙනවා. එහෙම නැත්නම් පළාත් සභාව සුදු අලි කියලා හැමදාම කියනවා. අපි මේ පළාත් සභාව සුදු අලි කරන්න කැමැති නැහැ. ඒ නිසා වහාම මේ ගැන පියවරක් ගන්නය කියලා ඔබතුමා මගින් මා ඉල්ලීමක් කරනවා.

**0071**

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sri Warnasinghe

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පසුගිය ජනවාරි 03 වැනිදා සංහිඳියාව උදෙසා ප්‍රව්චාරණ කාර්ය සාධක බලකායේ අවසන් වර්තාව භාර දෙනු ලැබුවා. මෙම කාර්ය සාධක බලකාය ස්ථාපිත කරනු ලැබුවේ 2016 වර්ෂයේ ජනවාරි මාසයේදී. මෙහි ප්‍රධාන සාමාජිකයන් එකොළොස් දෙනෙකුගෙන් සමන්විතයි. ඒ එකොළොස් දෙනා අතර අපි දන්නවා, 1972 ජනරජ ව්‍යවස්ථාව කෙටුම්පත් කිරීමට මූලික වෙලා කටයුතු කරපු ආචාර්ය කොල්වින් ආර් ද සිල්වා මැතිතුමාගේ දියණිය වන නීතිඥ මනෝරි මුත්තෙට්ටුවේගම මැතිනිය තමයි මෙහි සභාපතිත්වය හොබවන්නේ. ඒ වාගේම අපි දන්නවා, එතුමිය මේ රටේ රාජ්‍ය නොවන සංවිධානවල ප්‍රධාන ක්‍රියාකාරිනියක් විධියට කටයුතු කරනවා. ඒ වාගේම මේ කාර්ය සාධක බලකායේ ලේකම්වරයා විධියට කටයුතු කරන්නේ, සුප්‍රකට රාජ්‍ය නොවන සංවිධානයක් වන විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ ප්‍රධානී පාක්‍යසෝති සරවණමුත්තු මැතිතුමා. ඒ අනුව මේ එකළොස් දෙනෙකුගෙන් සමන්විත කාර්ය සාධක බලකාය විසින් කලාපීය වශයෙන් සාමාජිකයන් පහළොස් දෙනෙක් රට ඇතුළේ නම් කරලා තිබෙනවා. ඔවුන් විසින් ඒ පහළොස් දෙනා අතුරින් ඊළඟට යෝජනා කරලා තිබෙනවා, සිවිල් සමාජ සාමාජිකයින් 92 ක්. ඒ අය අතරින් තමයි මේ මහජන අදහස් ලබාගෙන තිබෙන්නේ.

අපි දන්නවා, මීට ප්‍රථම නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්පාදනය කිරීම සඳහා මහජන අදහස් ලබා ගැනීමට ලාල් විජේනායක මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් කොමිටියක් පත් කළා. ඒ පිළිබඳව පුවත්පත් දැන්වීම් මගින් ජනතාවට ප්‍රසිද්ධ කළා, මේ පිළිබඳව තමන්ගේ අදහස් පළ කරන්නය කියලා. නමුත් මේ සංහිඳියාව සඳහා වූ කාර්ය සාධක බලකාය ස්ථාපිත කිරීමත්, ඒ පිළිබඳව මහජන අදහස් ලබා ගැනීමත් පිළිබඳව කිසිම අවස්ථාවක අපට ප්‍රසිද්ධ පුවත්පත්වල කිසිදු දැන්වීමක් දැක ගන්න ලැබුණේ නැහැ. එහෙමනම් අපට පේනවා. මේක ඉතාම සැලසුම් සහගතව තෝරාගත්, ඉලක්ක ගත කණ්ඩායමකගෙන් පමණක් මේ මහජන අදහස් ලබාගෙන ඇති බව. මේ ඔවුන්ගේ වාර්තාවේ සඳහන් වන ආකාරයට ජනතාවගේ අදහස් ලබාගෙන තිබෙනවා. සාමාජිකයන් 7306 දෙනෙකුගෙන්. ඒ අතරින් 4872 ක් ප්‍රසිද්ධ රැස්වීම්වලදී ලබාගෙන තිබෙනවා. ඒ වාගේම ඉලක්ක කණ්ඩායම්

**0072**

1386 කගෙන් ඔවුන් අදහස් ලබාගෙන තිබෙනවා. 1848 දෙනෙකුගෙන් ලිඛිත අදහස් ලබාගෙන තිබෙනවා. ඒ අනුව තමයි මේ වාර්තාව සකස් කරලා තිබෙන්නේ. දැන් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ වාර්තාව භාර ගනු ලැබුවේ සංහිඳියාව පිළිබඳ කටයුතු භාරව කටයුතු කරන හිටපු ජනාධිපතිනිය චන්ද්‍රිකා කුමාරතුංග මැතිනියයි. එතුමිය තමයි මේ සංහිඳියා වාර්තාව භාර ගත්තේ. ඒ වාගේම විදේශ අමාත්‍ය මංගල සමරවීර මැතිතුමා, පුනරුත්ථාපන අමාත්‍ය ස්වාමිනාදන් මැතිතුමා, ඒ වාගේම ජාතික සමඟිය හා ප්‍රතිසංස්කරණ අමාත්‍ය එච්.එම්. ෆවුසි මැතිතුමා, ජනාධිපති ලේකම් පී.බී. අබේකෝන් මැතිතුමා, විදේශ ලේකම් ඇසළ වීරකෝන් මැතිතුමා, අග්‍රාමාත්‍ය ලේකම් සමන් ඒකනායක මහතා සහ සංහිඳියා කාර්යාලයේ ලේකම් මනෝ තිත්තවැල්ල යන අය තමයි මේ වාර්තාව පිළිගන්න ගිහිල්ලා තිබුණේ. නමුත් ගරු ජනාධිපතිතුමා මේ අවස්ථාවට සහභාගි වුණේ නැහැ. දැන් මේ සංහිඳියා වාර්තාවේ නිර්දේශ මොනවාද? මේ නිර්දේශවලින් ඉතා පැහැදිලියි, මේ රටේ සංහිඳියාව බිඳ වැටෙනවා කියන එක. මේ නිර්දේශ අතර පැහැදිලිව සඳහන් කරලා තිබෙනවා, යුධ ගැටුම්වලින් හානියට පත් වූවන් සඳහා පොදු සැමරුම් දිනයක් ප්‍රකාශයට පත් කරන්නය කියලා. යුධ ගැටුම් කියන්නේ මොකක්ද? මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදීව තේරී පත් වුණු රජයක නීත්‍යානුකූල හමුදාවක් සිටියා. ඒ රජය විසින් මේ රට දෙකඩ කරන්න උත්සාහ කරපු, ඒ බෙදුම්වාදී ත්‍රස්තවාදයට එරෙහිව යුධ මෙහෙයුමක් ක්‍රියාත්මක කළා. ඒක නීත්‍යානුකූලයි. ඒක මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු කිරීම සඳහා, නිදහස සාමය තහවුරු කිරීම සඳහා ගනු ලැබූ ක්‍රියා මාර්ගයක්. එහෙමනම් මෙතැනින් යෝජනා කරලා තිබෙනවා, යුධ ගැටුම්වලින් හානියට පත් වූවන් සඳහා පොදු සැමරුම් දිනයක් කියලා. යුධ ගැටුම්වලින් එල්.ටී.ටී.ඊ. ත්‍රස්තවාදීනුත් මිය ගියා. එහෙමනම් ඒ එල්.ටී.ටී.ඊ. ත්‍රස්තවාදීන් සහ ශ්‍රී ලංකා ආරක්ෂක හමුදාවේ දෙපිරිසම එකට අරගෙන පොදු සැමරුම් දිනයක් කරන්න කියලයි මේ යෝජනා කරලා තිබෙන්නේ. ඒක කිසිසේත් අපට පිළිගන්න පුළුවන්කමක් නැහැ.

ඊළඟට දෙවැනි නිර්දේශය මොකක්ද? තම ආදරණීයයන්ගේ මරණය හෝ අතුරුදහන් වීම් ස්මරණය කිරීමට, ඒ වෙනුවෙන් දුක් වීමට වින්දිතයන්ට ඇති අයිතිය රජය පිළිගත යුතුය.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපට ඕනෑම කෙනෙකුට තමන්ගේ අහිමි වුණු ආදරණීයන් වෙනුවෙන් දුක් වීමට අයිතියක් තිබෙනවා. නමුත් අපි දන්නවා, කොටි සංවිධානය සෑම වසරකම නොවැම්බර් 25 සහ 26 කියන දිනවල ඔවුන් මහා වීර දිනයක් සමරනවා. මේකද මේ කියන දුක් වීමට තිබෙන අයිතිය ආරක්ෂා කරන්න කියලා මේ යෝජනා කරන්නේ? තමන්ගේ ආදරණීයන් වෙනුවෙන් ඒ අය සමරන්න කියලා යෝජනා කරන්නේ මේ දිනය ද කියලා අපට ප්‍රශ්නයක් තිබෙනවා. මොකද, කිසිදු බාධාවකින් තොරව මෙවර ප්‍රසිද්ධියේ මේ දිනය සමරනු ලැබුවා. ඒ පිළිබඳව මේ වාර්තාව තුළින් තහවුරු කිරීමක් කරලා තිබෙනවා.

ඊළඟට තුන් වෙනුව යෝජනා කරලා තිබෙනවා, වින්දිතයන්ගේ සංවේදීතාවයන්ට ගරු කරමින් රජය විසින් සැමරුම් කටයුතු සිදු කළ යුතුයි කියලා.

මේ පොදු දින නියම කරන්නය කියලා මේ යෝජනා කරලා තිබෙන්නේ. ඊළඟට යුධ ගැටුම්වලින් මිය ගිය හෝ අතුරුදහන් වූවන් වැළලූ තැන්පත් කළ හෝ සංකේතාත්මකව මෙනෙහි කරන සියලු ස්ථානවලට ගරු කළ යුතුයි. මේ කියන්නේ කොටි සංවිධානයේ සොහොන් බිම්වලටත් ගරු කරන්නය කියලයි. ඔවුන්ගේ ස්මාරකවලට ගරු කරන්නය කියලා මේ යෝජනා කරලා තිබෙන්නේ. එවැනි වාර්තාවක් අපට කිසිසේත් පිළිගන්න බැහැ. රටේ සංහිඳියාව සම්පූර්ණයෙන් බිඳ දමන වාර්තාවක් මේ ඉදිරිපත් කරලා තිබෙන්නේ.

තුන් වෙනුව ඔවුන් කියනවා, දුක් වීමට හෝ කිසියම් වූ ආකාරයේ සංස්කෘතික හා ආගමික චාරිත්‍ර හෝ සැමරුම් කිරීම සඳහා තනි බිම් කොටස්වල හිමිකාරීත්වය ඔවුන්ගේ පවුල්වලට ලබා දිය යුතුයි කියලා.

ඒ කියන්නේ මොකක්ද? මේ එල්.ටී.ටී.ඊ. සංවිධානයේ මිය ගියපු සාමාජිකයන් වෙනුවෙන් තමන්ගේ ඉඩකඩම්වල සොහොන් කොත් ඉදි කරන්න අවස්ථාව ලබා දෙන්නය කියලයි, මේ පාක්‍ය සොත්ති සරවණමුත්තුත්, මනෝරි මුත්තෙට්ටුවගමත් මේ යෝජනා කරලා තිබෙන්නේ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඊට අමතරව මේ අය යෝජනා කරනවා. ඉන් පසුකාලීනව එම බිම්වල ගොඩනහා ඇති ඕනෑම ගොඩනැගිල්ලක් හෝ ජාතික මට්ටමේ ඉදි කිරීමක් ඉවත් කළ යුතු බවට යෝජනා කර තිබෙනවා. එහෙමනම් අලිමංකඩ අපේ හමුදා සෙබලු වෙනුවෙන් ඉදි කරලා තිබෙන ඒ ස්මාරකය ඉවත් කරන්නය කියලයි මේ කියන්නේ. කිළිනොච්චියේ, මුලතිව්වල, පූනරීන්වල අපේ හමුදාව දස දහස් ගණනින් මිය ගියා. ඒ අය ස්මරණය කරන්න ඉදි කරපු ඒ ස්මාරක ඉවත් කරන්න කියලයි, ජාතික මට්ටමින්ම ඉවත් කරන්නය කියලයි මේ යෝජනා කරලා තිබෙන්නේ. ඒ අනුව මේ පාර්ලිමේන්තුව ඉදිරිපිට තිබෙන ස්මාරකයත් මේ යෝජනාව අනුව අපට ඉවත් කරන්නයි සිද්ධ වන්නේ.

ඒ වාගේම මේකේ බරපතළම නිර්දේශය තමයි, යුධ අපරාධ සහ මනුෂ්‍යත්වයට එරෙහි අපරාධ ඇතුළු ජාත්‍යන්තර අපරාධ විභාග කිරීමට හැකිවන පරිදි විශේෂ අධිකරණයක් පිහිටු විය යුතුයි.

ඒ කියන්නේ මිශ්‍ර අධිකරණයක් පිහිටු වන්න කියලයි මේ යෝජනා කරන්නේ. හයිබ්‍රිඩ් අධිකරණයක් තමයි මේ යෝජනා කරලා තිබෙන්නේ. එහෙමනම් ජනාධිපතිතුමාගේ ප්‍රතිපත්තියට, ස්ථාවරයට සම්පූර්ණයෙන්ම පටහැනි යෝජනාවක් තමයි මේ කාර්ය සාධක බලකාය විසින් ඉදිරිපත් කරලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඊළඟට ඔවුන් යෝජනා කරනවා විනිශ්චයකාරවරුන්ගේ සිට විශේෂ උපදේශක කාර්යාලය දක්වා සක්‍රීය ජාත්‍යන්තර සහභාගීත්වයක් ලබා ගත යුතුයි කියලා. එහෙමනම් මේ රට ඇතුළේ සිදු වුණාය කියන යුධ අපරාධ පිළිබඳ සොයා බලන්න මේ කට්ටිය යෝජනා කරන්නේ මොකක්ද? ජාත්‍යන්තර සහභාගීත්වය යෝජනා කරලා තිබෙනවා. ඒ වාගේම ඊළඟට ඔවුන් කියනවා, ජාත්‍යන්තර විනිශ්චයකරුවන් තේරීම, සිවිල් සංවිධාන විමසීමෙන් පසු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් කළ යුතු අතර, ඔවුන් පත් කරන්නේ ජනාධිපතිවරයා විසින් කියලා. මෙවැනි යෝජනාවක් කරන්න කිසිදු අයිතියක් ඔවුන්ට නැහැ. ජනාධිපතිතුමා පුන පුනා තමන්ගේ ස්ථාවරය ප්‍රකාශ කරලා තිබෙනවා. යුධ අපරාධ සම්බන්ධයෙන් ජාත්‍යන්තර විනිශ්චයකරුවන්ට රට ඇතුළට එන්න දෙන්නේ නැහැ. ඒ විතරක් නොවෙයි. මිශ්‍ර අධිකරණයක් රට තුළ ස්ථාපිත කරන්න දෙන්නේ නැහැ. ඒක රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනියි කියලා ඉතා පැහැදිලිව කියලා තිබෙනවා.

[ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ]

එහෙමනම් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඊළඟට ඔවුන් යෝජනා කරනවා ජාත්‍යන්තර පත් කිරීම් සඳහා එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමසාරිස් කාර්යාලයෙන් විමසිය යුතුයි කියලා. අපට මේ ඔක්කොම කරන්න වෙලා තිබෙන්නේ - රටේ අධිකරණයේ ස්වාධීනත්වය නැති වෙනවා. අධිකරණයේ සෛවරීත්වය නැති වෙනවා. එහෙමනම් මේ යෝජනා කරන්නේ එක්සත් ජාතීන්ගේ කාර්යාලය හරහා මේ සියල්ල කළ යුතුයි කියලා. ඔවුන් හරහා තමයි මේ සියල්ල අපට කරන්න සිද්ධ වෙලා තිබෙන්නේ. ඒ නිසා මේ යෝජනාව තුළ පැහැදිලිව අපට දැක ගන්න ලැබෙනවා. සෑම යුධ අපරාධ පිළිබඳ නඩු විභාගයකදීම විදේශීය විනිශ්චයකරුවෙකු සිටිය යුතු බව නිර්දේශ කළ යුතුයි කියලා. එහෙමනම් යුධ අපරාධ විනිශ්චය කරන සෑම නඩු විභාගයකටම ජාත්‍යන්තර විනිශ්චයකරුවෙක් රට තුළට ගෙනෙන්න කියලා මේ සංහිදියා කාර්ය සාධක බලකාය යෝජනා කරලා තිබෙනවා. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි මේ යෝජනා දෙස බැලීමෙන් පැහැදිලි වන්නේ, මේ රටේ සංහිදියාව බිඳ දැමීම සඳහා විතරක් නොවෙයි. යුධ අපරාධ පිළිබඳ මේ පරීක්ෂණයට අවශ්‍ය කරන රට ඇතුළෙන්ම මතවාදයක් ගොඩනගලා තිබෙනවා. මේක රට විනාශ කිරීම සඳහා රටේ ජාතික සමගිය සංහිදියාව විනාශ කිරීම සඳහා ගෙනෙන ලද යෝජනාවලියක්. මේ යෝජනාවලිය කුණු කූඩෙට දාන්න ඕනැය කියන එකයි කියන්නේ. මේක භාරගත්තු සියලු දෙනා මේ රටේ ජාති ද්‍රෝහීන්, දේශ ද්‍රෝහීන් කියලයි අපි දකින්නේ. මේ රටේ ජාතික සමගිය, සංහිදියාව බිඳ දමන මේ වාර්තාව කුණු බක්කියට විසි කරන්නයි අපි යෝජනා කරන්නේ. බොහොම ස්තුතියි.

# පළාත් සභාවේ කටයුතු
PROVINCIAL COUNCIL AFFAIRS

**ගරු ලලිත් වනිගරත්න** - අමාත්‍යතුමා [ගරු සභා කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන්]
Hon. Lalith Wanigaratna - Minister [On Behalf of Minister of Council Affairs]

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, *"අද දින පොදු කටයුතු ප්‍රමුඛතාවය ගත යුතුය"* යන යෝජනාව ඉදිරිපත් කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

# බස්නාහිර පළාතේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයන්ටඅදාළ සංශෝධිත අතුරු ව්‍යවස්ථාව :

**ගරු ඉසුර දේවප්‍රිය** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, *"1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වන වගන්තියේ 1 වන උප වගන්තිය යටතේ බස්නාහිර පළාතේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා වශයෙන් සාදනු ලැබ,*

*ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1976/21 හා 2016.07.20 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද පහත සඳහන් කෙටුම්පත් සංශෝධිත අතුරු ව්‍යවස්ථා, එනම්, හඳුන්වනු ලබන නමින් ඒ කවරේද යත්,*

i. *ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සැරසිලි විධිමත් කිරීම පිළිබඳ ,වස්ථාවඅතුරු ව්‍ය (සංශෝධිත)*

ii. *ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මාළු විකිණීම පිළිබඳ අතුරු (සංශෝධිත)ව්‍යවස්ථාව,*

iii. *ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ හෝටල් හා ලැගුම්හල් පිළිබඳ ,වස්ථාවඅතුරු ව්‍ය (සංශෝධිත)*

iv. *ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මස් විකිණීම පිළිබඳ ,වස්ථාවඅතුරු ව්‍ය (සංශෝධිත)*

v. *ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පීඩාකාරී ,පාරව්‍යා පාර හාඅන්තරායදායක ව්‍යාපීඩාකාරී හා අන්තරාදායක ව්‍යාපාර පිළිබඳ අතුරු (සංශෝධිත) ,වස්ථාවව්‍ය*

*vi. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථාන පිළිබඳ අතුරු (සංශෝධිත) ,ව්‍යවස්ථාව*

*vii. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ක්‍රීඩා භූමි පිළිබඳ ,ව්‍යවස්ථාඅතුරු (සංශෝධිත)*

*viii. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ සංචාරක වෙළඳාම පිළිබඳ ,ව්‍යවස්ථාඅතුරු (සංශෝධිත)*

*ix. ප්‍රාදේශීය සභා මාර්ගයන්හි බර සහ වේග සීමා පිළිබඳ ,ව්‍යවස්ථාඅතුරු (සංශෝධිත)*

*x. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ භෝජන ශාලා පිළිබඳ ,ව්‍යවස්ථාඅතුරු (සංශෝධිත)*

*xi. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ත්‍රීරෝද රථ නවතා තැබීම පිළිබඳ අතුරු (සංශෝධිත) ,ව්‍යවස්ථාව*

*xii. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ බේකරි පිළිබඳ ,ව්‍යවස්ථාඅතුරු (සංශෝධිත)*

*xiii. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ප්‍රචාරක දැන්වීම් පිළිබඳ ,ව්‍යවස්ථාඅතුරු (සංශෝධිත)*

*xiv. ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ආදාහනාගාර පිළිබඳ ව්‍යවස්ථාඅතුරු (සංශෝධිත) හා,*

*xv. ප්‍රාදේශීය සභා සේවාවන් සඳහා ගාස්තු අය කිරීම පිළිබඳ ,ව්‍යවස්ථාඅතුරු (සංශෝධිත)*

*යන කෙටුම්පත් සංශෝධිත අතුරු ව්‍යවස්ථාවන් ඉහත කී 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වන වගන්තියේ (3) වන උප වගන්තිය යටතේ අනුමත කළ යුතු යැයි මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව යෝජනා කරයි යන යෝජනාව කරමින්ම පෙර කී කෙටුම්පත සංශෝධිත අතුරු ව්‍යවස්ථාවන් මෙම පළාත් සභාවට ඉදිරිපත් කරනවා."*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඒ සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය?

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, සභාවේ එකඟතාවය තිබෙනවා. මේ සම්බන්ධයෙන් අපි ගරු ප්‍රධාන අමාත්‍යතුමාගෙන් දැනගන්න කැමැතියි. මෙය ප්‍රඥප්ති හා නීති කාරක සභාවට යනවාද? නැත්නම් මේක මෙතැනින්ම සම්මත වෙලා ඒ අවශ්‍ය කටයුතු වලට යනවාද? ක්‍රියාදාමය මොකක්ද කියලා දැනගන්න කැමැතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

අවශ්‍ය නම් -

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ප්‍රඥප්ති හා නීති කාරක සභාවට යන්න ඕනෑ නැහැ නේ? ගරු සංවිධායකතුමා නීති කාරක සභාවට යන්න අවශ්‍ය වන්නේ නැහැ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

එහෙමනම් සභාවේ එකඟතාවය අනුව ගැසට් පත්‍රයේ තිබෙන ඒ කාරණා සියල්ල සභා සම්මත වූ බව දැනුම් දෙනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

# පෞද්ගලික මන්ත්‍රී යෝජනා
# PRIVATE MEMBERS MOTIONS

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මගේ යෝජනා දෙකක්ම න්‍යාය පත්‍රයේ තිබෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ යෝජනා දෙකම සමපාත වන යෝජනා. ඒක නිසා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, සභාවේ කටයුතු විධිමත්

[ගරු සුනිල් වටගල]

කිරීම සඳහා මේ යෝජනා දෙකම එක යෝජනාවක් සේ සලකලා විවාද කරමුයි කියලා. මොකද, අනික් මන්ත්‍රීවරුන්ගේ යෝජනා න්‍යාය පත්‍රයට ඒමට අවස්ථාවක් වෙනවා ඒක. එම නිසා යෝජනා දෙකම මම මේ අවස්ථාවේ ඉදිරිපත් කරනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පෞද්ගලික මන්ත්‍රී යෝජනාව 01 මෙසේය,

*"සුදුසු නිවාසයක වාසය කිරීම ජනතාවගේ මානව අයිතිවාසිකම් ලෙසට ජාත්‍යන්තර විශ්ව ප්‍රකාශනවල පවා පිළිගෙන ඇත. ජාත්‍යන්තර නීතියට අනුව ශ්‍රී ලංකාව දෙස බැලීමේදී සුදුසු නිවාසයක් තබා ජීවත්වීමට සරිලන අවම පහසුකම්වත් නොමැති නිවාස, ජනතාවට ලබා දී ඇති බව බැලූ බැල්මට පෙනෙන කාරණයකි. එසේ නිවාස ලබා දී ඇත්තේ ඇතැම් අවස්ථාවලදී ඔවුන් ජීවත් වූ ස්ථිර භූමිභාග රජයට අත්පත් කර ගැනීමෙන් අනතුරුවය. එසේ අත්පත් කර ගැනීමේදී කිසිදු ආකාරයක වන්දි මුදලක් එම ස්ථානවලින් ඉවත් කළ ජනතාවට ලැබී නොමැත. ඔවුන්ට ලැබී ඇත්තේ කුලී නිවාස පදනම මත තට්ටු නිවාසය. ඒවායෙහි ජීවත් වීමට අවම පහසුකම් පවා නොමැති බව කිව යුතුය.*

*එසේ හෙයින් ඔවුන්ගෙන් ලබා ගත් භූමි භාගයන් සඳහා වන්දි මුදල් නොගෙවා ඇත්නම් සහ තට්ටු නිවාසනවලින් නිවාස ලැබී ඇත්නම් ඒවායෙහි අය කරන කුලිය කපා හැරීමට කටයුතු කරන මෙන්ද ඉදිරියේදී අඩු තරමින් වර්ග අඩි 750 ක පමණ නිවසක්වත් ජනතාවට ලබා දීමට කටයුතු කරන මෙන් ද මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව රජයෙන් ඉල්ලා සිටියි."*

ඒ වාගේම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පෞද්ගලික මන්ත්‍රී යෝජනාව 02 මෙසේය,

*"පසුගිය ආණ්ඩු සමයේ නාගරික සංවර්ධන අධිකාරිය හරහා නාගරික සංවර්ධනයට ඉඩම් අත්පත් කර ගැනීමේදී අදාළ ඉඩම්වල පදිංචිව සිටි තැනැත්තන් හට බොහෝ අවස්ථාවල වන්දි ප්‍රදානයකින් තොරව බලහත්කාරී ලෙස ඉඩම් අත්පත් කර ගැනීම් සිදු විය.*

*වත්මන් ආණ්ඩුව යටතේ ද එකී නරක පූර්වාදර්ශය ඉදිරියට යමින් කොළඹ මහ නගර සභාව ආශ්‍රිත වතු ඉඩම් රාශියක මෙන්ම පොදුවේ බස්නාහිර පළාත තුළම ඉඩම් අත්පත් කර ගැනීම් වන්දි ප්‍රදානයකින් තොරව සිදු වන බවට ජනතාවගෙන් මැසිවිලි නැගෙන අතර ඉහත තත්ත්වය ඉඩම් අත්පත් කර ගැනීමේ අණපනත් අමු අමුවේ උල්ලංඝණය වීමක් වන අතරම ඉතා නරක පූර්වාදර්ශයක්ද වනු ඇත. එබැවින් වන්දි ප්‍රදානයකින් තොරව නාගරික සංවර්ධනයට ඉඩම් අත්පත් කර ගැනීම නොකළ යුතු යැයි මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව රජය වෙත යෝජනා කරයි."*

**ගරු සරත් පතිරණ**
Hon. Sarath Pathirana

*[විසින් (යෝජනා දෙකම) ස්ථිර කරන ලදී.]*
*[Seconded]*

[පූ.භා. 11.03]

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, එම යෝජනාවලින් මම පළමුවැනි යෝජනාවෙන් කියන්නේ,

*"සුදුසු නිවාසයක වාසය කිරීම ජනතාවගේ මානව අයිතිවාසිකම් ලෙසට ජාත්‍යන්තර විශ්ව ප්‍රකාශනවල පවා පිළිගෙන ඇත. ජාත්‍යන්තර නීතියට අනුව ශ්‍රී ලංකාව දෙස බැලීමේදී සුදුසු නිවාසයක් තබා ජීවත්වීමට සරිලන අවම පහසුකම්වත් නොමැති නිවාස, ජනතාවට ලබා දී ඇති බව බැලූ බැල්මට පෙනෙන කාරණයකි. එසේ නිවාස ලබා දී ඇත්තේ, ඇතැම් අවස්ථාවලදී ඔවුන් ජීවත් වූ ස්ථිර භූමිභාග රජයට අත්පත් කර ගැනීමෙන් අනතුරුවය. එසේ අත්පත් කර ගැනීමේදී කිසිදු ආකාරයක වන්දි මුදලක් එම ස්ථානවලින් ඉවත් කළ ජනතාවට ලැබී නොමැත. ඔවුන්ට ලැබී ඇත්තේ කුලී නිවාස පදනම මත තට්ටු නිවාසය.*

ඒක තමයි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පළමුවැනි යෝජනාවේ හරය. පළමුවැනි යෝජනාවේ හරය වෙන්නේ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඇත්තටම ඔවුන් සතුව ස්ථිර භූමියක් තිබෙනවා. ඒ භූමිය වෙනුවට ඔවුන්ට ලබා දීලා තිබෙන්නේ, කුළී නිවාසයක්ය කියන පදනම.

දෙවැනි යෝජනාවෙන් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි කියන්නේ, නාගරික සංවර්ධන අධිකාරිය හරහා ඉඩම්

අත්පත් කර ගන්න කොට ඒක පසුගිය ආණ්ඩුව ඉතා බලහත්කාරී ලෙස සිද්ධ වුණා. නැවතත් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ ආණ්ඩුවෙන් ද බස්නාහිර මහ නගර සහා අමාත්‍යාංශය යටතේත් ඒ වාගේම ඉඩම් අත්පත් කර ගැනීමක් තමයි මේ වතු ආශ්‍රිතව සිද්ධ වන්නේ. මේක නරක පූර්වාදර්ශයක් වෙනවා. එහෙම වුණොතින් එහෙම අපි පසුගිය රජයේ පැවැති අඩුපාඩුකම් එහෙම්ම කර පින්නා ගැනීමක් වෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒකයි මගේ ස්ථාවරය.

මම මේ යෝජනාවේදී විශේෂයෙන්ම අවධානයට ලක් කළේ, බොරැල්ල ආසනයේ වනාත මුල්ල ප්‍රදේශයේ 49 වත්ත කියලා වත්තක් තිබෙනවා. මම තමුන්නාන්සේට යෝජනා කරනවා. මේ සම්බන්ධයෙන් විශේෂ පරීක්ෂණ කමිටුවක් නම් කරන්න. මම ඒ මිනිස්සුන්ගේ ඇත්ත ඔප්පු තිරප්පු ටික ඒ කමිටුවට ඉදිරිපත් කරන්නම්. ඇත්තටම ඒ මිනිස්සුන්ට ස්ථිර ඔප්පු තිබෙනවා. පසුගිය ආණ්ඩුව කාලයේ ඉතා බලහත්කාරී ලෙස ඔවුන්ව පළවා හැරියා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඔවුන්ව පළවා හැරලා තට්ටු නිවාසයකට දැම්මා. දැන් තමුන්නාන්සේ දන්නවාද බොරැල්ල ආසනයේ පර්චසයක මිල කීයද? කියලා. ඔය වනාතමුල්ල පැත්තේ තිබෙන පර්චසයක මිල රුපියල් ලක්ෂ 50 ට වැඩියි. එතකොට ජාතික නිවාස කොමසාරිස්වරයා විසින් ලබා දීලා තිබුණු ඔප්පු, පර්චස් 3 ½ , පර්චස් 05, පර්චස් 06 යන වශයෙන් යම් යම් වතුවලට අදාළව ඔප්පු ලබා දීලා තිබුණා. ඒවායේ මුලින් සඳහන් වන්නේ, සින්නක්කර ඔප්පුව කියලා. සින්නක්කර ඔප්පු වශයෙන් සලකුණු කරලා ඒ ඒ පුද්ගලයන්ට ලබා දීලා තිබුණා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කියන්න කනගාටුයි. පසුගිය ආණ්ඩුව කාලයේ හමුදාවෙන් එනවා. හැන්දෑවට කියනවා. දවස් දෙකයි දෙන්නේ. මේ නිවාසවලින් යන්න කියනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි දැනගත්තා ඒ රාජපක්ෂ යුගයේ අවසාන කාර්තුව තුළ ජනතාවට ඇති වුණු පීඩනය. එතකොට ඒ පීඩනයත් එක්ක ජනතාවගේ ජීවිතය ආරක්ෂා කර ගැනීම සඳහා ඔවුන් අර කියන දේවල්වලට අනුගත වුණා. මගේ තර්කය ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඉඩමකින් කිසියම් පුද්ගලයෙක් ඉවත් කරනවා නම් ඒ පුද්ගලයාට යම්කිසි වන්දි ප්‍රදානයක් කරන්න ඕනෑ. ඒක නාගරික සංවර්ධන අධිකාරී පනත, ඉඩම් අත්පත් කර ගැනීමේ ආඥා පනත ඇතුළු - ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඉඩම් අත්පත් කර ගැනීමේ අඥා පනතට අදාළව තව පනත් හතරක් තිබෙනවා. ඒ පනත් ආශ්‍රයෙන් ඒ අදාළ පුද්ගලයන්ගේ වන්දිය තීරණය කරලා තමයි ඔවුන්ව ඒ භූමි වලින් ඉවත් කරන්න පුළුවන් වන්නේ. ඒ භූමි ලබා ගන්නේ ඇයි? ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ලබා ගන්න පුළුවන්. ඉඩම් අත්පත් කර ගැනීමේ ආඥා පනත යටතේ ඒ අදාළ භූමි භාගයන් ලබා ගන්න පුළුවන් වන්නේ පොදු කටයුත්තකට පමණයි. ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු තීන්දුවක් තිබෙනවා. ඒ ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු තීන්දුවට අනුව, මාක්ස් ප්‍රනාන්දු විනිශ්චයකාරතුමා දීලා තිබෙනවා. පෞද්ගලික ඉඩමක් පොදු කටයුත්තකට ලබා ගත්තාට පස්සේ, අවුරුද්දක් ඇතුළත ඒ අදාළ පොදු කටයුත්තට යොදා ගත්තේ නැත්නම් ශ්‍රේෂ්ඨාධිකරණයෙන් කියනවා, ඒ ඉඩම ඒ තැනැත්තාට ආපසු දිය යුතුයි කියලා. ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු තීන්දුවක් තිබෙනවා.

හැබැයි, එහෙම නඩු තීන්දුවක් තිබියදී - තමුන්නාන්සේ බලන්න. අද කොළඹ නගර සහා සීමාව තුළ බස්නාහිර පළාත් සභාවේ ඇතැම් ස්ථානවල සිද්ධ වන ක්‍රියා. 1988 තමයි කොල්ලුපිටියේ මං හන්දියේ **NSB** බැංකුවට මෙහා පැත්තේ ඉඩම පවරාගෙන තිබෙන්නේ. පසුගිය ආණ්ඩුවෙනුත් ගන්න **Try** කළා. දැන් නාගරික සංවර්ධන අධිකාරියෙන් ඇවිල්ලා කියනවා, 1984 පවරාගෙන තිබෙන්නේ කියලා. ඉඩම 1984 පවරාගෙන තිබෙන්නේ නාගරික සංවර්ධන අධිකාරියෙන්. අදාළ පැමිණිල්ල අපි ගිහින් මානව හිමිකම් කොමිෂන් සභාවේ දැම්මා. ඒ පැමිණිලිවලදී අපි ඉදිරිපත් කළා, මෙන්න නඩු තීන්දුව. ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු තීන්දුවක් තිබෙනවා. වසරක් ඇතුළත මේවා පාවිච්චි කළේ නැත්නම් ඒක ඒ තැනැත්තාට ආපසු දෙන්නය කියලා. හැබැයි එහෙම තිබෙද්දීත්, අද වේළුපිල්ලේ වත්තේ කරන වැඩේ බලන්න. කොම්පඤ්ඤ වීදියේ රීගල් සිනමා ශාලාවට මෙහා පැත්තේ තිබෙන වත්ත. ඒ අයගේ, තමුන්නාන්සේ හිතන්න, මරදානේ මෙහා පැත්තේ කොම්පඤ්ඤ වීදිය අයිනේ පර්චස් එකක මිල කීයද කියලා. පර්චසයක මිල රුපියල් ලක්ෂ 150 ක් වෙනවා. එතකොට පර්චස් එකක් ලක්ෂ 150 ක් වෙනවා. හැබැයි, ඔවුන්ට නාගරික සංවර්ධන අධිකාරියෙන් ලියුම් එවලා තිබෙනවා. මහ නගර සහා අමාත්‍යාංශය යටතේ අන්න යන්න කුකුල් කූඩුවට. කුකුල් කූඩු. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අර දීලා තිබෙන ගෙවල්, ගෙවල් නොවෙයි. මේ මගේ යෝජනාවේ තිබෙන්නේ, අඩුම තරමින් -

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon . O. W. Prasanna Sanjeeva

ඔබතුමා ගිහිල්ලා බැලුවාද?

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ගිහිල්ලා බැලුවා. ජීවත් වෙලා සිටියා.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon . O. W. Prasanna Sanjeeva

වර්ග ප්‍රමාණය කොච්චරද?

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

වර්ග ප්‍රමාණය වර්ග අඩි 433 යි තිබෙන්නේ.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

තමුන්නාන්සේ ගිහින් බලන්න කෝ. රෙදි හෝදන්නේ -

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

තමුන්නාන්සේ හැන්දෑවේ හයට ගියොත් වනාතමුල්ලට. ඔය කියන සිරිසර උයනට. ඒක ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මිහිපිට අපායක්. ඉන්න බැහැ. ඒ මිනිස්සුන්ට අදාළ සංස්කෘතිය පුරුදු කරලත් නැහැ. ඒ ලිෆ්ට් එක කඩාගෙන ඒකේ ජරා කරනවා. බූලත් කෙළ ගහනවා. ඒක මිනිස්සුන්ගේ වරද වෙන්න පුළුවන්. හැබැයි, ඒවාට ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මිනිස්සුන්ට දොස් කියලා වැඩක් නැහැ. ඒ නිවාසවලට යනකොට තිබෙන්නේ මිනිස්සුන්ට වෛරයක්. ඒ මිනිස්සුන්ට ඉන්න බැහැ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, හවස හය වන කොට සම්පූර්ණ රස්නයක් දැනෙනවා. ඒ ගෙවල්වල ඉන්න බැහැ. වහල් මඩම් ඒවා. කුකුල් කූඩු. ඌරු කොටු. ඒවාට තමයි මේ ගාල් කළේ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මගේ විවේචනය එකකට යටත්. අපි දන්නවා. රටක් සංවර්ධනය වන කොට ඒ සංවර්ධන මාවතට අවතීර්ණ වෙද්දී තනි මහල් නිවාස තියාගන්න බැහැ. ඒක අමාරුයි. ඒක තමයි යථාර්ථය. අද දියුණු රටවල මහල් නිවාස පද්ධතිවලට ගිහිල්ලා තිබෙනවා. මහල් නිවාසයකට යන්න වෙනවා. අකැමැත්තෙන් වුණත් යන්න වෙනවා. හැබැයි,



ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ මිනිස්සු, මිනිස්සු විධියට සලකන්න ඕනෑ. අද එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිවල නිවාසයක වර්ග අඩි ප්‍රමාණය පිළිගෙන තිබෙනවා. අඩුම තරමින් වර්ග අඩි 750 ක්වත් තිබෙන්න ඕනෑය කියලා. එතකොට අර මයුර ප්ලේස් එකේ ගෙවල් ටිකේ අන්න අඩුම තරමින් වර්ග අඩි 650 යේ ගෙවල් තිබෙනවා. හැබැයි -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

එක පවුලකට නොවෙයි. පවුල් දෙක තුනක් එකට ඉන්නේ.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ බොරුල්ල ආසනයේ ඉන්න මිනිස්සු, එහෙම නැත්නම් උතුරු කොළඹ ඉන්න මිනිස්සු turn එකට තමයි නිදා ගන්නේ. තමන්ගේ අනික් සහචරයා නිදාගෙන ඉවර වෙන තුරු පාරේ ඕමිබි ගහනවා. ශරීර කෘත්‍ය කරන්න ඉතාම අඩු භූමි ප්‍රමාණයක් තිබෙන්නේ. ඔය කියන සිරිසර උයනේ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මහත කාන්තාවකට ගිහිල්ලා ටොයිලට් එකේ වාඩි වුණාම ටොයිලට් එකෙන් ඇදලා ගන්න තව කෙනෙක් ඉන්න ඕනෑ. ඒ තරම් පොඩි මේ වැසිකිළි.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon . O. W. Prasanna Sanjeeva

ගිහිල්ලා බැලුවාද?

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

අයියෝ ගිහිල්ලා බැලුවා. අපි ඒවායේ ජීවත් වෙලත් තිබෙනවා. තේරුණාද? ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ දීලා තිබෙන නිවාසවල වර්ග අඩි 450 ක් නැහැ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම කියන්නේ පර්චසය රුපියල් ලක්ෂ 150 කට අධික මිලක් වන මේ ඉඩම්වල ජීවත් වූ අය ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අවුරුදු 20 ක කුළියකට මේ මිනිස්සුන්ව පිටත් කරනවා. ඒක කුළී පදනමක්. ඔවුන්ට ඔප්පුවක් ලැබෙන්නේ නැහැ. ඔවුන්ට ඔප්පුවක් ලැබෙන්නේ අවුරුදු 20 කට පස්සේ. අන්න සිරිසර උයන, මහ ලොකු නම්වලින් තිබෙනවා. අහවල් උයන,

මේ උයන කියලා. බිත්ති පුපුරලා. කොන්ත්‍රාත්කරුවෝ කවුද? ලිෆ්ට් එක කැඩිලා. මේකට වග කියන්නේ කවුද? ඒ මිනිස්සුන්ගේ ඉඩමත් ගත්තා. ඒ මිනිස්සුන්ව බලහත්කාරයෙන් අර ගෙදරට තල්ලු කළා. තල්ලු කළාට පස්සේ අද ඒකේ ප්‍රමිතියක් නැහැ. අවුරුදු 20 ක් නොවෙයි. අවුරුදු 05 ක් යන කොට මේ ගොඩනැගිලි කඩාගෙන වැටෙනවා. අන්ත අසරණ මිනිස්සු. වෙන්නේ මොකක්ද? අවුරුදු 50 යි, 60 යි. පරම්පරාවෙන් පරම්පරාවට ජීවත් වුණු මිනිස්සු. මේ මිනිස්සු කොහේ යන්නද? ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අන්න බේකරි වත්තේ ඉඩම තිබෙනවා. බේකරි වත්තටත් ඕකයි. 46 වත්තටත් ඕකයි. 49 වත්ත බොරැල්ල ආසනයේ මේ සංසිද්ධිය තිබෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, තවත් එක ප්‍රශ්නයක් තිබෙනවා. ඒ ප්‍රශ්නය තමයි, අපි ඇහුවා. දැන් තමුන්නාන්සේට අවධානය යොමු කරන්න පුළුවන් නම් නාරාහේන්පිට බෝ ගහ යට ළඟ තිබෙන ඉඩම. ඒ ඉඩම අත්පත් කරගෙන ඒ මිනිස්සුන්ව සිරිසර උයනට යැව්වා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ ඉඩම අන්න තවම තිබෙනවා. වාසනාවකට තිබෙනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඒකට කෙළින්න බැරි වුණා, ඒ කියන්නේ.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ඒ ඉඩමට කෙළින්න හැදුවා. ඒ ඉඩමට (බාධා කිරීම්) අයිලන්ඩ් පත්තරේ -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමා කථාව අවසන් කරන්න.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

දැන් මේ ගත්තු ඉඩම් ටිකට කරන්නේ මොකක්ද? නාගරික සංවර්ධන අධිකාරියෙන් විකුණන්න හදනවා. දැන් අර නාරාහේන්පිට ඉඩම විකුණන්න පත්තරේ දැන්වීමක් දැම්මා. අපි අහනවා, එතකොට පෞද්ගලික ඉඩම අත්පත් කර ගන්නේ පොදු කටයුත්තකට කියලා. හැබැයි, පොදු කටයුත්තකට කියලා අත්පත් කරගත්තු ඉඩම නාගරික සංවර්ධන අධිකාරියට සල්ලි නැහැයි කියලා අනූ නව අවුරුදු බද්දට චීනයට නැත්නම් ඉන්දියාවට දෙනවා. අන්න බලන්න කෝ. කොම්පඤ්ඤ වීදියේ එහා පැත්තේ ඉඩම් ටික මුල්ම කාලයේ ගත්තු ඉඩම් අද ඉන්දියන් හෝටල් දාලා. මොන පොදු කටයුත්තක්ද? මේ මිනිස්සුන්ගෙන් ගන්න ඉඩමේ කියනවා, රෝහල හදනවා. ඉස්කෝලේ හදනවා. Play Ground එක හදනවා කියලා. එහෙම අරගෙන අන්තිමට නාගරික සංවර්ධන අධිකාරිය කරන්නේ මොකක්ද? ඒ මිනිස්සුන්ගේ ඉඩම් ටික. ඉන්දියානු, චීන කොම්පැණිවලට උකස් කරනවා. එහෙම නැත්නම් අනූ නව අවුරුදු බද්දට දෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේක trend එකක් විධියට යනවා. දැන් අර කාසල් රෝහල ඉස්සරහා තිබෙන ඉඩම බලන්න කෝ. ඒ ඉඩමේ මම හිතන්නේ පවුල් පන්සියය ගණනක් විතර ජීවත් වුණු ඉඩමක්. අදටත් ඒ ඉඩම වාසනාවට තිබෙනවා. හැබැයි අපි කියනවා, නාගරික සංවර්ධන අධිකාරිය මේ ඉඩම් ලබා ගත්තේ පොදු කටයුත්තක් කරන්න කියලා. හැබැයි, පොදු කටයුත්තක් කරන්න කියලා ගත්තට අපි දැක්කා. ඩේලි මිලර් පත්තරේ, ඩේලි නිව්ස් පත්තරේ දැන්වීම් දාලා තිබෙනවා, ඒ ඉඩමට එන ආයෝජකයෙක් ඉන්නවා නම් එන්න කියලා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කරුණාකරලා මේක මහා විකාර තත්ත්වයක්. අවුරුදු පනහ හැට පදිංචිව සිටි මිනිස්සුන්ට, පරම්පරාගතව දශක ගණනාවක් පදිංචි මිනිස්සුන්ට තමන්ගේ ඉඩම් ටිකට මේ විධියට නම් කරන්නේ, මේක ඉතාමත් අවාසනාවන්ත තත්ත්වයක්. එතකොට ඉඩම් ටික අරගන්නවා නම් විතරක් කමක් නැහැ. පොදු කටයුත්තකට, ඕනෑම මාර්ග සංවර්ධනයකට අපි අපේ ඉඩම් දෙන්න ඉඩම් ආඥා පනත්වලින් බැඳිලා ඉන්නවා. හැබැයි ඉඩම් ආඥා පනත්වලින් බැඳිලා හිටියාට, ඒකේ ජීවත්වන මිනිහාට සාධාරණයක් වෙන්න ඕනෑ. අපි දන්නවා, සමහර ඉඩම්වලට අදාළ වන්දි මුදල් තවමත් එක එක ගිණුම්වල තිබෙනවා. ඒවාට හොර පත්ඉරු හදලා වන්දි ලබා ගත්තු අවස්ථාවල් තිබෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේක ඉතාමත්ම අවාසනාවන්ත තත්ත්වයක්. මේක නතර විය යුතුයි. මේක නතර කරන්න ඕනෑ. මේ අහිංසක මිනිස්සුන්ගේ ඉඩම් ටික අරගෙන නාගරික සංවර්ධන අධිකාරිය මේ විධියට නම්

[ගරු සුනිල් වටගල]

හැසිරෙන්නේ, ඉතාමත් නරක තත්ත්වයක්. ඒක නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි මම කියන්නේ, තමුන්නාන්සේ මේ පළාත් සභාවේ කමිටුවක් පත් කරලා, ඇත්ත වශයෙන්ම නිවාස කොමසාරිස්වරියට මම හිතන්නේ මහ ලොකු වැඩකුත් දැන් නැහැ. අමාත්‍යාංශයේ එතුමිය කරන්නේ, සීමිත කාර්යභාරයක්. එතුමියට කියන්න කෝ. දැන් බලන්න කෝ. අපි වාද කළාට මොකද? මේ පළාත් සභාවේ අමාත්‍යවරු හතර දෙනාම මේ සීට්වල නැහැ. අපේ අවනඩුව කියන්නේ කාටද? නිවාස ඇමැතිවරයෙක් ඉන්නවා. නැඟිටලා ගිහිල්ලා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඔය පැත්තේ ඉන්න නායකයොත් නැහැ නේ?

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

නායකයෝ යන එන එක නොවෙයි මම අහන්නේ. එතකොට මෙතැන දැන් අමාත්‍යවරු හතර දෙනා ඉන්න ඕනෑ නේ අපේ ප්‍රශ්න ගන්න. එතකොට ගරු නියෝජ්‍ය සභාපතිතුමනි මගේ ඉල්ලීම තමයි, මෙන්න මේ නිවාසවලට අදාළව කමිටුවක් පත් කරලා, ඒ කමිටුව මඟින් මේ මිනිස්සුන්ගේ ජීවන තත්ත්වය ගැන අධීක්ෂණයක් කරන්න.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඉතාම නරක ජීවන තත්ත්වයක් තිබෙන්නේ. ඒක නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම යෝජනා කරනවා. අඩුම තරමින් මේ මිනිස්සුන්ටගෙන් ලබා ගන්නා ඉඩම්වලට වන්දියක් මේ මිනිස්සුන්ට ලැබෙන්න ඕනෑ. ඔවුන් පරිත්‍යාග කරන ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ට ආත්ම තෘප්තියක් තිබෙන්න ඕනෑ. කිසියම් දවසක අන්න අපේ ඉඩමේ තමයි අහවල් පාසල තිබෙන්නේ. අහවල් ඩිස්පැන්සරිය තිබෙන්නේ අපේ ඉඩමේ කියලා තමන්ට ආත්ම තෘප්තියක් තිබෙන්න ඕනෑ. හැබැයි ගරු සභාපතිතුමනි, දැන් තමන්ගේ ඉඩමේ තිබෙන්නේ ඉන්දියානු හෝටලයක් නම්, චීන සමාගමක් නම් මොන ආත්ම තෘප්තියක්ද? ඒකට හූල්ල හූල්ල ඉන්නවා හැරෙන්න වෙන කරන්න දෙයක් නැහැ. ඒක නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි අපි කියනවා, විශේෂයෙන් බස්නාහිර පළාත් සභාව තුළ මේ ලබා ගන්නා ඉඩම්වලට සාධාරණය කරන්න. ඒ ඉඩම නාගරික සංවර්ධන අධිකාරියට අවශ්‍ය නැත්නම් - මේ අය ඉඩම් ගන්නේ වෙන වෙන අයට විකුණන්න. එහෙම නැතිව ඇත්ත අවශ්‍යතාවයක් වෙනුවෙන් නම් මහජනතාව ස්වෙච්ඡාවෙන් ඉඩම් ටික දෙයි. එහෙම නැති තැන්වල එහෙම කරන්න එපා.

ඒ විතරක් නොවෙයි. මේ දෙන ලද නිවාසවල ප්‍රමිතිය හදන්න. නිවාස අමාත්‍යාංශයෙන් ගිහිල්ලා මේ නිවාස බලන්න. මධ්‍යම රජයේ අවසරය ඇතිව හරි කමක් නැහැ. ගිහිල්ලා බලලා නිරීක්ෂණයක් කරලා මේ මිනිස්සුන්ගේ ජීවන තත්ත්වය නංවන්න. ඒ විතරක් නොවෙයි. අවසාන කාරණය ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ මිනිස්සුන්ව මේ වතුවලින් එළවනවා. එළෙව්වාට පස්සේ අතනට ගියාම ඒ මිනිස්සුන්ට වෙනම වරිපනම් අංකයක් දෙන්නේ. ළමයා ඉස්කෝලේ දාගන්න ගියාට පස්සේ අවුරුදු හයේ පදිංචිය බලනවා. මම මේ සභාවේ මීට කලිනුත් කිව්වා. අවුරුදු හයේ පදිංචිය නැහැයි කියලා තමන්ගේ ඇප්ලිකේෂන් එක ප්‍රතික්ෂේප කරපු සැලකිය යුතු ළමයින් සංඛ්‍යාවක් ඉන්නවා. ඒගොල්ලන්ට ආනන්ද, නාලන්ද, රෝයල්, විශාඛා යන්න තහනම් කරලා තිබෙන්නේ. මොකද, වතුවල මිනිස්සුන්ව විශේෂයෙන් ගන්නේ නැහැ. ඒකයි. නමුත් ඊට අමතරව ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ මිනිස්සුන්ට අඩුම තරමින් මේ අධ්‍යාපන අමාත්‍යාංශය හරහා චක්‍රලේඛයක් නිකුත් කරන්න. කලින් හිටපු වරිපනම් අංකය සහ වර්තමාන වරිපනම් අංකයට අවුරුදු පහේ පදිංචිය සලකන්න කියලා. විශේෂයෙන් වනාතමුල්ලේ ඔය ප්‍රශ්නය තිබෙනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

අනිවාර්යයෙන්ම ඒක සානුකම්පිතව හිතන්න ඕනෑ.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අනිවාර්ය ප්‍රශ්නයක්. සැලකිය යුතු ශිෂ්‍ය සංඛ්‍යාවක් මේ ගැටලුවට මුහුණ පාලා තිබෙනවා. මෙන්න මේ තත්ත්වය පාදක කරගෙන ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම ඔබතුමාගේ අවධානය යොමු කරනවා. මේ වතුවල ජීවත්වන මිනිස්සුන්ට සැලකිය යුතු ප්‍රශ්නයක් තිබෙනවා. මෙන්න මේ තත්ත්වය

සම්බන්ධයෙන් ඔබතුමාගේ අවධානයට ලක් කරගන්න. ඒකත් එක්ක මේ මිනිස්සුන්ගේ නිවාසවල අවම අවශ්‍යතා ටික සම්පූර්ණ කර ගනිමු. අඩුම තරමින් මීන් ඉස්සරහාට වර්ග අඩි 750 ක වත් නිවාසයක් ලබා දීමට කටයුතු කරන්නය කියලා මධ්‍යම රජයට බල කරන්න කියන ඉල්ලීම මේ වේලාවේ මම කරනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

සුනිල් වටගල ගරු මන්ත්‍රීතුමා ගෙනෙන ලද යෝජනා දෙකටම ආණ්ඩු පක්ෂයෙන් කථා කරන්නේ නැහැයි කියලා දැනුම් දුන්නා. ඒ අනුව පසුව ඉල්ලන්න එපා. සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමාට විනාඩි 10 ක කාලයක් ලබා දෙනවා.

[පූ.භා. 11.19]

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඇත්ත වශයෙන්ම අපේ සුනිල් වටගල ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ මේ වෙලාවේ අඩුම ගණනේ විෂයය භාර අමාත්‍යවරයා ඉන්න තිබුණා. මේ ඇමැතිවරු නැහැ. දැන් පාසල්වලට ළමයින් ඇතුළත් කිරීම ගැන කථා කළා. අධ්‍යාපන ඇමැතිවරයා මේවා දැනගන්න ඕනෑ. ඒ විතරක් නොවෙයි. අඩුම ගණනේ මේ පණිවිඩය, දැන් මේ නගරයේ ඉඩම් භාරව කටයුතු කරන ඇමැතිවරයාගේ නියෝජිතයොත් මේ පළාත් සභාවේ නැහැ. හරිම කනගාටුයි. නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමාවත් හිටියා නම්, ඔය පණිවිඩය පාඨලී චම්පික රණවක ගරු ඇමැතිතුමාට කියන්න තිබුණා. නමුත් ඒ කවුරුත් නැහැ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මෙතුමා ගෙනෙන ලද යෝජනාව ඇත්තටම ඉතා වටිනා කාලෝචිත යෝජනාවක්. මොකද අපි මේ -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

යෝජනා දෙකම.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

යෝජනා දෙකම. මොකද, අපි මේ නිවාස නැති දුක් විඳින මිනිස්සු දිහා දකින අහන හැමදාම හමුවන අය. මම ඔබතුමාට කියන්නේ, ඊයෙත් සවසත් එක්කෙනෙක් ඇවිල්ලා මට කිව්වා, මහත්තයා මට ඉන්න තැනක් නැහැ. පුළුවන් නම් මට ගෙයක් හොයලා දෙන්නය කියලා. දැන් මේක බරපතළ ප්‍රශ්නයක්. මොකද, එදාවේල බොහොම අමාරුවෙන් හම්බ කරගන්න කෙනෙකුට නගරයේ ගෙයක් කුළියට ගන්න වුණොත්, කොහොමද ඒක කරන්නේ? මෙතුමා කිව්වා වාගේ ජාත්‍යන්තර ප්‍රඥප්තිවලට අපි ඕනෑ තරම් අත්සන් කරලා තිබෙනවා. රාජ්‍ය හැටියට එක පවුලකට එක ගෙයක් ගණනේ ලබා දෙන්න අපි බැඳිලා ඉන්නවා. හැබැයි, මේ කරන්නේ මොකක්ද? මේක හරහා වෙන කතන්දරයක් මේ කරගෙන යන්නේ. සංවර්ධනය අවශ්‍යයි. ඉතා පැහැදිලියි. නගර නිර්මාණය අවශ්‍යයි. නූතනයට ගැලපෙන විධියට නගර නිර්මාණය කරන්න ඕනෑ. පොදු පහසුකම් දියුණු කරන්න ඕනෑ. කර්මාන්ත දියුණු කරන්න ඕනෑ. හැබැයි, මේ බිම්වල ජීවත්වන මිනිස්සුන්ට සාධාරණය ඉෂ්ට කරන්න ඕනෑ. ඔවුන්ගේ අයිතිවාසිකම් කඩ වෙන්න බැහැ. ඔවුන්ට හිමි දේපළ සම්පත ඔවුන්ට අයිති වෙන්න ඕනෑ. අඩුම වශයෙන් ඒවාට සාධාරණ වන්දියක් ගෙවන්න ඕනෑ. හැබැයි, එහෙම වැඩ පිළිවෙළක් පසුගිය අවුරුදු පහේ, දහයේ පුරාවට මේ රටේ ක්‍රියාත්මක වුණේ නැහැ. ඇත්ත කතන්දරය. පසුගිය අවුරුදු දහය ඇතුළත තමයි මේ ඉඩම් කොල්ලකෑමේ ව්‍යාපෘති ක්‍රියාත්මක වුණේ. මෙතුමා කිව්වා වාගේ අර කොම්පඤ්ඤ වීදියේ හෝටල් හදපුවා, ඊට පස්සේ පකිස්තානයට ෆ්ලැට් ගහන්න දීපුවා. මේවා ඉතා බරපතළ විධියට ඒ මිනිස්සුන්ගේ අයිතිවාසිකම් උල්ලංඝණය කරලා, දීර්ඝ කාලීනව විදේශිකයන්ට මේවා පවරලා දීලා තිබෙනවා. දැන් මේකේ ප්‍රශ්නය මොකක්ද?

මෙතුමාගේ යෝජනාවට අදාළව කල්පනා කරලා බැලුවාම නිතර හමුවන ප්‍රශ්න කිහිපයක් තිබෙනවා. එකක් තමයි, දැන් මේ ඉඩම පවරා ගන්නවා. ඉඩම බලෙන් ගන්නේ. පවරා ගන්නවා නොවෙයි. නාගරික සංවර්ධන අධිකාරියෙන් ආවාම හරියට යුධ හමුදාවෙන් ආවා වාගෙයි. වහාම අයින් වෙන්න. අපි මේක සංවර්ධනය කරන්න ඕනෑ කියලා මහ තර්ජනයක් දාලා, මේ ඉඩම් ටික ගන්නවා. වැඩේ තිබෙන්නේ, සමහර වෙලාවට මේ ඉඩම්වල පදිංචි වෙලා ඉන්න මිනිස්සුන්ට සින්නක්කර ඔප්පුවක් නැති වෙන්න පුළුවන්. හැබැයි, ඔවුන්ට සාධාරණ විධියට තමන්ගේ අයිතිය ගැන තර්ක කරන්න පුළුවන් යම්කිසි ලියවිල්ලක් තිබෙනවා. හිමිකම් පත්‍රයක් තිබෙනවා. නගර සභාවට හෝ ප්‍රාදේශීය සභාවට හෝ වෙනයම් අධිකාරියකට ඔවුන් බදු ගෙවනවා. විදුලිය තිබෙනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

භුක්තියේ අයිතිය තිබෙනවා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

භුක්තියේ අයිතිය තිබෙනවා. ජලය තිබෙනවා. මේ සියල්ල තිබෙද්දී බලෙන් එළියට දානවා. මේ බිමේ සමහරු අවුරුදු පනහ, හැට ජීවත් වෙලා තිබෙනවා. සමහර පවුල් පරම්පරා දෙක තුන ජීවත් වෙලා තිබෙනවා. මෙතුමා කාරණයක් මතු කළා. මරදානේ අබේසිංහාරාම විහාරය අසළ, අබේසිංහාරාම වත්තේ පරම්පරා හතරක් විතර පදිංචි වෙලා තිබෙනවා. ඒ මිනිස්සුන්ගේ ඉතිහාසය ඇහුවාම ඇත්තටම හරි ආසයි. සුද්දාගේ කාලය ගැන කියනවා. ඉස්සර මේ ඉඩම් තිබුණේ කොහොමද කියනවා. ඒ පරම්පරා ගණනක් පදිංචිව ඉඳලා. මොකක්ද කරන්නේ? මේ නරක පූර්වාදර්ශය මම වගකීමෙන් කියනවා, 1977 පටන් ගත්තේ. මේ මාළිගාවත්ත නම් - පීටර් කෙනමන් මහත්මයාට යම් සැලසුමක් තිබුණා, අඩු ආදායම් ලාභීන්ට මේ මුඩුක්කු නැති කරලා ගෙවල් හදලා දෙන්න. ඒක තමයි මාළිගාවත්ත ව්‍යාපෘතිය පටන් ගත්තේ.

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

හැත්තෑවේ සමගි පෙරමුණ ආණ්ඩුවෙන්.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ඊට පස්සේ ප්‍රේමදාස මහත්මයා ඒක දිගටම ගෙන ගියා. එකක් කියන්න ඕනෑ. ප්‍රේමදාස මහත්මයාත් ඔය අබේසිංහාරමය පිටිපස්සේ ඉඩම් බලෙන් ගත්තා. මම ඉතා වගකීමෙන් කියන්නේ. හැබැයි, ඒ ගත්තාට ඒ මිනිස්සුන්ට අඩුම ගණනේ වර්ග අඩි 433 නොවෙයි. වර්ග අඩි 750 ට වැඩිය ලොකු ගෙවල් දුන්නා. ඒ නිවාසවලට මම ගිහින් තිබෙනවා. ප්‍රමාණවත් නිවාස දුන්නා. අද කරන්නේ මොකක්ද? අද ඇවිල්ලා බලෙන් - ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, තට්ටු දෙකට හදපු ගෙවල්. සමහර වෙලාවට ඒ පවුලේ අම්මා හරි තාත්තා හරි, එහෙම නැත්නම් දැනට වාසය කරන අයගේ දෙමව්පියෝ හරි 1977 න් පස්සේ විදේශගත වෙලා, අවුරුදු 10, 15 මැද පෙරදිග ගිහිල්ලා ඇවිල්ලා හදාගත්ත ගේ කෑල්ල. තට්ටු දෙකට හැදුවාම වර්ග අඩි 2000 ක් විතර තිබෙනවා. බලෙන් පවරාගෙන දෙන්නේ මොකක්ද? වර්ග අඩි 430 යි. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ ගේ ඇතුළේ රෙදි හෝදන්න බාත්රූම් එකේ හැරෙන්න බැහැ. පාත් වෙන්න බැහැ. මැරුණාම මළ මිනිය උඩට ගෙනි යන්න බැහැ. පඩි පෙළේ පෙට්ටිය හරවන්න බැහැ. අපේ සුනිල් වටගල ගරු මන්ත්‍රීතුමා දන්නවා. පෙට්ටිය හරවන්න බැහැ. මම දැක්කා, එක සැරයක් උඩ තට්ටුවේ ඉඳලා පෙට්ටියක් ලණු දාලා බානවා. අඩුම ගණනේ මේ මිනිස්සුන්ගේ ගරුත්වයට, අභිමානයට මොකද වෙන්නේ? අපි අභිමානවත් ජාතියක් හදන්න කථා කරනවා. මේ මනුෂ්‍යත්වය මොකක්ද?

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

දෙපාරක් වළට දානවා වාගේ.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

දෙපාරක් වළලනවා. ඉතින් ඇයි මෙහෙම වෙන්නේ? මේක නැති කරන්න ඕනෑ. දැන් මේවා පවරා ගන්නවා නම් ඒවාට සාධාරණ වන්දියක් ගෙවන්න. වෙළඳපොළ වටිනාකම ගෙවන්න. මරදානේ පර්චස් එක රුපියල් ලක්ෂ 150 යි, 200 යි. විදේශිකයන්ට රුපියල් ලක්ෂ 400 ට, 500 ට විකුණනවා. දීලා ඉවර වෙලා අතරමැදියන් ගාණක් සාක්කුවෙත් දා ගන්නවා. සාක්කුවේ දාගෙන ඉවර වෙලා අර මිනිස්සුන්ට සොච්චමක් දෙනවා. එක්කෝ අර කුකුල් කූඩුවක් දෙනවා. කුකුල් කූඩුවක් දීලා කියනවා, පලයල්ලා අර කුකුල් කූඩුවට කියලා. දැන් මේක තමයි ඇත්ත තත්ත්වය. ඒ නිසා මෙහෙම කරන්න ඉඩ දෙන්න නරකයි. මම කියන්නේ මේවා වගකිවයුත්තන්ගේ අවධානයට ලක් වෙන්න ඕනෑ කාරණා. මේක තමයි අපේ සටන. සමාජ සාධාරණය පිළිබඳ සටනේ කොටසක් මේක. ඒ නිසා මේක බරපතළව ගන්නය කියලා අපි මේ විෂයය භාර අධිකාරියෙන් ඉල්ලා සිටිනවා. ඒ වාගේම මේවාට වන්දි ගෙවනවා වාගේම මේගොල්ලන්ට සාධාරණ ස්ථානයක් තමන් හිටපු පරිසරයට සාධාරණයක් ඉෂ්ට කරන්න ඕනෑ.

දැන් තව ප්‍රශ්නයක් තිබෙනවා. දැන් මරදානේ එක ගෙයක් තිබෙනවා. ඒ ගෙදර පරම්පරා ගණනක් හිටපු අය ඉන්නවා. පුතාගේ පවුලත් ඉන්නවා. දුවගේ පවුලත් ඉන්නවා. දැන් මේ නිලධාරීන් ඇවිල්ලා මේ ඉඩම් කොටස බලෙන්

0105

ගන්නවා. අරගෙන ඉවර වෙලා එක ගෙයක් දෙනවා. එතකොට අර පවුල කොහෙටද වැටෙන්නේ? මොකද, ඒ දෙන ගෙදර පවුල් දෙකක් ඉන්න බැහැ. එහෙමනම් ගෙවල් දෙකක් දෙන්න ඕනෑ, ඒ මිනිස්සු ඇවිල්ලා අපේ ළඟ කන්නලව් කරනවා, අනේ මන්ත්‍රීතුමා පුළුවන් නම් අපටත් ගෙයක් අරන් දෙන්නය කියලා. දෙයියනේ අපි මේවා කරන්නේ කොහොමද? ඒ නිසා මේවා විධිමත් වෙලා නැහැ. මෙතැන සාධාරණය ඉෂ්ට වෙලා නැහැ. ඒ නිසා මේ නිවාස ප්‍රශ්නය, මේ ඉඩම් පවරා ගැනීම ඉතාම බරපතළයි. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, සමහරුන්ට වන්දි දෙනවා කියලා දීලා නැහැ. වන්දිය දෙන්න ගියාම කේවල් කරනවා. ඔයාට එච්චර දෙන්න බැහැ. ඔයාට අච්චර දෙන්න බැහැ. ඔයාගේ අරක නැහැ. මේක නැහැ. ඒක නිසා මෙච්චර කපන්න වෙනවා කියලා සමහරුන්ගේ වන්දිය බලධාරීන් කපන්න ලැහැස්ති වෙනවා. එම නිසා මෙහෙම තත්ත්වයකට ඉඩ දෙන්න එපා.

දැන් නිවාස ප්‍රශ්නය ගැන කථා කළාම ඊළඟ ප්‍රශ්නය මම කියන්නම්. මෙතුමා ඒක මතු කළා. ඔරුගොඩවත්තේ, බොරැල්ලේ නිදා ගන්නේ Shift එකට. පැය හතරක් නිදා ගන්නවා. නිදා ගන්නේ නැති කට්ටිය එළියට ඇවිල්ලා පාරේ අයිනේ ඉඳ ගන්නවා. ඊළඟ කට්ටිය නිදා ගන්න යනවා. අරගොල්ලෝ නිදාගෙන එනතුරු මේ අය තේ එකක් බීලා, සිගරැට් එකක් බීලා ඇහැරිලා ඉන්නවා. මම නිකන් කියන්නම්. ඔරුගොඩවත්තේ හන්දිය පහුවෙලා බෙත්තාරාම ක්‍රීඩාංගණයට යන පාරේ රෑ දෙකට විතර ගිහිල්ලා බලන්න. කී දෙනෙක් අර පේව්මන්ට් එකේ ඉඳගෙන ඉන්නවාද කියලා. ඇයි? කියලා ඇහුවාම අනික් කට්ටිය නිදාගෙන නැඟිටිනකන් අපි එළියේ ඉන්නවා කියනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේක තමයි නගරයේ තත්ත්වය. ඒ නිසා නිවාස ප්‍රශ්නය විසඳන්න ඕනෑ. දැන් නිවාස ප්‍රශ්නය විසඳන කොට ඊළඟට මේ මිනිස්සුන්ගේ ජීවන තත්ත්වය? මේ මිනිස්සුන්ගේ ජීවන තත්ත්වය උසස් කරන්න වැඩ පිළිවෙළකුත් නගරයේ නැහැ. නිවාස ප්‍රශ්නය විසඳන්නත් නගරයේ වැඩ පිළිවෙළක් නැහැ. ඒ නිසා මේ නගරය ගැන තීන්දු තීරණ ගන්න හරියට ජනතා නියෝජිතයනුත් එක්ක ගනුදෙනුවකුත් නැහැ. පළාත් සභාව හැටියට මේ ප්‍රශ්නය විසඳන්න ඕනෑ තරම් දේවල් කරන්න පුළුවන්. ඕනෑ තරම් මැදිහත් වෙන්න පුළුවන්. හැබැයි, කොයි මහ ඇමැතිද? කොයි ඇමැතිද? මේකට මැදිහත් වෙන්නේ කියන්න කෝ? මෙවැනි වැඩ පිළිවෙළකට.

0106

ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ ජනතාවට සාධාරණය ඉෂ්ට කරන්න. ඒ වාගේම ඉඩම් පවරා ගන්න කොට වෙළඳ පොළ තත්ත්වය සලකලා ඒ මිනිස්සු සතුටට පත් වන විධියට යම් විසඳුමක්, සතුටට පත් වන සාධාරණ මුදලක් මේවාට ගෙවන්න. මොකද, මේවායේ වටිනාකම බලන්න ඕනෑ ඒ අයගේ අතේ තිබෙන කඩදාසි කැලි වලින් නොවෙයි. ඒ මිනිස්සුන්ට තව තැනකට ගිහිල්ලා ජීවත් වුණු විධියට ජීවත් වෙන්න පුළුවන් පරිසරයයි හදන්න ඕනෑ. ඒ නිසා මේ පිළිබඳව සාධාරණය ඉෂ්ට වෙන්න ඕනෑ. වෙළඳ පොළ තත්ත්වය බලලා වන්දි ගෙවන්න ඕනෑ. ඊළඟට මේවා විනිවිද භාවයෙන් කෙරෙන්න ඕනෑ. සමහර වෙලාවට නිලධාරීන් මේවායෙන් සාක්කුවෙත් ගණනක් දාගෙන තමයි මේවා කරන්නේ. අපි මේවා ඉතා වගකීමෙන් කියන්නේ. ආවාට ගියාට මේවා කියනවා නොවෙයි. ඒ නිසා මේ ගැන මීට වඩා සැළකිලිමත් වෙන්නය කියලා ඉල්ලා සිටිනවා.

ඒ වාගේම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ යෝජනාව ගෙනෙන ලද සුනිල් වටගල ගරු මන්ත්‍රීතුමාට ඇත්තටම ස්තුතිවන්ත වෙනවා. මේක නගරයේ තිබෙන බරපතළ ප්‍රශ්නයක්. මේක කාටවත් පෙනෙන්නේ නැහැ. මේක කවුරුත් දකින්න උත්සාහ කරන්නේ නැහැ. හැබැයි අපි නගරයේ ඉන්න, නිරන්තරයෙන් නගරයේ ජනතාවත් එක්ක ගැටෙන අය හැටියට මේකේ තිබෙන ප්‍රශ්නය අපි දකිනවා. මේක තිබෙන්නේ කොළඹ නගර සීමාවේ විතරක් නොවෙයි. කොලොන්නාවේත් මේ ප්‍රශ්නයම තිබෙනවා. කොලොන්නාව කුණු කන්ද ආශ්‍රිත පවුල් එකසිය ගණනකට කළෙත් මේ ටික. ඒ මිනිස්සු අද දුක් විඳිනවා. සමහර ගෙවල් කැඩිලා. මම ගිහිල්ලා බැලුවා. අවාසනාවකට මම ළඟ අද ඡායාරූප නැහැ. මේවාගේම අර සිරිසඳ ද මොකක්ද කියලා තව එකක් කොලොන්නාවේ හැදුවා. අර ගෙවල්වල බිත්ති කඩාගෙන යන්න හදනවා. මේවායේ ප්‍රමිතියක් නැහැ. අද ඒ මිනිස්සු බොහොම භයෙන් ජීවත් වෙන්නේ. ඒ නිසා මේ ප්‍රශ්නය නිවැරැදි කරන්න ඕනෑ. පළාත් සභාව හැටියට මෙයට මැදිහත් වෙන්න පුළුවන් කියන එකයි මගේ දැඩි විශ්වාසය. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ නිසා මේ ගැන සියලු දෙනාගේ අවධානය යොමු විය යුතුයි කියන එක අවධාරණය කරමින්, කාලය ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා.

[පූ.භා. 11.38]

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම මේ යෝජනා දෙක සම්බන්ධ කරලා කථා කරන්න සූදානම් වන අවස්ථාවේදීම දැනගන්න ලැබුණා, පළාත් සභාවේ ආණ්ඩු පක්ෂය නියෝජනය කරන පැත්තෙන් කිසිම කෙනෙක් කථා කරන්නේ නැහැයි කියලා. මේ ඉඩම් පවරා ගැනීම, වන්දි ගෙවීම, නිවාස සෑදීම සහ ඊට ආනුෂංගික ගැටලු රාශියක් තිබෙනවා. නමුත් ආණ්ඩු පක්ෂයට මම හිතන්නේ මේ වනකොට ප්‍රශ්නයක් නැති ගාණයි. ඒක නිසා ඒ අයගේ ප්‍රශ්නත් එක්ක අපි කථා කරන්න බලාපොරොත්තු වෙනවා. එදා තිබුණු ආණ්ඩුවේ වැරදි කථා කරන්න තමයි මේක යොමු කළේ. දැන් ආණ්ඩු මාරු වෙලයි තිබෙන්නේ. ඒ නිසා යෝජනාව පහු වෙලා තිබෙන්නේ.

දැන් මම විශේෂයෙන් කියන්න ඕනෑ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේක ක්ෂේත්‍රයකට පටු කරන්නේ නැතිව මේ ක්ෂේත්‍රය ගැන කථා කෙරුවොත්, විශේෂයෙන්ම රජයේ ඉඩම් හඳුනා ගැනීමේදී පවා තවම නිසි ක්‍රමවේදයක් ක්‍රියාත්මක වෙන්නේ නැහැ. මම පෞද්ගලිකව සොයලා බලපු දේවල් කියන්නේ. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකින් ඇහුවොත් අර ඉඩම කවුරු සතුවද? ඒක දන්නේ නැහැ. ඊට පස්සේ ගිහිල්ලා අර අමාත්‍යාංශයේ, මේ අමාත්‍යාංශයේ කියලා සොයනවා. ඒ ක්‍රමවේදයේ සිට මෙතැන සකස් වෙන්න අවශ්‍යයි. ඊට අමතරව ඉඩම් පවරා ගැනීම්වලදී කිසිම ක්‍රමවේදයක් නිසි ආකාරයට ක්‍රියාත්මක වෙලා තිබුණේ නැහැ. ඒ ගෙවන මුදල තීන්දු කරන්නේ, අපේ හිතවතෙක් නම් හොඳට ගෙවනවා. නැත්නම් ලාවට ගෙවනවා. එහෙම ක්‍රමවේද තමයි ඒ කාලයේ ක්‍රියාත්මක වුණේ. ඒ වාගේම විශේෂයෙන්ම අපි සඳහන් කරන්න ඕනෑ. අධිවේගී මාර්ගයට ඉඩම් පවරා ගත්තු අවස්ථාවේ නම් වටිනා මිලක් ගෙව්වා. ඒක අපි නැහැයි කියන්නේ නැහැ. ඒ අය ගැන විශේෂයෙන් අපි පෞද්ගලිකව දැනුවත්. ඒ අයට යම්කිසි වටිනා මිලක් ගෙව්වා. එහෙම කියන කොට මා විසින් අපේ කටාන ප්‍රදේශයේ තිබෙන ගැටලු ගත්තොත් පසුගිය ආණ්ඩුව කාලයේ අක්කර 10 ක රජයේ ඉඩමක් වැලි මැටිවලට කපලා දාලා තිබෙනවා. ජම්බු ගස්වත්ත කියන කොට්ඨාශයේ. ඒ පැත්තේ මන්ත්‍රීවරු දන්නවා ඇති. ආණ්ඩුවේ ඉඩම කැපුවේ. එතකොට ඔය නිලධාරී හිටියාද? ප්‍රාදේශීය ලේකම් හිටියාද? මන්ත්‍රීවරු හිටියාද? කවුරුත් මේ සභාවේ ඒවා කථා කළේ නැහැ. එතකොට මම නම් සභාවට ඇවිල්ලා හිටියේ නැහැ. ඉතින් අද අවස්ථාවක් හම්බ වුණු නිසා කියනවා, අක්කර 10 ක් කපලා වැලි මැටි වලට විකුණලා ඒවායේ හිටපු මිනිස්සුන්ට වෙන වෙන තැන් දීලා ඒවායේ කිසිම ප්‍රමිතියකුත් නැහැ. එහෙම කරන්නේ කොහොමද? එවැනි දේවල් සිද්ධ වුණා. ඒක නිසා තමයි එවැනි දේවල් ගැන ඔය ආණ්ඩු පක්ෂයේ අයට කථා කරන්න බැරි.

ඒ වාගේම මම කියන්න ඕනෑ, අඩි 60 කට අපි පාරවල් පළල් කරලා තිබුණා. ඒ පාරවල් පළල් කළාම, ඡන්ද දිනපු ගමන්ම ඒ පාරවල්වල ගිහිල්ලා මිනිස්සුන්ව පදිංචි කළා. දැන් අද පාර හදන්න අපි යන කොට මිනිස්සු අයින් කරන්න ඕනෑ. බැලුවාම ඒ අයට ගෙවල් තිබෙනවා. තට්ටු ගෙවල් තිබෙනවා. ඒ මිනිස්සු මෙතැන පදිංචි වෙලා කඩයක් දාගෙන ඉන්නවා. එතකොට බැලුවාම යන්නත් සල්ලි ඉල්ලනවා. එතකොට වැරැද්ද කාගෙද? වැරැද්ද තිබෙන්නේ නිලධාරීන්ගේ අතේ. එකක් පාරේ පදිංචි වෙන්න දුන්නේ ඇයි? දෙවනුවට යන්න සල්ලි ඉල්ලනවා. මේගොල්ලෝ සොයලා බලන්නේ නැහැ. තට්ටු ගෙවල්වල ඉන්න මිනිස්සු තමයි මෙතැනට ඇවිල්ලා තිබෙන්නේ. මේකේ දෙපැත්තක් තිබෙනවා. දැන් මෙතුමන්ලා කිව්වා වාගේ හැරෙන්න බැරි නිවාස හදලා, අපි නම් වශයෙන්ම කිව්වොත් හිටපු ඉඩම් අමාත්‍යතුමා. අපි දන්නවා, තමුන්ගේ ගෙවල්වල අයට ඉඩම් ටික දීගෙන තිබුණා. මම හිතන්නේ, ඒ අය ඉතා දුගී දුප්පත් යන්න එන්න තැනක් නැතුවා සිටියා වෙන්න ඇති. ඒ නිසා පවුල්වල නෑදැයින්ට, නැන්දට, මාමාට, බෑණට ගෙවල් ටික ඔක්කොම බෙදලා අර චූටි ගෙවල් ටිකක් නැති බැරි මිනිස්සුන්ට දීලා තිබුණා. අසරණ භාවයෙන් සිටියාද කියලා සොයලා බලන්න තමුන්නාන්සේලාට භාරයි. ඒ වාගේම එතුමාත් චූටි ගෙයක් හදාගෙන, එදා බාථා දෙකයි, ඉරිච්ච ඩෙනිම් කළිසමයි ඇඳගෙන ඇවිල්ලා අද රටට ජාතියට ආදරය කරලා තිබෙන තරම කිව්වොත්, රට ජාතිය ඉතා චූටි ගෙයක් දායාද කරලා තිබෙනවා. ඉතින් මෙවැනි නිවාස අමාත්‍යවරයෙක් අපට සිටියේ. (බාධා කිරීමක්)

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

හයද?

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

අපි නම් කාටවත් භය නැහැ. අපි කාට වුණත් කථා කරන්න ඕනෑ එක කථා කරනවා. අපි ඉස්සරත් කථා කළා. කථා කළාට වැඩක් නැහැ. ගෙවල් 2020 ක් තිබෙන රද්දොළුව ජාතික නිවාස සංකීර්ණයේ හිස් ඉඩම් ටිකක් තියලා තිබුණා. හිටපු නිවාස ඇමැතිවරයා ඒවාත් වික්කා. ඒවා තියලා තිබුණේ වාතාශ්‍රය ලබා ගන්න. ගහක් කොළක් හිටවා ගන්න. ඒකත් එතුමා ඇවිල්ලා තමන්ගේ හිතවතුන්ට වික්කා. මම ලේඛන එක්ක පෙන්වන්නම්. ඕවා ඔක්කොම මම ලේඛනගත කරලා තිබෙන්නේ. ඇත්ත වශයෙන්ම අද අපි මේ කිඹුල් කඳුළු පාරේ හෙළලා - දැන් මම එන කොට දැක්කා, පෝස්ටරයක් තිබෙනවා. ලෝකයේ ගැරහුම් ලැබුණත් පුතා උතුම් කියලා. පුතාගේ උතුම්කම අපට මේ විධියට කියන්න සිද්ධ වෙනවා. එක කාලයක් අප්පච්චි කළා. ඊට පස්සේ පුතා කළා. ඇත්ත වශයෙන්ම මේවා ජනතාවගේ දැන ගැනීම සඳහා මම කියන්නේ. හරියට නිකන් අයිසින් කේක් එක වාගේ අයිසින් කරලා උඩින් පෙන්නුවාට මේක පුස් කාපු කේක් එකක් වාගේ තමයි ඒ නිවාස අමාත්‍යාංශයේ වැඩ පිළිවෙළ. මම කියන්නේ අපි ජනතා නියෝජිතයන් හැටියට මේ සියලුදේටම අපි නීති පියවර ගන්න ඕනෑ තැනට ගන්න. ඒවා මම යොමු කරන්න ලැහැස්ති කරලා තිබෙනවා. අපි නිකන් ඉන්නේ නැහැ. අපි ඔය අමාත්‍යවරුන්ට මාසෙන් දෙකෙන් එන්න දෙන්නේ නැහැ. තව තිබෙන ඒවාත් දානවා.

විශේෂයෙන් මම මේ නිවාස සම්බන්ධයෙන් කියන්නට ඕනෑ. දැන් ගැටලුවක් මතු වෙලා තිබෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කවුරු හරි රජයෙන් දුන්නු ඉඩමක ඉඳලා මේක පවරා ගන්න ගියාම - එක සිද්ධියක් මට වාර්තා වුණා. මම ඔබතුමන්ලාගේ දැන ගැනීමට කියනවා. පියා මිය ගියා. එක පුතයි ඉන්නේ. පුතා අසනීප වෙලා බිරිඳගේ ගෙදර පදිංචි වෙලා ඉන්න කොට ග්‍රාම නිලධාරී අර අයිඩෙන්ටි කාඩ් එක අරගෙන AG Office එකත් සම්බන්ධ කරගෙන වෙන කෙනෙකුට මේකේ ලියවිලි ටික හදනවා. පුතා සනීප වෙලා එන කොට ඉඩම නැහැ. එක පුතයි ඉන්නේ. බැලුවාම ග්‍රාමසේවකට මොකක් හරි නෑකමක් තිබුණාද දන්නේ නැහැ. උරුමයක් හදලා. ඉතින් කාර්යාලවල මෙවැනි තත්ත්වයන් සිද්ධ වෙනවා. ඇත්ත වශයෙන්ම අපි නැති බැරි කෙනෙකුට ඉඩමක් දුන්නොත් එයාගෙන් පස්සේ පරම්පරාවේ කෙනෙකුට පදිංචි වෙන්නයි දෙන්නේ. ඉතින් මෙවැනි සිද්ධීන් මේ ලංකාව පුරා තිබෙනවා. අපි නොදන්නවා නොවෙයි. අපි එක්කෙනෙකුට ඇඟිල්ල දික් කරලා මේක නතර කරන්න බැහැ. නිලධාරියාගේත් තිබෙනවා. ඒ අමාත්‍යවරුන්ගෙත් තිබෙනවා. ඊට අවට ඉන්න මනුෂ්‍යයන්ගේ පැත්තෙනුත්, දූප්පත් කියලා තව ගෙයක් තියාගෙන දැන් අපි මේ පාරේ ඉන්න ඒවා අයින් කරන කොට, ඉඩම් නැති අයගේ ලැයිස්තු ඉල්ලුවාම දෙනවා, බිරිඳට ඉඩම තිබෙනවා. මහත්තයාට නැහැයි කියලා. එතකොට ඒ කියන්නේ බිරිඳ වෙන තැනකයි, මහත්තයා වෙන තැනකයි ඉන්නවා නොවෙයි. එක ගෙදර ඉන්නේ. එවැනි ආකාරයට මහජනතාවත් නොමඟ අරින අවස්ථාවල් තිබෙනවා. ඉතින් මේ සියල්ලම සැලකිල්ලට අරගෙන තමයි රජයේ ඉඩම් ප්‍රතිපත්තිය, නිවාස ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරන්න ඕනෑ.

විශේෂ කොට අපි දකිනවා, මේ එක්සත් ජාතික පක්ෂ රජයට තමයි නිවාස ලබා දීම පිළිබඳව ඇත්තටම අභිමානයෙන් කථා කරන්න පුළුවන්. එදත් නිවාස හදලා මිනිස්සුන්ව පදිංචි කළා. අදත් සජිත් ප්‍රේමදාස ගරු ඇමැතිතුමා පළමුවෙන්ම සෑම ගමකටම තමන්ගේ ගේ කපරාදු කරගන්න සිමෙන්ති ආධාරයක් දුන්නා. ඒ වාගේම නිවස හදාගන්න ලක්ෂයක ආධාරයක් දුන්නා. ඒ වාගේම මේ වන කොට රජයේ ඉඩම්වල විවිධ පුද්ගලයින් සම්බන්ධ කරගෙන නිවාස හදලා පදිංචි වෙන්න අවස්ථාවක් දෙනවා. ඒ වාගේම ඒ පුද්ගලයින් උනන්දු කරනවා. ඒ කුඩා ගේ හදලා දුන්නාට පස්සේ තමුන්ගේ ශක්තියෙන් ඉස්සරහාට මේ ගේ වැඩි දියුණු කරගන්න ඔවුන් උන්නදු කිරීමක් කරනවා. මෙවැනි ආකාරයට මේ ආණ්ඩුව කටයුතු කරගෙන යන කොට මෙවැනි අඩුපාඩු පෙන්නලා දීලා ඉස්සරහාට යන්න උදව් කරනවා මිසක්, අපි මේ ප්‍රතිපත්ති කඩාකප්පල් කරන්න කථා කරනවා නොවෙයි. නමුත් ඉස්සර කළත්, දැන් කළත් කාගේ හරි අතින් වැරැද්දක් වෙනවා නම් ඒක නිවැරැදි වෙන්න ඕනෑය කියලා අපි පිළිගන්නවා. මේ අවස්ථාවේදී මේ යෝජනාව ගෙනෙන ලද ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාවට මමත් එකඟ වෙනවා. පදිංචි වෙන්න පුළුවන් නිවාසයක් හැම කෙනෙකුටම තිබෙන්න ඕනෑ. ඒ වාගේම අපේ නිවාස ගරු ඇමැතිතුමාටත් ස්තුතිවන්ත වෙනවා. එදා වාගේ බංකොලොත් නිවාස ක්‍රමයක් නොවෙයි. වැදගත් ආකාරයට මේ අමාත්‍යාංශය මෙහෙයවන එක ගැන ස්තුතිවන්ත වෙමින් අපේ සුනිල් වටගල ගරු මන්ත්‍රීතුමා ගෙනෙන ලද යෝජනාවට මගේ ප්‍රශංසාව එකඟත්වය ප්‍රකාශ කරමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[පූ.භා. 11.38]

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, සුනිල් වටගල ගරු මන්ත්‍රීතුමා ගෙන එන යෝජනාව, ඇත්තටම ඒ හරහා කාරණා ගණනාවක් මේ පළාත් සභා බල සීමාව තුළ සිදුවන සිදුවීම් සම්බන්ධව අවධානය යොමු කළ යුතු කරුණු කිහිපයක් තිබෙනවා. ඒකේ එකක් මේකේ මේ දෙවැනි යෝජනාවට කෙළින්ම සම්බන්ධයි. පුදුමාකාර විධියට මේ වර්තමාන ආණ්ඩුව - මේකේ අපට ප්‍රශ්නයක් තිබෙනවා, මේ මධ්‍යම ආණ්ඩුවේ, කවුද මේකේ වගකිවයුත්තෝ කියලා. කොහොම හරි මේ දේශපාලන පක්ෂ දෙකේම මේකේ වගකිවයුත්තෝ ඉන්නවා. දැන් මේ සභාවේත් එහෙමයි. ඒ නිසා මේ ඇති වෙලා තිබෙන තත්ත්වය මත කවුද මේකේ චූදිතයෝ කියන එකත් ප්‍රශ්නයක්ව තිබෙනවා. මේ මොහොත වන කොට අපි දන්නවා, වේරුස් ගඟ ව්‍යාපෘතිය කියලා මම මීට ඉස්සෙල්ලාත් කථා කළා. වේරුස් ගඟ ව්‍යාපෘතිය කියලා ව්‍යාපෘතියක් යනවා. දැන් එන්න එන්න මේ ව්‍යාපෘතිය පළල් වෙනවා. ඇත්තටම කිසිම ප්‍රශ්නයක් නැහැ. සංවර්ධනය පැත්තෙන් ඒක අවශ්‍යතාවය නම්, ඒක රටට ගන්න ඕනෑ. හැබැයි, මේවායේ ඉඩම් ගැනීමේදී විශේෂයෙන් ඒ මිනිස්සුන්ගේ දේපළ සම්බන්ධව මෙය බලපානවා. මම මේ කියන්නේ, ඒ වේරුස් ගඟ ව්‍යාපෘතිය නිසා ඒ දෙල්කඳ ප්‍රදේශයේ පවුල් ගණනාවක් අද අසරණ වෙලා තිබෙනවා. ඒවායෙන් ජීවිකාව ගෙන ගිය විශාල ප්‍රමාණයක් අසරණ වෙලා තිබෙනවා. ඒ මිනිස්සු තමන්ගේ සින්නක්කර ඉඩම් හැටියට තියාගෙන ඉන්න දේපළ මේ. ඒ නිසා සින්නක්කර ඉඩමක් ආණ්ඩුවක් ගන්නවා නම්, ඒ ඉඩමට අදාළව නියමිත වන්දියක් ගෙවන්න ඕනෑ. දැන් අපි දන්නවා, පාරක් හදන කොට ඒ පාරට ඉඩම් පවරා ගන්නවා නම්, ඒ ඉඩමේ අයිතිකරු ඒ වන්දි සම්බන්ධව සෑහීමකට පත් වෙන්නේ නැත්නම් ඒ සම්බන්ධයෙන් පියවර කිහිපයක් ගන්න තිබෙනවා. තමන්ගේ පැත්තෙන් අභියාචනා ඉදිරිපත් කරලා, ලාග් කමිටු කියලා එකක් තිබෙනවා. සුපර් ලාග් කියලා එකක් තිබෙනවා. හැබැයි, මේ කිසිම දෙයක්, කිසිම නීතියක් නැහැ. ඒගොල්ලෝ දෙන ගණන ගන්න ඕනෑ. මේක පුදුම නීතියක්. ඒ මිනිස්සු පුදුමාකාර විධියට අසරණ වෙලා තිබෙන්නේ. ඒ තමන්ගේ අහිමි වන ජීවිකාව සම්බන්ධව ඒකට වන්දියක් මේකේ නැහැ. ඒ නිසා මේක බරපතළ කාරණයක්. ඒ නිසා මට හිතෙනවා, අර අනුන්ගේ දේවල් ගන්න එක - ඒවාට කප්පිත්තෝ බවට පත් වෙලා තිබෙනවා. දැන් මේකට වගකිවයුතු ඇමතිවරුන්ට අනුන්ගේ දේ අරගන්න පුදුම හැකියාවක් තිබෙනවා. ඒකට කිසි ප්‍රශ්නයක් නැහැ. කිසිම ලැජ්ජාවක් නැහැ. දැන් දේපළ නොවෙයි. මේ කට්ටිය අනුන්ගේ පෙම්වතියොත් ගන්නවා. පසුගිය කාලයේ සාකච්ඡාවක් ගියා, විදේශීය පෙම්වතියක් සම්බන්ධව. මේ විධියට දැන් අනුන්ගේ පෙම්වතියෝත් ගන්නවා. ඒ තත්ත්වයට ගිහිල්ලා තිබෙන්නේ.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon . O. W. Prasanna Sanjeeva

සාමාන්‍ය දේවල්.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ඔබතුමන්ලාට සාමාන්‍ය දේවල් තමයි. නමුත් ඒ මිනිස්සුන්ට සාමාන්‍ය දෙයක් නොවෙයි ඒක. ඔබතුමන්ලාට නම් ඕවා සාමාන්‍ය දේවල් තමයි. මටත් පේනවා. ඒවා ප්‍රශ්නයක් නැහැ වාගේ. ඔන්න ඕක තමයි තිබෙන්නේ.

මම අහන්නේ, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ පුද්ගලයෝ තමන්ගේ දේපළක් මේ විධියට කාට හරි ගන්න දෙනවාද? මම දන්නවා. සමහර පාරවල් හදන කොට ඒ යන පාරේ ඇමතිවරයෙකුගේ දේපළක් තිබෙනවා නම්, ඒ පාර මොන ක්‍රමයකින් හරි වෙනස් කරනවා. වෙන පාරකින් යනවා. දැන් අපි දන්නවා. කැස්බෑවේ දැම්මා බයි රෝඩ් එකක්. බයි රෝඩ් එක දාන්න ඇත්තටම මූලික හේතුව වුණේ, ප්‍රධාන කරුණු වුණේ, ඒ වගකිවයුතු ඇමතිවරුන්ගේ දේපළ තිබීමයි. ඒ පිළියන්දල ප්‍රදේශයේ. ඒවා බේරගන්න. අපි දන්නවා. (බාධා කිරීම්) බයි රෝඩ් එකත් හදලා, ඒ අදාළ පාරත් පළල් කළා නම්, අපට කියන්න පුළුවන් එහෙම ප්‍රශ්නයක් නැහැයි කියලා. හැබැයි, ඒ ප්‍රධාන පාර ඒ කොටස පළල් වුණේ නැහැ. ඒකට විතරක් තිබෙනවා, නිකම් දෙබොක්කාවක් වාගේ. ඒ මොකුත් නොවෙයි. තමන්ගේ දේපළ පරිස්සම් කර ගන්න. තමන්ගේ දේපළ සම්බන්ධව එහෙමයි. හැබැයි, අනුන්ගේ. අර මහජනතාව බොහොම අමාරුවෙන් දහඩිය මහන්සියෙන් හම්බ කර ගත්ත දේ ගන්න කිසිම ලෝබකමක්, කිසි ප්‍රශ්නයක් නැහැ. ඔය තත්ත්වයට තමයි

ඒ ජනතාව මුහුණ දීලා තිබෙන්නේ. ඇත්තටම මේ පාලනය ඇතුළේ අද පත් වෙලා තිබෙන තත්ත්වය මේකයි. මේ මහජනතාව ගොදුරු වෙලා තිබෙන තත්ත්වය. ඉතින් ඇත්තටම මේ රටේ සමහරු විශ්වාස කළේ අර සමාජවාදය ආවොත් තමයි දේපළ ගන්නේ කියලා. සමාජවාදය දේපළ ගන්නේ නැහැ. අනුන්ගේ දේපළක් අත්පත් කර ගන්නේ නැහැ. නමුත් එහෙම තමයි මේ දාලා තිබ්බේ. චිත්‍රය දාලා තිබ්බේ. අදහස දාලා තිබුණේ. නැහැ. මේ පවතින මේ පාලන ක්‍රමය ඇතුළේ තමයි මේ මහජනතාවට අයිති දේපළ මේ විධියට පවරා ගැනීමක් කරන්නේ. ඇත්තටම නිවාසයක් දෙන එක, ජීවත් වෙන්න තැනක් හදලා දෙන එක ආණ්ඩුවකින් කරන්න ඕනෑ වැඩක්. නමුත් ඒ ජනතාව විසින් සොයා ගත්තු දේත් ඩැහැ ගන්න තත්ත්වයට ආණ්ඩුවක් පත් වෙලා තිබෙනවා. මේක ඇත්තෙන්ම අපේ රටේ කනගාටුදායක තත්ත්වයක්. වැඩේ තියෙන්නේ මේවාට වගකිවයුත්තෙක් නැහැ.

මේ ළඟදී දවසක් මොකක් හරි විවෘත කිරීමක් සම්බන්ධව ගරු අගමැතිතුමා කථා කරනවා. ඇත්තටම මම දන්න හින්දා හොඳයි. ගුවන් විදුලියෙන් අහන කොට මේ අපේ අගමැතිතුමා කියලා කථා කරන්නේ. එහෙම නැති කෙනෙක් නම් හිතනවා, කවුද මේ කථා කරන්නේ කියලා. හිතන්නේ කවුරු හරි විපක්ෂයේ ඉන්න කෙනෙක් කථා කරන්නේ කියලා. එතුමා දැන් අවුරුදු ගණනාවක් මේ රටේ පාලනයට සම්බන්ධ වෙලා තිබෙනවා. තවමත් මේ නැති බැරිකම, බැරිකම හදන්න ඕනෑ එක, අපි ගොඩ නගන්න ඕනෑය කියලා තවමත් කථා කරනවා. ජනාධිපතිතුමාත් එහෙමයි. ජනාධිපතිතුමාත් ඇමතිවරයෙක් හැටියට නොයෙක් නොයෙක් නොයෙක් නිලතල දරමින් අපේ රටේ පාලනයට සම්බන්ධ වුණු කෙනෙක් තමයි ජනාධිපතිතුමා හැටියට ඉන්නේ. නමුත් ජනාධිපතිතුමා විවේචනය කරනවා. ඇත්තට බලාගෙන යන කොට අපට විවේචනය කරන්න දෙයක් නැහැ. ජනාධිපතිතුමා තමයි මේ ඔක්කොම විවේචනය කරන්නේ. එතුමාට වෙලා තිබෙන්නේ විවේචනය කර කර ඉන්න. අපි කරන දේම තමයි එතුමාත් කරන්නේ. ඒ නිසා මේ තත්ත්වයන්වලට විසඳුම් දෙන්නයි ඕනෑ. ඒ නිසා මේ තත්ත්වයන්වලට මුහුණ දෙන බස්නාහිර පළාතේ මේ ජනතාවගේ ඒ ප්‍රශ්න සම්බන්ධව අවධානය යොමු කරලා ඒ සඳහා විසඳුම් දෙන්න ඕනෑ. අඩුම ගණනේ මේ සම්බන්ධව මේ පළාත් සභාවේ කථිකාවක් කරන්න යෝජනාව ගෙනාවාට පස්සේ, අඩුම ගණනේ ඒකට අදහස් දැක්වීමත් කරන්නේ නැහැලු මේ පාලක පක්ෂය. දැන් නම් මෙතැන ගාමිණී තිලකසිරි ගරු ඇමතිතුමා ඉන්නවා. ආණ්ඩු පක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා ඉන්නවා. හිටපු නියෝජ්‍ය සභාපතිතුමා ඉන්නවා. එතුමන්ලා මේ ආසන නියෝජනය කරනවා. ඒ ආසනවල ප්‍රශ්න තිබෙනවා. එතුමන්ලා දිස්ත්‍රික්කයක් හැටියට මේ පළාත් සභාවේ කටයුතු කරන්නේ. අප්‍රමාණ ප්‍රශ්න තිබෙනවා මේ මාතෘකාව සම්බන්ධව. විශාල ගැටළු ටිකක් තිබෙනවා. දැන් අපට හිතා ගන්න බැහැ මේ වර්ජනය මොකක්ද කියලා. මේ අදහස්වත් ප්‍රකාශ කරන්නේ නැත්තේ මොකක්ද හේතුව කියලා.

ඒ වාගේම තමයි මෙතැන තිබෙනවා බේස්ලයින් පාර. දැන් ඊළඟ ප්‍රශ්නය. මම කලින් කියපු එකටම. ඒ කියන්නේ තමන්ගේ දේපළ ආරක්ෂා කර ගන්න සැලසුම් වෙනස් කරනවා. බේස්ලයින් පාර පාමංකඩ දක්වා දීර්ඝ කිරීම සඳහා, ඒ කියන්නේ 120 පාරට සම්බන්ධ කිරීම සම්බන්ධව කලින් සැලසුමක් තිබුණා. බලපොකුණ පාර හා සම්බන්ධව සැලසුමක් තිබුණා. එතකොට ඒ සැලසුම ඇතුළේ ඇත්තටම හානිය අඩුයි. මම දන්න විධියට කොළඹ මහ නගර සභාවේ වැඩ බිමක් තිබෙනවා. ඒක හිස් බිමක්. ඒ හිස් බිම උඩින් තමයි දැන් පාර දාන්න හිටියේ. හැබැයි, ඒකේ කෙළවරට යන කොට හිටපු මන්ත්‍රීවරයෙකුගේ, මට මතක හැටියට කොළඹ මහ නගර සභාවේ මන්ත්‍රීවරයෙකුගේ ගෙයක් අහු වෙනවා ඒකට. දැන් මොකද කළේ? ඒ මන්ත්‍රීතුමා? ඔන්න බලය තමන්ට ඕනෑ විධියට යොදා ගෙන. වර්තමාන ආණ්ඩුවේ වගකිවයුත්තෝ සම්බන්ධ කර ගෙන දැන් ඒ සැලසුම වෙනස් කරලා. වෙනස් කරලා අර එහා පැත්තෙන් තිබෙනවා පන්සල. ඒ පන්සල හරහා යනවා. එක පැත්තකින් ඒ පන්සල කඩා ගෙන යනවා. ඒ වාගේම තමයි සාමාන්‍ය මිනිස්සුන්ගේ ගෙවල් විශාල ප්‍රමාණයක් නැති වෙනවා. විශාල හානියක්. අපි කියන්නේ ඒකයි. ඒ නිසා රටක සැලසුමක් තිබෙනවා නම්, පාරවල් අලුතෙන් හදන ඒවා සම්බන්ධවත්, මේවා පිළිබඳවත් මොකක් හරි මාස්ටර් වැඩ පිළිවෙළක් තිබෙනවා නම්, එහෙම වෙන්න බැහැ. ආණ්ඩු වෙනස් වෙන කොට අර තිබුණු සැලසුම වෙනස් වෙන්න බැහැ. ඒ නිසා මේ මොකුත් නොවෙයි. තමන්ට බලය තිබෙන කෙනා තමන්ගේ දේපළ ආරක්ෂා කර ගැනීම පැත්තෙන්, තමන් බේරීම පැත්තෙන් සියලු දේම හදා ගන්නවා. එහෙම හැකියාව නැති මේ රටේ සාමාන්‍ය සිවිල් පුරවැසියෝ තමයි මේකෙන් අසරණ වෙලා

[ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි]

තිබෙන්නේ. ඒ නිසා මේ ජනතාව කියන්නේ මොකුත් නොවෙයි. රටේ සංවර්ධනයට තමන්ගේ දේපළ ගන්නවා නම් කරන්න දෙයක් නැහැ. ඒවා දාලා යන්න වෙනවා, තමන්ට පුළුවන් තැනකට. ඒක එහෙම තමයි. නමුත් ඒකට සාධාරණ යුක්ති සහගත වන්දියක් ආණ්ඩුවක් හැටියට ගෙවන්න ඕනෑ. දැන් මේ යන කලාව ඇතුළේ මහජනතාවගේ දේපළ පවරා ගන්නවා. ඉඩම් පවරා ගන්නවා. ගෙවල් කඩලා දානවා. නමුත් ඒ මිනිස්සුන්ගේ ඒ හානිය සම්බන්ධව සාධාරණ වන්දියක් දෙන්නේ නැහැ. ඒකට අපිත් කටයුතු කරන්න ඕනෑ. පළාත් සභාවටත් වගකීමක් තිබෙනවා. අපි ඒ ජනතාව නියෝජනය කරමින් මෙතැන ඉන්නේ. ඒ ජනතාව නියෝජනය කරමින් තමයි තමුන්නාන්සේලා ආණ්ඩු කරන්නේ. ඒ නිසා පළාත් ආණ්ඩුවකට විශේෂ වගකීමක් තිබෙනවා. ඒ නිසා අන්න ඒ වගකීම දරන්නය කියන අදහස තමයි මේ සුනිල් වටගල ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාව තුළ තිබෙන්නේ.

**ගරු සුමිත් විජයමුණි ද සොයිසා**
Hon. Sumith Wijayamuni De Soysa

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, එතුමා ඔබතුමාව විතරක් නොවෙයි. මාවත් ඇමතුවා. මට මොහොතක් දෙන්න. දැන් මේක මෙහෙම නේ? එදා කඩ වහන කොට තුණ්ඩුවෙන් එළවළු ටිකද, මාළු ටිකද, මස් ටික ද, ඒවත් කුණු වුණා එදා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

සුනිල් වටගල ගරු මන්ත්‍රීතුමාට පිළිතුරු කථාව සඳහා අවස්ථාව ලබා දෙනවා.

[පූ.භා. 11.51]

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විශේෂයෙන්ම මම ටිකක් කනගාටු වෙනවා. ඇත්තටම ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීවරු මේ යෝජනාව සම්බන්ධයෙන් අදහසක් පළ නොකිරීම සම්බන්ධයෙන්. දැන් මේ නිකම් වල්භූත කථාවක් මේ කියන්නේ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ යෝජනාව හරහා දැන් විශේෂයෙන්ම තව කාරණයක් කියන්න තිබෙනවා. විශේෂයෙන්ම මැනිං මාකට් පොළ භූමිය ගෙනියන්න තිබුණේ පැලියගොඩ මාළු මාකට් එක අසළ භූමියකට. අක්කර විසි පහක ඉඩමකට. එතකොට මේ භූමිය දැන් වෙනත් සමාගමකට විකුණන්න හදනවා. බදු දෙන්න හදනවා. මැනිං මාකට් එක දැන් වෙනත් තාවකාලික ස්ථානයක, ඉංජිනේරු සංස්ථාව අසළ කුඩා භූමියකට ගේන්න හදනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අවාසනාවන්ත තත්ත්වය තමයි අර පැලියගොඩ පොළ භූමියට මුල් ගලක් තිබ්බා. මේ ආණ්ඩුවෙන් මුල් ගල තිබ්බේ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ මුල්ගල දැන් ගලවලා විසි කරලා. මුල්ගල දැන් ගලවලා වීසි කරලා, සුද්දාගේ කාලයේ ඉඳලා - මැනිං කියන්නේ සුද්දෙක් නේ? සුද්දා ඇති කරපු ඒ පොළ භූමිය දැන් චීන සමාගමකට දෙන්න හදනවා. ඒ මිනිස්සුන්ව පාරට ඇදලා දාලා. අර කියපු භූමිය දෙන්නෙත් නැහැ. එතකොට ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මොකක්ද මේ ක්‍රමය? විශේෂයෙන්ම අද සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ මේ අබේසිංහාරාම වත්තේ තිබෙන තත්ත්වය බරපතළයි. අබේසිංහාරාම වත්තේ තිබෙන පවුල් 33 කට මේක බලපාලා තිබෙනවා. අබේසිංහාරාම වත්තේ පර්චසයක මිල රුපියල් ලක්ෂ 150 ක් විතර වෙනවා. ඒ අයට කිසිසේත්ම යන්න පුළුවන්කමක් නැහැ. මේ තිබෙන මහල් නිවාස ක්‍රමයකට යන්න ඕනෑ. නමුත් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, සුදුසු මහල් නිවාස ක්‍රමයකට යන්න ඕනෑ. වේලුපිල්ලේ වත්තේ මේ කෝට්ටේ ආසනයට අදාළ තත්ත්වයක්. රාජගිරියේ වේලුපිල්ලේ වත්ත. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, වේලුපිල්ලේ වත්තේ තිබෙන තත්ත්වය තමයි පවරා ගත්තා යැයි කියමින් - ඇත්තටම වේලුපිල්ලේ වත්තේ පෞද්ගලික ඔප්පු තිබෙන්නේ. ඒ වේලුපිල්ලේ වත්තේ පෞද්ගලික ඔප්පුවලට සාධාරණයක් කරන්නේ නැතිව, ඒ අයව බ්ලූමැන්ඩල්වල තිබෙන නිවාස සංකීර්ණයකට යවන්න හදනවා. කිසිසේත්ම සම්බන්ධතාවයක් නැහැ. තමන්ගේ කුළියක් මලියක් කර ගෙන බුලත් විටක් විකුණාගෙන කාපු මිනිස්සුන්ට අද යන එන මං නැති කරලා තිබෙනවා.

විශේෂයෙන්ම සජිත් ප්‍රේමදාස මහත්තයාගේ පැත්තෙන් මේ නිවාසවලට යම්කිසි මැදිහත් වීමක් වෙනවා. නමුත් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, එක නරක මැදිහත්වීමක් තිබෙනවා. ඒකට හේතුව තමයි. දැන් සමහර අය, නගරයේ අවුරුදු තිස් හතලිස් ගණන් තිස්සේ ඔප්පු තිරප්පු නැති අය ජීවත් වෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ අයට

**0105**

සමහර වෙලාවට ඔවුන්ගේ පදිංචිය දිහා බලලා, ඔවුන්ගේ තත්ත්වය බලලා, නගර සභාවෙන් ඔවුන්ට කුටුම්බ පතක් දෙනවා. එහෙම නැත්නම් පැවරීමේ පත්‍රයක් දෙනවා. එහෙම දෙනවා. හැබැයි, දැන් තිබෙන රේඛීය අමාත්‍යාංශය පැත්තෙන්, දැන් එනවා බදු ඔප්පු ක්‍රමයක්. බදු ඔප්පු ක්‍රමයක් ඇවිල්ලා - ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඉතාමත්ම නින්දිත විධියට බදු ඔප්පුවේ වගන්තියක් දානවා. රේඛීය අමාත්‍යාංශය කියන ඕනෑම වෙලාවක ඒකෙන් යන්න එකගයි කියලා. එතකොට අර පැත්තේ තත්ත්වය පාවිච්චි කරලා දැන් වැල්ලවත්තේ මිනිස්සුන්ට දීගෙන යනවා ඒක. වැල්ලවත්තේ එක්තරා ලේන් එකක මිනිස්සුන්ට මේ බදු ඔප්පුව දෙනවා. මේක මම කොළඹ දිස්ත්‍රික්ක කමිටුවේ ඇද්දා. කොළඹ දිස්ත්‍රික්ක කමිටුවට ඇවිල්ලා ඒ නිලධාරිනියක් කිව්වා, ඒ ගැන එයාට අවබෝධයක් නැහැයි කියලා. නමුත් අපට අවබෝධයක් තිබෙනවා. මේ දෙන්නේ බදු ඔප්පු. ඇත්ත ඔප්පුව නැහැ. අර මිනිස්සුන්ට කියනවා, තමන්ගේ ළමයාව පාසලට දා ගන්න ඕනෑ නම්, මේ බදු ඔප්පුවටවත් අත්සන් කරන්නය කියලා. එතකොට ඒ බදු ඔප්පුවට අත්සන් කළාට පස්සේ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි වෙන්නේ, ඒකේ යට වගන්තියෙක් තිබෙනවා. කියන ඕනෑම වෙලාවක එයා යන්න බැඳිලා ඉන්නවාය කියලා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ වාගේ නරක තත්ත්වයක් ඇති වෙලා තිබෙන්නේ.

ඊට පස්සේ ගරු සභාපතිතුමනි, නාරාහේන්පිට බේකරි වත්ත. බේකරිවත්තේ වෙලා තිබෙන ගැටළුව තමයි, නාගරික සංවර්ධන අධිකාරියෙන් පසුගිය ආණ්ඩුවෙන් ගෙවල් කඩලා ඉවත් කළා. ඉවත් කළාට පස්සේ දැන් තමයි එළි වෙලා තිබෙන්නේ, ඒ භූමිය නාගරික සංවර්ධන අධිකාරියට අයිති භූමියක් නොවෙයි. ඒක රේල්වේ ඩිපාර්ට්මන්ට් එකට අයිති භූමියක් කියලා. එතකොට ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, දැන් යන්න ඕනෑ පවුල් ටික ගිහිල්ලා. තව පවුල් 13 ක් රැඳිලා ඉන්නවා. ඒ 13 ට දැන් නඩු දාලා තිබෙනවා. දැන් නඩුවට අපි කියලා තිබෙනවා, ඒගොල්ලන්ට අයිති භූමියක් නොවෙයි කියලා. ඒ වාගේම බ්ලූමැන්ඩල්වල තෙල් නලය උඩ ඉන්න මිනිස්සුන්ට. ඇත්ත තමයි. තෙල් නලයක් උඩ ජීවත් වෙන්න බැහැ. නමුත් අවුරුදු 30 ක් 35 ක් ජීවත් වෙනවා තෙල් නලය උඩ. ප්‍රශ්නය තිබෙන්නේ ඒක නොවෙයි.

**0106**

තෙල් නලය උඩ ජීවත් වුණු මිනිස්සුන්ට මේ රටේ නායකයෝ ඇවිල්ලා කිව්වා. හරි ඕගොල්ලන්ට අපි ගෙයක් දෙන්නම්. මේ මිනිස්සු ඉල්ලනවා, අන්න අර තට්ටු නිවාසය. අඩුම තරමින් අපට ඒක දෙන්න, යන්නම් කියලා. හැබැයි, ඊයේ ඇවිල්ලා තිබෙනවා, notice එක. වහාම ක්‍රියාත්මක වන පරිදි ඒ භූමිවලින් ඉවත් වෙන්න. තෙල් නලය පිළිසකර කිරීමට තිබේ කියලා. නමුත් කොළඹ දිස්ත්‍රික් සංවර්ධන කමිටුවට මේ යෝජනාව ආවාට පස්සේ ගරු සුසිල් ප්‍රේමජන්ත ඇමතිතුමා පැහැදිලි නියෝගයක් දීලා තිබෙනවා, ඒ තෙල් නලය උඩ ඉන්න මිනිස්සුන්ව ඉවත් කරන්න බැහැයි කියලා. ඒගොල්ලන්ට මහල් නිවාසයකින් නිවාසයක් දෙන තුරු යවන්න එපාය කියලා. හැබැයි, එහෙම තිබෙද්දී අවස්ථා ගණනාවකදීම මේ වර්තමාන ආණ්ඩුවෙන් ඉවත් කරන්න ආවා. ඒ තෙල් නලය උඩ හිටපු මිනිස්සුන්ව. තෙල් නලය උඩ ජීවත් වෙන්න බැහැ නේ? අපි දන්නවා නේ? තෙල් නලය උඩ ඉන්න බැරි වුණාට ඒ මිනිස්සුන්ගේ සියලු ජීවිත ගැට ගැහිලා තිබෙන්නේ ඒ ප්‍රදේශයත් එක්ක. එතකොට අඩුම තරමින් ඒ බ්ලූ මැන්ඩල්වලින්වත් නිවාසයක් ලබා දිය යුතුයි කියන යෝජනාව මේ අවස්ථාවේ කියනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මෙන්න මේ තත්ත්වය තමයි විශේෂයෙන් අවධානය යොමු කරන්න තිබෙන්නේ. මේ යෝජනාව සම්බන්ධයෙන් අදහස් දක්වපු ගරු මන්ත්‍රීතුමන්ලාට ඉතාමත්ම ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම මම ඉතාමත්ම කනගාටු වෙනවා. මේ යෝජනාව තව ටිකක් පෝෂණය කරන්න තිබුණා. ප්‍රසන්න සංජීව ගරු මන්ත්‍රීතුමන්ලාට හොඳ අදහස් තිබෙනවා. මෙතැන ඉන්න සුමිත් විජයමුණි ද සොයිසා ගරු මන්ත්‍රීතුමා වෙන භූත අදහසක් අර කිව්වේ. මොනවාද මේ කියන්නේ? තුණ්ඩු කෑලි කථා. එතකොට මේ ආණ්ඩු පක්ෂයට ඕනෑ තරම් ප්‍රශ්න තිබෙනවා. නමුත් ඔවුන් කෙසේ හෝ මේකෙන් ප්‍රතිබන්ධනය වෙලා තිබෙනවා. ඔවුන්ට කථා කර ගන්න හැකියාවක් නැහැ. කෙසේ වෙතත් මේ තත්ත්වය අපි විශ්වාස කරනවා, පළාත් සභාව හරහා රේඛීය අමාත්‍යාංශයේ අවධානය යොමු කිරීමට මේ පළාත් සභාව පියවර ගනියි කියලා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

සුනිල් වටගල ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා දෙක සඳහාම සභාවේ එකඟතාවය මේ අවස්ථාවේ විමසනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

# රීති අංක 30 යටතේ ඉදිරිපත් කරන ලද ප්‍රශ්න
# QUESTIONS PRESENTED UNDER RULE NO : 30

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

සභාව කල් තබන අවස්ථාවේ ඇසිය යුතු ප්‍රශ්න ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ ප්‍රශ්න දෙක අපේ සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමා සහ ලක්ෂ්මන් නිපුණආරච්චි ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කර තිබෙන්නේ. එම ප්‍රශ්න දෙකම මම න්‍යාය පත්‍රයට ඇතුළත් කරන්න කටයුතු කරනවා. ගරු ප්‍රධාන ඇමතිතුමා නැති නිසා.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම රීති අංක 30 යටතේ මේ සභාවට ඉදිරිපත් කරලා තිබෙන්නේ. රීති අංක 30 යටතේ තිබෙන්නේ, හදිසි වැදගත්කමකින් යුක්ත යෝජනාවක් සභාව කල් තබන අවස්ථාවේදීම මේ සභාවේ ප්‍රශ්න කරන්න පුළුවන්.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මේ අවස්ථාවේදී ගරු ප්‍රධාන ඇමතිතුමා නොමැති නිසා.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

එතකොට ප්‍රධාන අමාත්‍යතුමා නැත්නම් මේ ප්‍රශ්නය සම්බන්ධව අපේ ගාමිණී තිලකසිරි ඇමතිතුමාත් මේක දන්නවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමා ඉදිරිපත් කරන්න.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ඒ නිසා අර සාමූහික වගකීමක් තිබෙන නිසා, මම ප්‍රශ්නය ඉදිරිපත් කළාට පස්සේ අඩුම ගණනේ මේ සම්බන්ධව එතුමා දන්න ටික හරි ඉදිරිපත් කරන්නය කියලා මම ඉල්ලා සිටිනවා. මම ප්‍රශ්නය ඉදිරිපත් කරන්නම්.

(අ) හෝමාගම, හොරගල ඉද්දගල මීටි බැවුම සහිත කඳු ප්‍රදේශයේ මහා පරිමාණ ගල් කොරියක් නිසා ජනතාවට හානිකර තත්ත්වයක් ගැන ඔබතුමා දන්නේද?

(ආ) භූගත ජලය සිදී යාම, අවට නිවාස ඉරිතලා යාම ඇතුළු පරිසර හානි පිළිබඳව මෙම ගල්කොරියට විරුද්ධව මහජන උද්ඝෝෂණ පැන නැගී ඇති බව දන්නේද?

(ඇ) පළාත් පරිසර, නීතිය හා සාමය යන විෂයයන් භාර අමාත්‍යවරයා ලෙස මහජනතාව මුහුණ දෙන මෙම ගැටළු පිළිබඳව ඔබතුමා ගන්නා ක්‍රියා මාර්ග කවරේද?

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

මේ ගල් කොරියක් නේ කඩාගෙන වැටුණේ?

**ගරු ගාමිණී තිලකසිරි - අමාත්‍යතුමා**
Hon. Gamini Thilakasiri - Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඇත්ත වශයෙන්ම ගල් කොරියක් තමයි මගේ ඔලුවට කඩා ගෙන වැටුණේ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු ප්‍රශ්නයේ සත්‍යතාවයක් තිබෙන බව මම දන්නවා. නමුත් ඒකට මම පිළිතුරු දෙන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. සති දෙකකින් මහ ඇමතිතුමා පිළිතුරු දෙනවාය කියන එක මම මේ අවස්ථාවේදී ප්‍රකාශ කර සිටිනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නයත් ඒ ආකාරයෙන්ම ඉදිරිපත් කරන්නය කියලා අවස්ථාව ලබා දෙනවා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ගරු ප්‍රධාන අමාත්‍යතුමා, මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු

සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බල ශක්ති, පරිසර, ජල සම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍ය ඉසුර දේවප්‍රිය මැතිතුමාගෙන් තමයි මම මේ ප්‍රශ්නය අහන්නේ.

(අ) ඉහත සඳහන් විෂයන් භාර අමාත්‍යවරයා හා ප්‍රධාන අමාත්‍යවරයා වන ඔබතුමාගේ කාර්ය මණ්ඩලයේ උපදේශකවරුන් සිටීද?

(ආ) ඔවුන් කොපමණ පිරිසක්ද? ඔවුන් කවර විෂය ක්ෂේත්‍ර හා සම්බන්ධව කටයුතු කරන්නේද?

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම කලින් ඒ විෂය ක්ෂේත්‍ර ටික කිව්වේ, ඒ විෂය ක්ෂේත්‍රවලට අදාළව උපදේශකරුවන් ඉන්නවාද කියලා දැන ගන්නයි.

(ඇ) ඔබතුමාගේ කාර්ය මණ්ඩලයේ සේවය කරන උපදේශකවරුන්ගේ නම් සභාගත කළ හැකිද?

(ඈ) ඔබතුමා ප්‍රධාන අමාත්‍යවරයා ලෙස පත්වීමෙන් පසුව නම් කළ උපදේශකවරුන් කවරෙකු හෝ පසුව ඉවත් කළේද? ඉවත්ව ගියේද? ඔවුන් නම් කළ හැකිද?

(ඉ) ඔබතුමා මහ ඇමතිවරයා ලෙස තේරී පත්වීමෙන් පසුව නම් කළ උපදේශකවරුන්ගෙන් කවරෙකුට හෝ විදේශ විනිමය, මූල්‍ය හෝ වෙනත් සම්පත් අවභාවිත කිරීම පිළිබඳ කිසියම් චෝදනාවක් එල්ල වූයේද? එසේ නම් ඔවුන්ගේ නම් සභාගත කළ හැකිද? නොහැකි නම් ඒ මන්ද?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු ඇමතිතුමා, උත්තර දෙනවාද?

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, සති දෙකක කාලයක් කල් ඉල්ලනවා.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon . O. W. Prasanna Sanjeeva

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, 36(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. මේ පළාත් සභාවෙන් නිකුත් කරලා තිබෙන දින පොතේ. මේකේ මහ ඇමතිතුමාගේ, ඇමතිතුමන්ලාගේ, අපේ ඉන්න නායකයින්ගේ පින්තූර දාලා තිබෙනවා. අපි අහන්න කැමැතියි, මේ පක්ෂ විපක්ෂ ගරු මන්ත්‍රීවරුන්ගේත් ෆොටෝ එක මේකට දාන්න බැරිද කියලා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

පුළුවන්. ලබන අවුරුද්දේ තව පිටු 10 ක් විතර යනවා.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon . O. W. Prasanna Sanjeeva

අපිත් පොඩ්ඩක් ආසයි. මේකත් හැම තැනටම යනවා. ප්‍රධාන නිලධාරීන්ගේ ඒවා ඇතුළත් කරන්න -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමා යෝජනාවක් විධියට ඉදිරිපත් කරන්න.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

දින පොතක්. ඇල්බම් එකක් නොවෙයි.

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon . O. W. Prasanna Sanjeeva

මේ ඇල්බම් එකක් තමයි දාලා තිබෙන්නේ. අපි අහන්නේ ඒක තමයි. එහෙම නම් ඒවාත් අයින් කරන්න ඕනෑ.

# කල් තැබීමේ යෝජනාව
# ADJOURNMENT

**ගරු ගාමිණී තිලකසිරි** - අමාත්‍යතුමා
Hon. Gamini Thilakasiri - Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, *"දැන් මෙම සභාව කල් තැබිය යුතු යැයි"* යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

***ඊට අනුකූලව පළාත් සභාව අ.භා. 12.01 ට, 2017 මාර්තු මස 07 වන දින පූ.භා. 9.30 වන තෙක් කල් ගියේය.***
*Sitting, accordingly adjourned at 12.01 p.m till 9.30 a.m. on 07.03.2017*